84 වන කාණ්ඩය
2 වන කලාපය

සිකුරාදා
1969 මාර්තු 21

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

### නිල වාර්තාව

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 185]

ලංකා විදුලි බල මණ්ඩල පනත් කෙටුම්පත [තී. 243] :
දෙවන වර කියවා "ඒ" ස්ථාවර කාරක සභාවට පවරන ලදී

ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත [තී. 297] :
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී

පළාත් පාලන අතුරු ව්‍යවස්ථා [තී. 301]

පරිපූරක මුදල් [තී. 303]

කල් තැබීමේ යෝජනාව [තී. 367]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 84
இல. 2

வெள்ளிக்கிழமை
21 மாச் 1969

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

வினுக்களுக்கு வாய்மூல விடைகள் [ப. 185]

இலங்கை மின்சார சபை மசோதா [ப. 243] :
இரண்டாம் மதிப்பு இடம்பெற்று நிலையற்குழு " ஏ " க்குச் சாட்டப்பட்டது

ஆயுள்வேத (திருத்த) மசோதா [ப. 297] :
இரண்டாம் மூன்றும் மதிப்புக்கள் இடம்பெற்று நிறைவேற்றப்பட்டது

உள்ளூராட்சித் துணை விதிகள் [ப. 301]

குறைநிரப்புத் தொகை [ப. 303]

ஒத்திவைப்புப் பிரேரணை [ப. 367]

---

**Volume 84**
**No. 2**

**Friday**
**21st March 1969**

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

**ORAL ANSWERS TO QUESTIONS [Col. 185]**

**CEYLON ELECTRICITY BOARD BILL [Col. 243] :**
**Read a Second time, and allocated to Standing Committee " A "**

**AYURVEDA (AMENDMENT) BILL [Col. 297] :**
**Read a Second, and the Third time and passed**

**LOCAL GOVERNMENT BY-LAWS [Col. 301]**

**SUPPLEMENTARY SUPPLY [Col. 303]**

**ADJOURNMENT MOTION [Col. 367]**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය
## பிரதிநிதிகள் சபை
## House of Representatives

### 1969 මාර්තු 21 වන සිකුරාදා
வெள்ளிக்கிழமை, 21 மாச் 1969
*Friday, 21st March 1969*

---

අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස්විය. කථානායකතුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.

*சபை பி. ப. 2 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேளி கொறயா] தலைமை தாங்கிஞர்கள்.*

*The House met at 2* P.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### පදවියේ 10 වන යායේ ආර්. එම්. අප්පුහාමි මහතාට හා තවත් කිහිප දෙනකුට විරුඬව ඇති නඩු

*பதவிய 10 ஆம் பிரிவைச் சேர்ந்த திரு. ஆர். எம் அப்புஹாமி முதலானேருக்கெதிரான வழக்குகள்*

### CASES AGAINST MR. R. M. APPUHAMY AND OTHERS OF TRACT 10, PADAVIYA

9. මෛත්‍රීපාල සේනානායක මයා. (මැදවච්චිය)

*(திரு. மைத்திரிபால சேனுநாயக்க—மதவாச்சி)*

(Mr. Maithripala Senanayeke—Medawachchiya)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පදවියේ 10 වැනි යායේ අක්කර 157 කට ප්‍රමාණවත් ලෙස ජලය නොලැබීම පිළිබඳව එම යායේ ආර්. එම්. අප්පුහාමි මහතා හා 100 ක් පමණ අනෙක් ගොවි මහතුන්ද විසින්—(i) ගරු අග්‍රාමාත්‍යවරයා (ඔහු වෙත යැවුණු පෙත්සම ගැන සඳහන් කරමින් 68. 1. 19 වැනි දින අංක අ/ඉ.මා පී. වි/69 දරණ ලැබුණු බව දන්වන ලිපිය බලන්න), (ii) ගරු ආහාර හා කෘෂිකර්ම ඇමති (68. 1. 24 වැනි දින අංක ජීසී/12781 දරණ ලැබුණු බව දන්වන ලිපිය බලන්න), (iii) පදවියේ දිස්ත්‍රික්ක ඉඩම් නිලධාරි (68.3.24 දින දරන ඔහුගේ ලිපිය බලන්න), යන අයට කරුණු ඉදිරිපත් කළ බව එතුමා දන්නවාද? (ආ) 1968 මැයි මාසයේදී ගොවීන්ට තළ මට්ටම පහත් කරන්නට සිදුවන තෙක්ම එතුමාගේ නිලධාරීන් කිසිදු පියවරක් නොගත් බව එතුමා දන්නවාද? (ඉ) ඔවුන් මෙසේ ක්‍රියා නො කෙළේ නම් අක්කර 157 ක පමණ වගා කළ වී 1968 යල කන්නයේදී පාළුවීමට ඉඩ තිබුණු බව එතුමා දන්නවාද? (ඊ) තළ පහත් කිරීම ගැන මෙම ගොවීන්ට විරුද්ධව දූන් නඩු පවරා තිබෙන බව එතුමා දන්නවාද? (උ) වැරද්ද හරිගැස්සීමට එතුමාගේ නිලධාරීන් අපොහොසත් වූ හෙයින් ආර්. එම්. අප්පුහාමි මහතා හා අනෙක් පස් දෙනෙකුට විරුද්ධව පවරා තිබෙන නඩු ඉල්ලා අස් කර ගන්නා ලෙස එතුමා දූන් නියෝග කරනවාද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினு: (அ) பதவிய 10 ஆம் பிரிவைச் சேர்ந்த ஆர். எம். அப்புகாமியும், சுமார் 100 இதர விவசாயிகளும் (i) கௌரவ பிரதமர் (தமக்கனுப்பப்பட்ட மனுவைக் குறிப்பிட்டு அவர் அனுப்பிய 19.1.68 தேதியிட்ட அ/இ. மா.பி.வி. 69 இலக்கம் பெற்றமை. அறிவிப்பைப் பார்க்கவும்); (ii) கௌரவ விவசாய, உணவு அமைச்சர் (24.1.68 தேதியிட்ட GC/12781 இலக்கம் பெற்றமை. அறிவிப்பைப் பார்க்கவும்); (iii) ஆ. கா. உ. பதவிய (24.3.68 தேதியிட்ட கடிதத்தைப் பார்க்கவும்) ஆகியோருக்கு, 10 ஆம் பிரிவிலுள்ள 157 ஏக்கர் நிலத்திற்கு நீர் போதாதமைபற்றி முறைப்பாடு செய்திருக்கிறூர்களென்பதை அவர் அறிவாரா? (ஆ) 1968, மே மாதத்தில் விவசாயிகள் தாமாகவே குழாய்களின் மட்டத்தை குறைத்துக்கொள்ள வேண்டிய நிர்ப்பந்தமேற்பட்டவரைக்கும் அவரது உத்தியோகத்தர்கள் எவரும் எவ்வித நடவடிக்கையுமெடுக்கவில்லையென்பதை அவர் அறிவாரா? (இ) அவர்கள் இந்த நடவடிக்கையெடுக்காதிருந்தால் 157 ஏக்கர் நிலத்தில் செய்யப்பட்ட நெற்பயிர்கள் 1968 சிறுபோகத்தில் அழிந்திருக்குமென்பதை அவர் அறிவாரா? (ஈ) குழாய்களை இறக்கியதற்காக இப்பொழுது இவர்கள் மீது வழக்குத் தொடரப்படுகிறதென்பதை அவர்*



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මෛත්‍රීපාල සේනානායක මයා.]

அறிவாரா? (உ) இக்குறையைத் தீர்க்க உங்களது உத்தியோகத்தர்களே தவறியதால் ஆர். எம். அப்புகாமிக்கும் மற்றும் 7 பேருக்குமெதிராகத் தொடரப்பட்ட வழக்கை விலக்கும்படி அவர் இப்பொழுது உத்தரவிடுவாரா?

asked the Minister of Land, Irrigation and Power : (*a*) Is he aware that R. M. Appuhamy of Tract 10, Padaviya and nearly 100 other cultivators have been making representations to (i) The Hon. Prime Minister (*vide* his acknowledgment No. අ/ඉ. මා. පි. ඩි/69 of 19.1.68 referring to the petition to him). (ii) The Hon. Minister of Agriculture and Food (*vide* his acknowledgment No. GC/12781 of 24.1.68). (iii) The D.L.O., Padaviya (*vide* his letter of 24.3.68) regarding the inadequacy of water to 157 acres of land in Tract 10 ? (*b*) Is he aware that no action was taken by any of his officers till the cultivators were forced to lower the level of the pipes on their own in May, 1968 ? (*c*) Is he aware that but for this action of theirs, the paddy cultivated in an extent of 157 acres would have died in Yala 1968 ? (*d*) Is he aware that these cultivators are now being prosecuted for lowering the pipes ? (*e*) In view of the failure of his own officers to remedy the defect will he now order the withdrawal of the cases instituted against R. M. Appuhamy and seven others ?

**ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති—ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති වෙනුවට)**

(*கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாசார அமைச்சர்—காணி, நீர்ப்பாசன மின்விசை அமைச்சர் சார்பாக*)

(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs—on behalf of the Minister of Land, Irrigation and Power)

(අ) ඔව්. (ආ) නැත. සාධාරණ අන්දමට වතුර බෙදාදීමට සෑම උත්සාහයක්ම ගෙන තිබේ. ජානපදිකයින් විසින් පයිප්ප පහත් කර නැත. පාලිත නල විවරය ජානපදිකයින් විසින් හිතුවක්කාර අන්දමට කඩා දමා ඇත. (ඉ) නැත. (ඊ) ඔව්. පාලිත නල විවරය කඩා දැමීමට විරුද්ධව නඩු පවරා ඇත. (උ) නැත. පාලිත නල විවරය කඩා දැමීම කඩාකප්පල්කාරීන් ගේ හිතුවක්කාර ක්‍රියාවක් හෙයින් ඊට සමාව නොදිය යුතුයි.

**මෛත්‍රීපාල සේනානායක මයා.**

(*திரு. மைத்திரிபால சேனநாயக்க*)

(Mr. Maithripala Senanayeke)

ඒ නඩුව අස් කර ගැනීමට ඇමතිතුමා කැමති නැද්ද?

**ගරු ඊරියගොල්ල**

(*கௌரவ ஈரியகொல்ல*)

(The Hon. Iriyagolle)

නැතැයි කියනවා.

**මෛත්‍රීපාල සේනානායක මයා.**

(*திரு. மைத்திரிபால சேனநாயக்க*)

(Mr. Maithripala Senanayeke)

දැන් ඇමතිතුමා ඉන්න නිසා එතුමා පිළිතුරු දෙයි. තමුන්නාන්සේ කොයි වේලේත් කියන්නේ, නෑ කියලයි.

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**

(*கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்*)

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

The answer is " No."

The damage to the controlled pipe outlet was a deliberate act of vandalism which should not be condoned.

## පොල්ගොල්ල කාන්තා ගුරු අභ්‍යාස විද්‍යාලය වැසීම

பொல்கொல்லை மகளிர் பயிற்சிக்கல்லூரியை மூடல்

## CLOSURE OF POLGOLLA WOMEN'S TRAINING COLLEGE

10. **බර්නාඩ් සොයිසා මයා.** (දකුණු කොළඹ)

(*திரு. பேர்னட் சொய்ஸா—கொழும்புத் தெற்கு*)

(Mr. Bernard Soysa—Colombo South)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) 1969 ජනවාරි මස හදිසියේ පොල්ගොල්ල කාන්තා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගුරු අභ්‍යාස විද්‍යාලය වසා දැමීම නිසා, 1969 ගුරු විද්‍යාලවලට ඇතුළත් කර ගැනීම සඳහා ප්‍රවේශ පරීක්ෂණයෙන් හා සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වී සිටින සියලුම ගුරු මෙනෙවියන් ඉඩ මදකම නිසා ඇතුළත් කර නොගත් බවත්; (ii) එකම ලිඛිත පරීක්ෂණයකින් හා සම්මුඛ පරීක්ෂණයකින් සමත්වූ පිරිසකින් කොටසක් පළමුව ඇතුළත් කර ගන්නා ලද අතර තවත් කොටසක් ඇතුළත් කර ගැනීම සඳහා දින නියමයක් නොමැතිව කල් දැමීම බලවත් අසාධාරණයක් බවත්; (iii) සුදුසුකම් ලබා සිටින පිරිසක් ගුරු විද්‍යාලයට ඇතුළත්කර ගැනීම ප්‍රමාදවන නිසා ඔවුන්ට හිමි අයිතිවාසිකම් වන ගුරු සහතිකයේ ජ්‍යෙෂ්ඨත්වය, වැටුප් වර්ධකය අවුරුද්දකින් අඩුවීම හා උසස්වීම් ප්‍රමාදවීම් යනාදියට හේතුවන බවත්; එතුමා දන්නවාද? (ආ) සම සුදුසුකම් ලබා සිටින කොටසකට පමණක් සිදුවී ඇති මෙම අසාධාරණය මග හැරවීමට එතුමා කුමන පියවරක් ගන්නවාද? (ඉ) 1967 සහ 1968 යන එක් එක් වර්ෂයට වෙන් වෙන් වශයෙන් ගුරු අභ්‍යාස විද්‍යාලයට ගුරු මෙනෙවියන් කී දෙනෙක් බඳවා ගනු ලැබුවෝද? (ඊ) 1969 වර්ෂයට දැනට ඇතුළත් කර ගන්නා ලද ගුරු මෙනෙවියෝ කී දෙනෙක් වෙත්ද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) பொல்கொல்லை மகளிர் பயிற்சிக் கல்லூரி 1969, ஜனவரி மாதத்தில் திடீரென மூடப்பட்டதால், இடவசதியில்லாமல், 1969 இல் பயிற்சிக் கல்லூரிகளுக்கான பிரவேசப் பரீட்சையிலும், நேர்முகப் பரீட்சையிலும் சித்தியடைந்த ஆசிரியைகள் அனைவரும் அனுமதிக்கப்படவில்லையென்பதையும்; (ii) ஒரே எழுத்துப் பரீட்சையிலும், நேர்முகப் பரீட்சையிலும் சித்தியடைந்தவர்களுள் ஒரு சாராரை முதலில் அனுமதித்துவிட்டு, மற்றொரு சாராரை அனுமதிப்பதை காலவரையறையின்றிப் பின்போடுதல் பெரும் அநீதியென்பதையும்; (iii) தகைமை பெற்றவர்களை பயிற்சிக் கல்லூரிக்கு அனுமதித்தலைத் தாமதஞ் செய்தல், அவர்களின் (i) ஆசிரியர் தாரதரச் சிரேட்டத்தன்மை (ii) ஒரு வருஷச் சம்பள உயர்வு (iii) பதவியுயர்வு வாய்ப்புக்கள் ஆகியன சம்பந்தமான உரிமைகளை அவர்களுக்கு மறுக்குமென்பதையும் அவர் அறிவாரா? (ஆ) ஒரே தகைமை பெற்றுள்ள ஒரு சாராருக்கு இழைக்கப்பட்டுள்ள இந்த அநீதியை அகற்ற அவர் என்ன நடவடிக்கை எடுப்பார்? (இ) 1967 இலும், 1968 இலும் ஒவ்வொரு வருடமும் இப்பயிற்சிக் கல்லூரிக்கு எத்தனை பெண் பயிற்சியாளர்கள் அனுமதிக்கப்பட்டார்கள்? (ஈ) 1969 ஆம் ஆண்டில் இதுவரையில் எத்தனை பெண் பயிற்சியாளர்கள் அனுமதிக்கப்பட்டுள்ளார்கள்?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that (i) all the female teachers who had been successful at the Entrance examination and the interview for admission to Training Colleges in 1969 have not been admitted for want of accommodation due to the fact that the Polgolla Women's Training College was closed down suddenly in January, 1969; (ii) it is a grave injustice to have first admitted a section of those who had passed the same written examination and interview and to have postponed indefinitely the admission of another section; (iii) the delay in being admitted to the Training College will deprive those qualified, of their rights in respect of seniority of the teachers' certificate, loss of an year's salary increment and promotion prospects? (*b*) What action will he take to remove this injustice caused to a section of people who have obtained the same qualification? (*c*) How many women trainees were admitted to the Training College in each of the years 1967 and 1968? (*d*) How many women trainees have been admitted so far for the year 1969?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
**(The Hon. Iriyagolle)**

(අ) (i) නැත. ගුරු විද්‍යාල ප්‍රවේශ විභාගය තරඟ විභාගයක් වන අතර, තෝරා ගැනීම් කරනු ලබන්නේ සම්පූර්ණයෙන්ම කුසලතා අනු පිළිවෙලටය. සමර්ථ වීමේ හෝ අසමර්ථ වීමේ ප්‍රශ්නය පැන නොනගී. (ii) නැත. ඇතුළත් කර ගැනීම් කරන ලද්දේ සම්පූර්ණයෙන් කුසලතා අනු පිළිවෙල අනුව බැවින් අසාධාරණයක් සිදු වී නැත. මෙම විභාගයේ දී සමර්ථ වීමේ හෝ අසමර්ථ වීමේ ප්‍රශ්නය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

[ගරු ඊරියගොල්ල]
පැන නොනඟී. (iii) ඇතුළත් කර ගැනීම් කරන ලද්දේ සම්පූර්ණයෙන් කුසලතා අනු පිළිවෙල අනුව බැවින් කිසිවකුගේ අයිතිවාසිකම් අහිමි වී නැත. (ආ) ඉහත (අ) (ii) හා (iii) අනුව පැන නොනඟී. (ඉ) 1967—970, 1968—1045. (ඊ) 1969—741 මෙතෙක්.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
මෙය තරඟකාරී විභාගයක් හැටියට පැවැත්වූයේ කවදා සිටද ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
දින වකවානු දැන් ළඟ නැහැ. කල් දුන්නොත් උත්තර දෙන්නම්.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
මෙය මීට පෙර තරඟකාරී විභාගයක් හැටියට පැවැත්වුණේ නැහැ. සමත් වූ අය තෝරා ගත්තා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ගුරු ප්‍රවේශය ?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
ඔව්. තරඟකාරී විභාගයක් හැටියට නොවෙයි කලින් පැවතුනේ. යම් සීමාවකින් එහා ලකුණු ලබා ගත් අය තෝරා ගත්තා. එය තරඟකාරී පිළිවෙළට පවත්වන්නේ කවදා සිටද ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ගුරු විද්‍යාල පැවති දා සිට මේ වන තුරු තරඟකාරී පිළිවෙළටයි පැවැත්තුවේ.

වාචික පිළිතුරු

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
නැහැ. ඒක අසත්‍යයක්.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
මට වඩා තමුන්නාන්සේ දන්නවා නම් ඒකට කරන්නට දෙයක් නැහැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
සත්‍ය දන්නා නිසායි කියන්නේ.

**ටී. බී. එම්. හේරත් මයා. (වලපනේ)**
*(திரு. ரி. பி. எம். ஹேரத்—வலப்பனே)*
(Mr. T. B. M. Herath—Walapane)
කණිෂ්ඨ විශ්ව විද්‍යාලය ආරම්භ කළාට පසුත් පොල්ගොල්ල ගුරු විද්‍යාලයේ ගොඩනැගිලිවල ඉඩ තිබෙන නිසා වැඩිපුර තිබෙන එම ඉඩකඩ පාවිච්චි කර නැවත වරක් ගුරු අභ්‍යාස විද්‍යාලය පැවැත්වීමට කටයුතු කරනවාද ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
දැනට එම ගොඩනැගිලි කණිෂ්ඨ විශ්ව විද්‍යාලයට අරගෙනයි තිබෙන්නේ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
ඕනෑ තරම් ඉඩ තිබෙනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ගුරු විද්‍යාලවලට ඇතුළත් කර ගන්නා සංඛ්‍යාව අඩු කරන්නේ නැහැ. දැනටමත් එම කටයුතු සූදානම් කරලයි තිබෙන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

එතන වැඩිපුර ඉඩකඩ තිබෙන නිසා කරුණාකර නැවත වරක් එහි ගුරු අභ්‍යාස විද්‍යාලය පටන් ගන්නට කල්පනා කරන වාද ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

දෙගොල්ලක් එකට දමන්නට බැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

දෙගොල්ලම ගැහැණු ළමයි.

## අවිස්සාවේල්ලේ එන්. ජේ. ද සිල්වා මහතාගේ රක්ෂණ ඔප්පුව

அவிசாவளை திரு. எ ன். ஜே. த சில்வாவினுடைய இலங்கை காப்புறுதிக் கூட்டுத்தாபன காப்புறுதி

INSURANCE POLICY OF MR. N. J. DE SILVA, AVISSAWELLA

11. **ඩී. පී. ආර්. වීරසේකර මයා.** (දෙහිඕවිට)
*(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—தெகியோவிற்ற)*
(Mr. D. P. R. Weerasekera—Dehiowita)

වාණිජ හා වෙළඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) (i) අවිස්සාවේල්ල ඩිපෝවේ සේවයෙහි නියුතු එන්. ජේ. ද සිල්වා යන අය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් 55637 යන අංකයෙන් රක්ෂණ ඔප්පුවක් ලබා ඇති බවත් ; (ii) 1963 මාර්තු, 1963 අගෝස්තු සිට 1965 මාර්තු දක්වා, 1965 ජූලි සහ 1965 දෙසැම්බර් යන මාස වාරික යන් සඳහා රු. 542.80 ක් සහ පොලිය වශයෙන් රු. 102.00 ක් ගෙවිය යුතු බව ඔහුට දන්වා ඇති බවත් ; එතුමා දන්නේද ? (ආ) මෙම අයගේ මාසික වැටුපෙන් මුදල් අඩුකර ශ්‍රී ලංකා රක්ෂණ සමාගමට වාර මුදල් ගෙවා ඇති බව පැහැදිලි වී ඇති හෙයින් මෙම මුදල එම සමාගමින් අයකර අඩපණ වී ඇති රක්ෂණ ඔප්පුව පණ ගැන්වීමට එතුමා ක්‍රියා කරන්නේද ? (ඉ) එසේ නම් කවදාද ? නොඑසේ නම්, ඒ මන්ද ?

வர்த்தக, வியாபார அமைச்சரைக் கேட்ட வினா : (அ) (i) அவிசாவளை டிப்போவில் சேவை செய்யும் திரு. என். ஜே. த சில்வா என்பவர் ஸ்ரீ லங்கா காப்புறுதிக் கூட்டுத் தாபனத்திடம் 55637 ஆம் இலக்கக் காப்புறு தியைப் பெற்றுள்ளாரென்பதையும், (ii) 1963 மார்ச்சு, 1963 ஓகத்திலிருந்து 1965 மார்ச்சு வரை, 1965 யூலை, 1965 திசெம்பர் ஆகிய தவணைகளுக்கு ரூ. 542.80 சதமும் வட்டியாக ரூ. 102 உம் செலுத்தவேண்டுமென்று அவருக்கு அறிவிக்கப்பட்டுள்ளதையும் அவர் அறிவாரா ? (ஆ) இவருடைய மாதச் சம்பளத்தில் பணத்தைக் கழித்து "பிறீ லங்கா காப்புறுதிக் கொம்பனிக்" குத் தவணைப் பணம் செலுத்தப்பட்டுள்ளதாகத் தெளிவாயிருப்பதால் இப்பணத்தை அக்கொம்பனியிடம் அறவிட்டு குற்றுயிராயுள்ள காப்புறுதிக்கு உயிரூட்ட அவர் நடவடிக்கை எடுப்பாரா ? (இ) அவ்வாறெனில் எப்போது ? இன்றேல், ஏன் ?

asked the Minister of Commerce and Trade : (*a*) Is he aware that (i) Mr. N. J. de Silva who is employed in the Avissawella Depot obtained Insurance Policy No. 55637 from the Sri Lanka Insurance Corporation ; (ii) he has been asked to pay a sum of Rs. 542.80 as premia for the months of March 1963, August 1963 to March 1965, July 1965 and December 1965 and a further sum of Rs. 102.00 as interest ? (*b*) As it has been now revealed that this money had been deducted from his monthly salary and paid to the Free Lanka Insurance Company, will he take action to obtain this money from this company and revive the lapsed policy ? (*c*) If so when ? If not why ?

**ගරු හියු ප්‍රනාන්දු (වාණිජ හා වෙළඳ ඇමති)**
*(கௌரவ ஹியூ பெர்னாண்டோ—வர்த்தக, வியாபார அமைச்சர்)*
(The Hon. Hugh Fernando—Minister of Commerce and Trade)

(අ) (i) ඔව්. (ii) ඔව්. (ආ) කරන ලද විමර්ශනවලට අනුව, ඔප්පුධාරීන්ගේ වැටුපෙන් අයකර ගන්නා ලද සමහර මුදල් ලංගමය විසින් ප්‍රමාද දෝෂයකින්, ෆ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමාගම වෙත යවා තිබෙන බව සොයා ගෙන ඇත. එබඳු ගෙවීම් 8 ක් ෆ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමාගමෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු හියු ප්‍රනාන්දු]

සංස්ථාව වෙත ආපසු ලැබී ඇත. ගෙවීම් 14 ක් තවමත් හිඟව ඇත. එයින් 8 ක් ඔප්පුධාරීන්ගේ වැටුප් පතින් අයකර ගෙන නැතිවාසේ පෙනේ. ඉතිරි ගෙවීම් 6 වැටුපෙන් අඩුකර ගෙන ඇතිවාසේ පෙනෙනත්, ලංගමය විසින් සංස්ථාවට එවා නැත. මේ කාරණය ගැන පරීක්ෂණයක් කරගෙන යනු ලැබේ. (ඉ) හිඟව ඇති සියළුම ගෙවීම් සංස්ථාව වෙත ලැබුණු පසු, ඔප්පුව නැවත වලංගු කිරීම ගැන සලකා බලනු ලැබේ.

## ආර්. එම්. අල්විස් මහතාගේ සේවක අර්ථසාධක මුදල්

திரு. ஆர். எம். அல்விஸ் என்பவருடைய ஊழியர் சேமலாப நிதி

## E. P. F. BENEFITS OF MR. R. M. ALWIS

13. ටී. බී. එම්. හේරත් මයා.
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

කම්කරු හා රැකීරක්ෂා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලබාගැනීම සඳහා, 1967.2.11 දින නැසීගිය එම අරමුදලෙහි අංක සේඅඅ/සීඑල්/සී (2) 1935 හා 115/ ඒ/43 දරණ ආර්. එම්. අල්විස් මහතාගේ භාර්යාව වන ආර්. ඒ. ඩී. සුමනාවතී පෙරේරා මහත්මිය පළමුවෙන් ඉල්ලුම් කරන ලද්දේ කවදාද? (ආ) එම මුදල මෙතෙක් ගෙවා නැති බව එතුමා දන්නවාද? (ඉ) මෙම ප්‍රමාදයට හේතු කවරේද? (ඊ) එය වහාම ලබා දීමට එතුමා ක්‍රියා කරනවාද? නොඑසේ නම්, ඒ මන්ද?

தொழில், தொழில் வசதி அமைச்சரைக் கேட்ட வினா: (அ) ஊழியர் சேமலாப நிதியைப் பெற்றுக் கொள்வதற்காக 1967.2.11 இல் இறந்து போனவரும் அந்நிதியின் සේඅඅ/සීඑල්/සී (2) 1935, 115/ඒ/43 ஆகிய இலக்கங்களைக் கொண்டவருமான திரு. ஆர். எம். அல்விஸ் என்பவருடைய மனைவியான திருமதி ஆர். ஏ. டீ. சுமனவதி பெரேரா முதலில் எப்போது விண்ணப்பித்தார்? (ஆ) இதுவரை அப்பணம் கொடுபடவில்லையென்பதை அவர் அறிவாரா? (இ) இத்தாமதத்திற்குக் காரணமென்ன? (ஈ) அதனை உடனே பெற்றுக்கொடுக்க அவர் நடவடிக்கை எடுப்பாரா? இன்றேல் ஏன்?

asked the Minister of Labour and Employment: (*a*) When did R. A. D. Sumanawathie wife of R. M. Alwis, (E.P.F. No. සේඅඅ/සීඑල්/සී (2) 1935 and 115/ඒ/43), whose death occurred on 11.2.1967, first submit her application for Employees' Provident Fund benefits? (*b*) Is he aware that these payments have not yet been made? (*c*) What are the reasons for the delay? (*d*) Will he take action to make these payments immediately? If not, why?

**එස්. ද එස්. ජයසිංහ මයා. (කම්කරු රැකීරක්ෂා හා නිවාස ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ—தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. S. de S. Jayasingha—Parliamentary Secretary to the Minister of Labour, Employment and Housing)

(අ) 1967. 5. 11 වැනි දින. (ආ) ඔව්. ගෙවීමට ශ්‍රී ලංකා මහ බැංකුවට දන්වා තිබේ. (ඉ) නම්වල තුබූ වෙනස්කම් හා නොපැහැදිලි ඇඟිලි සළකුණු වැනි නොයෙක් කරුණු ප්‍රමාදයට හේතුවී ඇත. (ඊ) ඔව්.

**ටී. බී. එම්. හේරත් මයා.**
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

අතුරු ප්‍රශ්නයක් අසන්නට තිබෙනවා. සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලබා ගැනීමට පැමිණෙන බොහෝ අයට අර්ථසාධක අරමුදල් කාර්යාලයේ සිටින සමහර නිලධාරීන්ට අල්ලස් ගෙවන්නට සිදු වී තිබෙන බව දන්නවාද?

**එස්. ද එස්. ජයසිංහ මයා.**
(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)
(Mr. S. de S. Jayasingha)

එහෙම දෙයක් දන්නේ නැහැ. එහෙත් එහෙම දෙයක් දන්නුවොත් අපි ඒ ගැන පරීක්ෂා කරන්නට නිතරම ලැස්තියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ එඬේරමුල්ලේ කර්මාන්තශාලාවට සේවකයින් බඳවාගැනීම

இலங்கை உலோகப் பொருள் கூட்டுத்தாபனம் : எந்திரமுல்லை தொழிற்சாலைக்குப் பணியாளர்

CEYLON HARDWARE CORPORATION : RECRUITMENT TO ENDERAMULLA FACTORY

16. එස්. කේ. කේ. සූරියාරච්චි මයා. (මහර)

*(திரு. எஸ். கே. கே. சூரியாரச்சி—மகற)*

(Mr. S. K. K. Suriarachchi—Mahara)

කර්මාන්ත හා ධීවර කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ එඬේරමුල්ලේ පිහිටි කර්මාන්ත ශාලාවට අළුතෙන් සේවකයින් කීදෙනෙක් බඳවා ගැනීමට බලාපොරොත්තු වන්නේද? (ආ) එසේ සේවකයන් බඳවා ගැනීමේදී අනුගමනය කිරීමට බලාපොරොත්තු වන ප්‍රතිපත්තිය කුමක්ද? (ඉ) සේවකයින් බඳවා ගැනීමේදී කර්මාන්ත ශාලාවට ආසන්න ප්‍රදේශයේ පදිංචි සුදුසුකම් ඇති, රක්ෂා විරහිත අය ගැන විශේෂයෙන් සලකන්නේද? (ඊ) නොඑසේනම් ඒ මන්ද?

*கைத்தொழில், கடற்றொழில் அமைச்சரைக் கேட்ட வினா: (அ) இலங்கை உலோகப் பொருள்வகைக் கூட்டுத்தாபனத்தின் எந்திரமுல்லை தொழிற்சாலையில் சேர்க்கப்படவிருக்கும் பணியாளர் தொகையென்ன? (ஆ) இவ்விதம் பணியாளர் சேர்க்கப்படும் பொழுது கைப்பிடிக்கப்படும் கொள்கை என்ன? (இ) பணியாளர்கள் சேர்க்கப்படும் பொழுது தொழிற்சாலைக்கண்மையில் வதியும் தகுதியுடைய வேலையற்றோருக்கு முன்னுரிமை அளிக்கப்படுமா? (ஈ) இல்லையெனில், ஏன்?*

asked the Minister of Industries and Fisheries: (*a*) How many new employees are to be recruited to the Endermulla factory of the Ceylon Hardware Corporation? (*b*) What principle will be followed when such recruitment is made? (*c*) When employees are recruited will special preference be given to unemployed persons having the necessary qualifications and resident close to the factory? (*d*) If not, why?



ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන (කර්මාන්ත හා ධීවර ඇමති)

*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன—கைத்தொழில், கடற்றொழில் அமைச்சர்)*

(The Hon. D. P. R. Gunawardena—Minister of Industries and Fisheries)

(*a*) About 350 employees will be recruited when the factory goes into full production. (*b*) Unskilled workmen will be selected from the unskilled labour now employed by the State Engineering Corporation in construction work at Enderamulla Cast Iron Foundry. The following points will be considered in selecting these personnel: (i) seniority in service at Engineering Corporation; (ii) should be permanently resident within a radius of 5 miles from the factory; (iii) should have at least an average attendance of 20 days per month during the preceding twelve months; (iv) should be under 40 years of age. In the case of skilled workmen, applications will be called through the employment exchange and by advertisement in the Government Gazette and/or newspapers. Selection will be after interview by technical staff and trade test. (*c*) Yes. (*d*) Does not arise in view of answer to (*c*) above.

සූරියාරච්චි මයා.

*(திரு. சூரியாரச்சி)*

(Mr. Suriarachchi)

දැනට රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ අනියම් වශයෙන් සේවයෙහි යෙදී සිටින කම්කරුවන්ගෙන් පුහුණු කම්කරුවන් තෝරා ගැනීම, ගරු ඇමතිතුමා අනුගමනය කරන්නට යන ප්‍රතිපත්තිය බවයි මට එතුමාගේ පිළිතුරෙන් අවබෝධ වුණේ. ඒ පිරිසට අතිරේක වශයෙන් තවත් කොටසක් පිටින් ගන්නට සිදු වුණොත්, එතුමා සඳහන් කළ පරිදි හැතැප්ම 5 දුර ප්‍රමාණය පිළිබඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනවාදැයි මා දැනගන්නට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)

අපි ඒ වැඩ පිළිවෙළ සකස් කර තිබෙන්නේ ක්‍රියාවේ යෙදීම පිණිසයි. ඒ අනුව වෙනත් කොටස් බඳවා ගැනීමේදී හැතැප්ම 5 දුර ප්‍රමාණය අනුව, ඒ අවට ගම්වලින්, නුදුරු ප්‍රදේශවලින් ඔවුන් බඳවා ගන්නවා.

## සමස්ත ලංකා බෞද්ධ ශිෂ්‍ය සම්මේලනය: අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍ර ලේඛනය

அகில இலங்கை பௌத்த மாணவர் சம்மேளனம்: கல்வி உதவிப் பணிப்பாளர் நாயகத்தின் சுற்றறிக்கை

**ALL CEYLON BUDDHIST STUDENTS' FEDERATION: CIRCULAR OF DIRECTOR-GENERAL OF EDUCATION**

2. ප්‍රින්ස් ගුණසේකර මයා. (හබරාදූව)
*(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபருதுவ)*
(Mr. Prins Gunasekera—Habaraduwa)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1968 අගෝස්තු මස 16 වැනි දින වැඩබලන අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරයා නිකුත් කළ අංක 94 දරණ චක්‍ර ලේඛනය නිසා සමස්ත ලංකා බෞද්ධ ශිෂ්‍ය සම්මේලනයට පහරක් වැදී ඇති බව එතුමා දන්නවාද? (ආ) දීප ව්‍යාප්ත සංවිධානයක් වූ සමස්ත ලංකා බෞද්ධ !ශිෂ්‍ය සමිති සම්මේලනය ලංකා බෞද්ධ ශිෂ්‍යයිනට ඇති එකම බෞද්ධාගමික සංවිධානය බවත් එතුමා දන්නවාද? (ඉ) ගර්ල් ගයිඩ්, ස්කවුට්, සැන් ජෝන් ඇම්බියුලන්ස් බ්‍රිගේඩ්, රතු කුරුස හමුදාව වැනි අන්‍ය සංවිධානයන් කෙරෙහි මේ චක්‍ර ලේඛනය බල නොපවත්වන බව එතුමා දන්නවාද? (ඊ) මෙය ගැන එතුමා පරීක්ෂා කර යම් පියවරක් ගන්නවාද?

*கல்வி கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) 1968 ஆகஸ்ட் 16 ஆந் தேதியன்று கல்வி உதவி பணிப்பாளர் நாயகத்தினால் வெளியிடப்பட்ட 94 ஆம் இலக்க சுற்றறிக்கையினால் அகில இலங்கை பௌத்த மாணவர் சம்மேளனம் மிகவும் பாதிக்கப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா? (ஆ) அகில இலங்கை பௌத்த மாணவர் சம்மேளனம் தீவு முழுவதும் பரவியுள்ளதும் பௌத்த மாணவர்களுக்கென அமையப்பெற்றதுமான ஒரே ஒரு தாபனமென்பதை அவர் அறிவாரா? (இ) இச்சுற்றறிக்கையானது, சாரணியபெண்கள், சாரணர்கள், அர். யோன் அம்புலன்ஸ் படையினர், செஞ்சிலுவை தாபனம் போன்ற மற்றைய தாபனங்களோடு சம்பந்தமற்றதென்பதை அவர் அறிவாரா? (ஈ) இவ்விடயத்தை ஆராய்ந்து பார்த்து ஏதாவது நடவடிக்கை எடுப்பாரா?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that the All Ceylon Buddhist Students' Federation is adversely affected due to circular No. 94 issued by the Acting Director-General of Education on 16th August 1968? (*b*) Is he aware that the All Ceylon Buddhist Students' Federation which is an island-wide organization is the only organization of the Buddhist Students? (*c*) Is he aware that this circular does not have any bearing on other organizations such as Girl Guides, Scouts, the St. Johns Ambulance Brigade and the Red Cross? (*d*) Will he look into this matter and take some action?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

(අ) ඔව්. මේ සම්මේලනයේ දේශපාලන පරමාර්ථ ඇති බැවිනි. (ආ) නැත. බොහෝ පාසල්වල බෞද්ධ ශිෂ්‍ය සමිති ඇත. (ඉ) ඔව්. එම සංවිධානවල දේශපාලන පරමාර්ථ නැති බැවිනි. (ඊ) පැන නොනඟී.

## ලංකා සේවිංස් බැංකුව: සේවක වැටුප්

இலங்கை சேமிப்பு வங்கி: ஊழியர் சம்பளம்

**CEYLON SAVINGS BANK: SALARIES OF STAFF**

1. බර්නාඩ් සොයිසා මයා.
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ලංකා සේවිංස් බැංකුවේ සේවකයින් අතරෙන්, එහි කළමනාකාර වරයාටත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගණකාධිකාරීවරයාටත් ලංකා බැංකුවේ එම පදවි දරන්නන්ට ගෙවන වැටුපටත් වඩා හොඳ වැටුප් ගෙවන අතර එහි ලිපිකරුවන්ට සහ සුළු සේවකයින්ට වෙනත් බැංකුවල සම සේවකයන්ට ගෙවන වැටුප්වලට වඩා බොහෝ අඩු වැටුප් ගෙවන බව එතුමා දන්නවාද? (ආ) ජාතියේ යහපතට ඉතා වැදගත් වූ විශේෂ බැංකු සේවයක් ලංකා සේවිංස් බැංකුව ඉටුකරන හෙයින්, ලංකා සේවිංස් බැංකු ආඥා පනතේ 8 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින් මෙම බැංකුවේ සේවකයින්ගේ සේවා තත්ත්වය බැංකු ව්‍යාපාරයේ දක්නට ඇති පිළිගත් සේවා තත්ත්වය අනුව හැඩ ගැස්වීමට එතුමා පියවර ගන්නවාද? (ඉ) එසේ නම් කවදාද? නො නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) இலங்கை சேமிப்பு வங்கி ஊழியர்களில் முகாமையாளருக்கும் கணக்காளருக்கும் இலங்கை வங்கியிற் காணப்படுவதிலும் பார்க்க அதிகமான சம்பளம் கொடுக்கப்பட்ட போதிலும், எழுதுவினைஞருக்கும் கீழ் ஊழியருக்கும் மற்றைய வங்கிகளிலுள்ள சமபதவியினரிலும் பார்க்கக் குறைவான சம்பளம் கொடுக்கப்படுவதை அறிவாரா? (ஆ) தேசீய நலனுக்கு முக்கியமான விசேட வங்கி கடமையை இலங்கை சேமிப்பு வங்கி ஆற்றிவருவதனால் இலங்கை சேமிப்பு வங்கிக் கட்டளைச் சட்டத்தின் 8 ஆம் பிரிவின் கீழ் கொடுக்கப்பட்டுள்ள அதிகாரத்தைப் பாவித்து வங்கி ஊழியர்களின் சேவை விதிகளை, வங்கித்தொழிற் பொது விதிகளோடு நிகராக்க நடவடிக்கை எடுப்பாரா? (இ) அப்படியாயின், எப்பொழுது? இல்லையெனில், ஏன்?

asked the Minister of Finance: (*a*) Is he aware that of all the employees in the Ceylon Savings Bank the manager and the accountant are paid even better salaries than those obtaining in the Bank of Ceylon, whereas the clerical and minor employees are paid much lower salaries than their counterparts in other banks? (*b*) Since the Ceylon Savings Bank performs a useful function of specialized banking, vital to the national interest, will he exercise the powers vested in him by Section 8 of the Ceylon Savings Bank Ordinance and take steps to bring the conditions of service of its employees in line with standard conditions obtaining in the banking industry? (c) If so, when? If not, why?

**එන්. විමලසේන මයා. (මුදල් ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

(திரு. என். விமலசேன—நிதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. N. Wimalasena—Parliamentary Secretary to the Minister of Finance)

(*a*) No. In any case the conditions of service of employees in the two institutions are different. (*b*) No. As the two institutions are not identical. (c) Does not arise in view of (*b*) above.

**බර්නාඩ් සොයිසා මයා.**

(திரு. பெர்னட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

I understood the hon. Parliamentary Secretary to say, in relation to (*a*), that the answer is, "No".

**විමලසේන මයා.**

(திரு. விமலசேன)

(Mr. Wimalasena)

That is right.

**බර්නාඩ් සොයිසා මයා.**

(திரு. பெர்னட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

That is a matter of fact; the salaries of the Manager and the Accountant of the Ceylon Savings Bank are higher than those of managers in the Bank of Ceylon and other banks. It is a matter of fact. Could the hon. Parliamentary Secretary give the comparative figures?

**විමලසේන මයා.**

(திரு. விமலசேன)

(Mr. Wimalasena)

In point of fact, the senior managers' salary scale can be compared to the salary of the Manager of the Ceylon Savings Bank; they are almost identical. With regard to the General Manager, his salary is personal to him.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்஬ா)*
(Mr. Bernard Soysa)

The General Manager of the Bank of Ceylon is not in question here. I have not asked any question about him. I have stated that the salary scales of managers in the Bank of Ceylon and the People's Bank, when compared to the salary scales of the Manager and the Accountant of the Ceylon Savings Bank, are lower.

**විමලසේන මයා.**
*(திரு. விமலசேன)*
(Mr. Wimalasena)

Slightly lower. The initial is the same, but the maximum is slightly lower.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்஬ா)*
(Mr. Bernard Soysa)

Then, the answer that was given to me originally, namely, "No" is an incorrect answer. In line with that reply, the answer that was given in relation to (*b*), has also got to be modified. If the answer to (*a*) has now to be modified, then the answer to (*b*) has also got to be modified. I am asking whether he will take action under Section 8 in order to bring these conditions into line with those in the other banks.

**විමලසේන මයා.**
*(திரு. விமலசேன)*
(Mr. Wimalasena)

I have already stated that their conditions of service are not identical.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்஬ா)*
(Mr. Bernard Soysa)

That is also an answer that has got to be modified. As a matter of fact, the duties here could be considered to be even more onerous in certain respects. Will the hon. Parliamentary Secretary meet the trade unions concerned and discuss this matter?

**විමලසේන මයා.**
*(திரு. விமலசேன)*
(Mr. Wimalasena)

That is a different matter. I am always ready to meet them. But the fact is that one is a commercial bank, the other is not. The functions are vastly different.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்஬ா)*
(Mr. Bernard Soysa)

If the hon. Parliamentary Secretary followed the reply that was given by his Minister yesterday on the same subject, he would modify that reply also!

## සමස්ත ලංකා බෞද්ධ ශිෂ්‍ය සම්මේලනය: බාධකයන් ඉවත් කිරීම

*அகில இலங்கை பௌத்த மாணவர் சம்மேளனம்: தடைகள் களைதல்*

**ALL CEYLON BUDDHIST STUDENTS' FEDERATION: REMOVAL OF RESTRAINTS**

3. **බී. වයි. තුඩාවේ මයා.** (මාතර—ප්‍රින්ස් ගුණසේකර මයා. වෙනුවට)
*(திரு. பி. வை. துடாவ—மாத்தறை—திரு. பிறின்ஸ் குணசேக்கர சார்பாக)*
(Mr. B. Y. Tudawe—Matara—on behalf of Mr. Prins Gunasekera)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) සමස්ත ලංකා බෞද්ධ ශිෂ්‍ය සමිති සම්මේලනය පහත දක්වෙන පරමාර්ථ සපුරාලීම සඳහා, එනම්—(i) බෞද්ධ ශිෂ්‍යයන් අතර අන්‍යෝන්‍ය සහයෝගතාවක් ඇති කිරීමට, (ii) බුද්ධ ධර්මය ඉගෙනීමට, ධර්මානුකූලව ප්‍රතිපත්ති පිරීමට හා ධර්ම ප්‍රචාරයටත් බෞද්ධ ශිෂ්‍යයින්ට දැන් ඇති පහසුකම් වඩා දියුණු කිරීමට, (iii) රටේ ආගම් හා සමාජසේවා වැඩ කටයුතු පිළිබඳ වැදගත් සේවයක් සිදු කිරීම සඳහා බෞද්ධ ශිෂ්‍යයින් පුහුණු කිරීමට, (iv) බෞද්ධ ශිෂ්‍යයින්ගේ සදාචාරය, සංස්කෘතිය හා සමාජ සම්පත් නගාලීමට, (v) අන්තර් ජාතික බෞද්ධ ශිෂ්‍ය ව්‍යාපාරයක් ආරම්භකොට එමගින් ජාතීන් අතර වඩා යහපත් වැටහීමක් ඇති කිරීමට, (vi) බුද්ධාගම පිළිබඳ උද්යෝගය දියුණු කිරීමට පියවර ගන්නා බව එතුමා දන්නවා ද? (ආ) එයින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාසැල් සිසුනට සේවයක් සිදුවන බව එතුමා දන්නවා ද? (ඉ) 1968 අංක 94 දරණ චක්‍ර ලේඛනය සමස්ත ලංකා බෞද්ධ ශිෂ්‍ය සමිති සම්මේලනයටත් බලපා ඇති බැවින්ද, ඒ නිසා ඉහත දක්වෙන කටයුතු සාර්ථකව කිරීමට නොහැකි බැවින්ද, එයින් ලක්දිව බෞද්ධ ශිෂ්‍යයාට බලවත් හානියක් සිදුවන බැවින්ද එම තත්ත්වය නැති කිරීමට එතුමා කටයුතු කරනවාද? (ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) அகில இலங்கை பௌத்த மாணவர் சங்க சம்மேளனம் கீழ்க்காணும் நோக்கங்களை நிறைவேற்றுவதற்காக—அதாவது, (i) பௌத்த மாணவர்களுக்கிடையே அந்நியோன்ய ஒத்துழைப்பை ஏற்படுத்துவதற்கு; (ii) பௌத்த தர்மத்தைக் கற்பதற்கு, தர்மானுகூலப்படி கொள்கையைக் கடைப்பிடிப்பதற்கு, பௌத்த மாணவர்களுக்கு தர்மப்பிரசாரம்பற்றிய இப்பொழுதுள்ள வசதிகளை மேலும் அதிகரிப்பதற்கு; (iii) நாட்டின் சமய சமூகம் பற்றிய முக்கிய சேவைகளை நிறைவேற்ற பௌத்த மாணவர்களைப் பயிற்றுவதற்கு; (iv) பௌத்த மாணவர்களின் நல்லொழுக்கம், கலாசாரம் சமூக செல்வம் ஆகியவைகளை வளர்ப்பதற்கு; (v) சர்வதேச பௌத்த மாணவர் இயக்கத்தைத் தொடங்கி அதன் மூலம் மேலும் நல்ல விளக்கத்தை ஏற்படுத்துவதற்கு; (vi) பௌத்த மதம் பற்றிய ஆர்வத்தை வளர்ப்பதற்கு; நடவடிக்கை எடுப்பதை அவர் அறிவாரா? (ஆ) அதன் மூலம் பாடசாலை மாணவருக்கு சேவை கிடைப்பதை அவர் அறிவாரா? (இ) 1968 ஆம் வருட 94 ஆம் இலக்கச் சுற்று நிருபம் அகில இலங்கை பௌத்த மாணவர் சங்க சம்மேளனத்தைப் பாதித்திருப்பதாலும் மேற்கூறிய கருமங்களை நிறைவேற்ற முடியாதிருப்பதாலும் இதனுல் இலங்கை பௌத்த மாணவருக்குப் பெரும் தீங்கு ஏற்படுவதாலும் அந்நிலைமையை நீக்குவதற்கு அவர் நடவடிக்கை எடுப்பாரா? (ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that the All Ceylon Federation of Buddhist Students' Societies aims at achieving the following objectives: (i) establishing mutual co-operation among Buddhist students, (ii) improving the facilities available at present for Buddhist students to study, practise and propagate Buddhism, (iii) training Buddhist students to play an important role in the religious and social service activities in the country, (iv) promoting the moral, cultural and social advancement of Buddhist students, (v) developing international understanding by founding an international Buddhist Students' Movement, (vi) increasing the interest in Buddhism? (*b*) Is he aware that this benefits the schoolchildren? (*c*) In view of the fact that Circular No. 94 of 1968 affects the All Ceylon Federation of Buddhist Students' Societies also, thus preventing the realization of the abovementioned objectives, and since this will cause considerable harm to Buddhist students of Ceylon, will he take action to remedy the situation? (*d*) If not, why?

**ගරු ඊරියගොල්ල**
(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

(අ) සඳහන් කොට ඇති පරමාර්ථ පමණක් නොව මෙම සංවිධානයෙහි දේශපාලන පරමාර්ථද ඇති බව දනිමි. (ආ) එවැනි සේවාවක් නොවේය යනු මගේ හැඟීමයි. (ඉ) ඒ චක්‍ර ලේඛනයෙන් ශිෂ්‍යයන්ගේ ආගමික දියුණුවට බාධාවක් නැත. (ඊ) පැන නොනඟී.

**මතුරට ආර්. ඩී. හින්නි අප්පුහාමි මහතා**
திரு, ஆர். டி. ஹின்னி அப்புகாமி, மத்துரட்டை
MR. R. D. HINNIAPPUHAMY, MATURATA

4. **ටී. බී. එම්. හේරත් මයා.**
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

ජනසතු සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1968.1.4 වැනි දින නුවරඑළිය හාවාඑළිය හන්දියේදී 23 ශ්‍රී 777 දරණ ලං.ග.ම. බස් රථයට යටවීමෙන් මතුරට කලඋල්ල, ආර්. ඩී. හින්නි අප්පුහාමි මහතා හදිසි අනතුරකට භාජන වූ බව එතුමා දන්නවාද? (ආ) එම අනතුරින් ඔහුට අ‍ත්වූ අලාභහානි මොනවාද? (ඉ) ඔහුට මෙතෙක් වන්දි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

මුදලක් ගෙවා තිබේද ? නො එසේ නම්, ඒ මන්ද ? (ඊ) මෙම මගියා ගැන සානුකම්පිකව නැවත සලකා බැලීමට එතුමා අවශ්‍ය පියවර ගන්නවාද ? නො එසේ නම්, ඒ මන්ද ?

*தேசியமய சேவைகள் அமைச்சரைக் கேட்ட வினா: (அ) மத்துரட்டை, கலுஉல்லவைச் சேர்ந்த திரு. ஆர். டி. ஹின்னிஅப்புகாமி 4.1.1968 அன்று நுவரெலியா, ஹாவா-எலியச் சந்தியில் 23 ஸ்ரீ 777 இ. போ. ச. வசுவின் கீழ் அகப்பட்டாரென்பதை அவர் அறிவாரா? (ஆ) இந்த விபத்தில் அவருக்கு ஏற்பட்ட சேதமென்ன? (இ) அவருக்கு ஏதாவது நஷ்டஈடு வழங்கப்பட்டதா? இல்லையெனில், ஏன்? (ஈ) இவ்விஷயத்தை அனுதாபத்துடன் மீட்டுப் பரிசிலனை செய்வதற்குரிய நடவடிக்கைகளை அவர் மேற்கொள்ளுவாரா? இல்லையெனில், ஏன்?*

asked the Minister of Nationalized Services: (*a*) Is he aware that Mr. R. D. Hinniappuhamy of Kalaulla, Maturata, was run over by C.T.B. bus 23 ශ්‍රී 777 at the Hawaeliya Junction, Nuwara Eliya, on 4.1.1968 ? (*b*) What was the damage suffered by him in this accident ? (*c*) Has he been paid any compensation ? If not, why ? (*d*) Will he take the necessary steps to have this matter reconsidered sympathetically ? If not, why ?

**එස්. ද එස්. ජයසිංහ මයා. (ජනසතු සේවා ඇමති වෙනුවට)**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ—தேசியமய சேவை அமைச்சர் சார்பாக)*

((Mr. S. de S. Jayasingha—on behalf of the Minister of Nationalized Services)

(අ) ඔව්. (ආ) හදිසි අනතුර පිළිබඳ වාර්තාව අනුව ඔහුගේ දකුණු කකුල දණහිසට උඩින් කැඩී ඇත. ආර්. ඩී. හින්නි අප්පුහාමි මහතා විසින් වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කර නැත. (ඉ) නැත. පොලිස් වාර්තාව අනුව මෙම හදිසි අනතුර බස් රථය නැවැත්වීමට ප්‍රථම එයින් පැන ඇති ආර්. ඩී. හින්නි අප්පුහාමි මහතාගේ නොසැළකිල්ල නිසා සිදු වූවකි. (ඊ) මගියාගේ වරදින් සිදු වූවක් නිසා මෙම කරුණ නැවත සළකා බැලිය නොහැකිය.

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

අතුරු ප්‍රශ්නයක් අසන්න කැමතියි. නියමිත සථානයෙහි එම බස් රථය නොනවත්වා බස් රිය තවදුරටත් ඉදිරියට ගමන් කිරීමේදී ඔහු බසින්නට කළ උත්සාහයේදී එම අනතුර සිද්ධ වී තිබෙන්නෙ. ඒ නිසා ගරු ඇමතිතුමා කරුණාකර මෙම ඉතාම අහිංසක දුප්පත් මනුෂ්‍යයාගේ කකුල කැඩී යෑම වෙනුවෙන් යම්කිසි වන්දි මුදලක් ලබා දීමට සානුකම්පිකව සලකා බලනවාද ?

**එස්. ද එස්. ජයසිංහ මයා.**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*

(Mr. S. de S. Jayasingha)

බස් රථයක් ධාවනය වන විට මගියෙක් බස් රථයෙන් බසින්නට ගොස් වැටුනේ නම් එය මගියාගේ වරදක් බව කවුරුත් පිළිගන්නා දෙයක්. එම නිසා ඒ විධියේ අනතුරුවලදී ප්‍රතිපත්තියක් වශයෙන් වන්දි ගෙවීමක් සිද්ධ වෙන්නෙ නැහැ. කෙසේ වෙතත් මේ කාරණය ගැන නැවත වරක් සලකා බලන ලෙස ඇමතිතුමාට දැනුම් දෙන්නම්.

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

ගරු ඇමතිතුමාගේ පිළිතුරේ සඳහන් වෙනවා, හින්නි අප්පුහාමි මහතා වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කර නැත කියා. එම ප්‍රකාශය අසත්‍යයක් බවත් වෛද්‍ය සහතිකයක් ඔහු විසින් ඉදිරිපත් කර තිබෙන බවත්, වගකිය යුතු මන්ත්‍රීවරයකු වශයෙන් මා ප්‍රකාශ කරන අතර, එම වැරදි ප්‍රකාශය කර ඇති නිලධාරීන් ගැන එතුමා සොයා බලනවාද ?

**එස්. ද එස්. ජයසිංහ මයා.**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*

(Mr. S. de S. Jayasingha)

මා විසින් කියවන්නට යෙදුණේ වගකිය යුතු ඇමතිවරයකුගේ ප්‍රකාශයක් බවත් මතක් කරන්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.** (දොම්පෙ)

*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க—தொம்பே)*

(Mr. F. R. Dias Bandaranaike—Dompe)

එහෙම නම් එයා ගැන සොයා බලන්න.

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

තුන්වෙනි අතුරු ප්‍රශ්නය. ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා පෞද්ගලික වගකීමක් ඇතුව ප්‍රකාශ කරනවාද වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කර නැත කියා?

**එස්. ද එස්. ජයසිංහ මයා.**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*

(Mr. S. de S. Jayasingha)

පෞද්ගලික වගකීමක් ඇතුව ප්‍රකාශ කරන්න බැහැ. වාර්තාව අනුවයි ප්‍රකාශ කර තිබෙන්නෙ.

## අකුරණ කොට්ඨාශය: උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභා ආධාර, 1967-68

*அக்குறணைத் தொகுதி: கண்டிய கமக்காரர் புனருத்தாரணக் குழுவின் உதவி, 1967–68*

AKURANA ELECTORATE: ASSISTANCE OF KANDYAN PEASANTRY REHABILITATION COMMISSION, 1967-68

5. **ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල—හේමචන්ද්‍ර සිරිසේන මයා.—අකුරණ පළමුවන මන්ත්‍රී—වෙනුවට)

*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புளை—திரு. ஹேமச்சந்திர சிரிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர் சார்பாக)*

(Mr. T. B. Tennekoon—Dambulla—on behalf of Mr. Hemachandra Sirisena—First Akurana)

ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1967-68 මුදල් වර්ෂය වෙනුවෙන්, උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාවේ ආධාර යටතේ ක්‍රියාත්මක කිරීම පිණිස අකුරණ ඡන්ද කොට්ඨාශය තුළ අනුමත වූ සියළුම කර්මාන්ත මොනවාද? (ආ) එකී කර්මාන්ත යෝජනා කරනු ලැබුයේ කවුරුන් විසින්ද? (ඉ) යථෝක්ත එක් එක් කර්මාන්තය වෙනුවෙන් ඇස්තමේන්තු කරනු ලැබූ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද? (ඊ) ඉහතකී පරිදි ඇස්තමේන්තු අනුව එම වර්ෂයේ වැය ශීර්ෂයෙන් එක් එක් කර්මාන්තය සඳහා වෙන් කරනු ලැබූ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද? (උ) මේ අනුව එම කර්මාන්ත කොතෙක් දුරට කරගෙන ගොස් තිබේද යන වග වෙන් වෙන් වශයෙන් එතුමා පැහැදිලි කරනවාද? (ඌ) මේ අන්දමින් සම්පූර්ණයෙන් වැඩ නිම කිරීමට නොහැකි වූ කර්මාන්ත වෙනුවෙන් 1968-69 මුදල් වර්ෂයෙන් වෙන් කරනු ලැබූ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද?

*உள்நாட்டு விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) 1967/68 நிதி வருடத்தில் கண்டிய கமக்காரப் புனருத்தாரணக் குழுவின் உதவியுடன் அக்குறணைத் தொகுதியில் நிறைவேற்றப்படுவதற்கான வேலைகள் எவை? (ஆ) இவ்வேலைகள் யாரால் முன்மொழியப்பட்டன? (இ) இவ்வேலைகளொவ்வொன்றினதும் உத்தேசச் செலவுத் தொகையென்ன? (ஈ) இவ் வேலைகள் ஒவ்வொன்றைப் பொறுத்த மட்டில் உத்தேசமதிப்பீட்டின் அடிப்படையில் சம்பந்தப்பட்ட வருட வாக்குப்பணத்திலின்றும் ஒதுக்கப்பட்ட தொகையென்ன? (உ) இவ் வேலைகள் ஒவ்வொன்றும் எவ்வளவு தூரம் செயற்படுத்தப்பட்டுள்ளது? (ஊ) முடிவடையாத வேலைகளுக்கென 1968/69 நிதி வருட வாக்குப்பணத்தில் ஒதுக்கப்பட்டுள்ள தொகையென்ன?*

asked the Minister of Home Affairs: (*a*) What are the various works in the Akurana electorate approved for implementation during the financial year 1967-68, with the assistance of the Kandyan Peasantry Rehabilitation Commission? (*b*) By whom were

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ පී. බී. තෙන්නකෝන් මයා.]

they proposed ? (c) What was the estimated cost of each of these works ? (d) What was the financial provision made in the votes of the relevant financial year, in respect of each of these works, on the basis of the estimates prepared ? (e) To what extent has work progressed in respect of each of these works ? (f) What is the financial provision made in respect of the uncompleted works in the votes of the financial year 1968-69 ?

වාචික පිළිතුරු

**ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க—உள்நாட்டு விவகார அமைச்சர்)*

(The Hon. Dr. W. Dahanayake—Minister of Home Affairs)

ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයේ (අ) සිට (ඖ) දක්වාවූ කොටස්වලට විවිධ නීරුවල පිළිතුරු දැක්වෙන (වක්‍රගත) ප්‍රකාශයක් සභාගත කරමි.

**සභාගත කරන ලද (වක්‍රගත) ප්‍රකාශය මෙසේයි:**

*சபாபீடத்தில் வைக்கப்பட்ட அறிக்கை வருமாறு :*

*The statement tabled is as follows :*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| | (අ) | (ආ) | (ඉ) | (ඊ) | (උ) | | | (ඌ) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | | රු. ශ. |
| 1. | අංකුඹුර–උඩගම–කිතුල්ගොල්ල පාර ... | අකුරණ 1 වැනි මන්ත්‍රීතුමා | මහජන 64,000 0... | 18,310 03... | | ... 18,310 03... | මුදලට සරිලන වැඩ කර තිබේ | 9,000 0 |
| 2. | කැටපිටැල්ල ගම්සභා යාර ... | එම | ... 58,500 0... | 1,000 0... | | ... — ... | එම | ... 1,000 0 |
| 3. | මාරතුගොඩ–හරංකහව පාර ... | එම | ... 45,000 0... | 38,634 95... | | ... 8,634 95... | එම | ... 4,700 0 |
| 4. | මල්වරකාව–මාරතුගොඩ පාර ... | එම | ... 96,500 0... | 20,000 0... | | ... 26,068 35... | එම | ... 18,000 0 |
| 5. | රුප්පේවත්ත–මැඩිල්ල පාර ... | එම | ... 60,000 0...<br>62,000 0... | 20,000 0...<br>20,000 0... | 40,000 0... | 39,453 33...<br>36,950 45 | එය | ... 18,000 0 |
| 6. | ශ්‍රී ජයන්ති පාර ... | එම | ... 50,000 0... | 25,000 0... | | ... 12,475 95... | එම | ... — |
| 7. | තිබ්බුට්ට–පැනහැරිපොල–දෙඹරලාව පාර ... | එම | ... 51,000 0... | 25,000 0... | | ... 5,468 25... | එම | ... — |
| 8. | අත්තරගම–බෝතොට පාර ... | එම | ... 77,800 0... | 18,891 13... | | ... 18,891 13... | එම | ... 9,000 0 |
| 9. | පූජාපිටිය–බටපොල–බෝතොට පාර ... | එම | ... 77,000 0... | 10,000 0... | | ... 10,350 32... | එම | ... 9,000 0 |
| 10. | අකුරණ–වැලිකැටිය පාරේ 6 කණුවේ පිහාඔයට උඩින් පාළම සෑදීම | අකුරණ 2 වැනි මන්ත්‍රීතුමා | මහජන 54,500 0... | 10,000 0... | | ... 39,836 77... | එම | ... 4,500 0 |
| 11. | මහනුවර–මාතලේ පාරේ 7 වැනි සැතැපුමේ නිරල්ල පාලම සෑදීම | එම | ... 56,000 0... | 3,500 0... | | ... 4,720 50... | එම | ... 27,000 011 |
| 12. | පිහාඔය–මල්වානහින්න පාළම සෑදීම ... | එම | ... 39,500 0... | 34,665 83... | | ... 34,665 83... | එම | ... 4,000 011 |
| 13. | ගල්හින්න–විලාන පාර ... ... | එම | ... 73,000 0... | 20,000 0... | | ... 44,826 75... | එම | ... 4,500 0 |
| 14. | පල්ලේගම–බෝදිගොඩැල්ල පාර ... | එම | ... 69,000 0... | 20,000 0... | | ... 18,869 69... | එම | ... 9,000 0 |
| 15. | කුරුගොඩ–පංගොල්ලාමඩ 7 කනුව පාර ... | එම | ... 61,400 0—<br>93,000 0— | 20,000 0—<br>20,000 0— | 40,000 0... | 25,792 62— 72,444 38<br>46,651 7676— | | ... 9,000 0<br>9,000 0 } 18,000 0 |
| 16. | දෙහිඅංග පාර ... ... | එම | ... 67,000 0... | 25,522 82... | | ... 25,522 82... | මුදලට සරිලන වැඩ කර තිබේ. | 18,000 0 |
| | කුරුදුගොල්ල–මුරුතලාව පාර ... | එම | ... 64,300 0... | 21,016 67... | | ... 21,016 67... | එම | ... 9,000 0 |
| | ³ගල–උඩුරුස්සපිටිය පාර ... | එම | ... 99,500 0... | 89,718 15... | | ... 89,718 15... | එම | ... 3,600 0 |
| | ·වල–පහලහිඳුල්වල පාර ... | එම | ... 67,100 0... | 61,159 24... | | ... 61,159 24... | එම | ... 3,700 0 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

| | (අ) | (ආ) | (ඉ) රු. ශ. | (ඊ) රු. ශ. | (උ) රු. ශ. | | (ඌ) රු. ශ. | |
|---|---|---|---|---|---|---|---|---|
| 20. | අංකුඹුර–එගොඩමුල්ල පාර ... | අකුරණ 2 වැනි මහජන මන්ත්‍රීතුමා | 98,000 0... | 20,000 0... | ... 20,000 0... | මුදලට සරිලන වැඩ කර තිබේ. | — ... | |
| 21. | බුළුගහතැන්න පාර ... ... | එම ... | 40,000 0... | 10,000 0... | ... 8,521 90... | එම | ... 18,000 0... | |
| 22. | උඩුරුස්සපිටිය–වනහගල–දඩොහොගම පාර | ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීමක් | 45,000 0... | 43,645 40... | ... 21,079 35... | එම | ... — ... | |
| 23. | මැදවෙල–ගල්පොත්තාවල පාර ... | මැදවෙල ග්‍රාමසංවර්ධන සමිතිය | 31,000 0... | 13,326 25... | ... — ... | එම | ... — ... | |
| 24. | හල්ඔලුව ම. වි. කර්මාන්තශාලාව ... | අකුරණ 1 වැනි මහජන මන්ත්‍රීතුමා | 24,638 0... | 950 0... | ... අවසන් ... | | ... 2,000 0... | ඉතිරි මුදල් පියවීමට |
| 25. | දෙහිඅංග–මුස්ලිම් වි.–ගුරු නිවාසය — | අකුරණ 2 වැනි මහජන මන්ත්‍රීතුමා | 21,893 0 | 2,100 0... | ... අවසන් ... | | ... නැත ... | |
| | එම ජල සේවය — | | 14,991 0 | | අවසන් | | නැත | |
| 26. | අකුරණ මුස්ලිම් ම.වි.–ගුරු නිවාසය ... | අකුරණ 2 වැනි මහජන මන්ත්‍රීතුමා | 24,939 0... | 10,300 0... | ... අවසන් ... | | ... 2,087 0... | ඉතිරි මුදල් පියවීමට |
| 27. | නුගවෙල ක්‍රීඩා භූමිය–ම.ම.වි. ... | එම ... | 50,168 50... | 2,500 0... | ... අවසන් ... | | ... නැත ... | |
| 28. | අකුරණ මුස්ලිම් වි.–ක්‍රීඩා ... ... | එම ... | 37,372 0... | 33,600 0... | ... අවසන් ... | | ... 3,700 0... | ඉතිරි මුදල් පියවීමට |
| 29. | කහටගස්තැන්න ගොඩනැගිලි (පාසැල්) ... | එම ... | 26,771 88... | 20,193 0... | ... අවසන් ... | | ... 6,500 88... | ඉතිරි මුදල් පියවීමට |
| 30. | දිප්පිටිය ගුරු නිවාසය ... ... | එම ... | 14,180 47... | 1,794 20... | ... අවසන් වෙමින් පවතී | | ... 12,300 0... | |
| 31. | තෙලඹුගහවත්ත ගොඩනැගිල්ල (පාසැල්) | එම ... | 33,538 0... | — ... | ... එම | | ... 33,538 0... | |
| 32. | ගොහාගොඩ වි.–ගොඩනැගිල්ල ... | අකුරණ 1 සහ 2 මහජන මන්ත්‍රීතුමන් | 15,926 0... | 8,000 0... | ... අවසන් ... | | ... නැත ... | |
| 33. | පූජාපිටිය–ම.වි.–ජල සේවය ... | අකුරණ 1 වැනි මහජන මන්ත්‍රීතුමා | 17,395 0... | 15,808 0... | ... අවසන් ... | | ... නැත ... | |
| 34. | බෝක්කාවල මාතෘ නිවාසය ... | අකුරණ 2 වැනි මහජන මන්ත්‍රීතුමා | 88000 0... | 49,468 0... | ... අවසන් ... | | ... 4,000 0... | ඉතිරි මුදල් පියවීමට |
| 35. | දුනුවිල ජල යෝජනා ක්‍රමය ... | ගම් සභාපති හරිස්පත්තු උඩගම්පහ ගම්සභාව | 5,192 50... | 5,124 0... | ... අවසන් ... | | ... නැත ... | |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| (அ) | (ஆ) | (இ) | (ஈ) | | (உ) | | | (ஊ) | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ரூபா | ரூ. ச. | | ரூ. ச. | | | | |
| 1. அங்கும்புற-இதுல்கொல்ல வீதி | அக்குறணையின் மாண்புமிகு முதலாவது அங்கத்தவர் .. | 64,000 .. | 18,310.03 .. | | .. 18,310.03 | | க்காரிய வேலை முடிந்துவிட்டது .. | 9,000.00 | |
| 2. கெதபித்தல்ல கி. ச .வீதி | ஷ்டி .. | 58,500 .. | 1,000.00 .. | | .. — | | ஷ்டி .. | 1,000.00 | |
| 3. மரதுகொட-ஹறன்கஹவ வீதி | ஷ்டி .. | 45,000 .. | 38,634.95 .. | | .. 38,643.95 | | ஷ்டி .. | 4,700.00 | |
| 4. மல்வறகாவ மரதுகொட வீதி | ஷ்டி .. | 96,500 .. | 20,000.00 .. | | .. 26,068.35 | | ஷ்டி .. | 18,000.00 | |
| 5. றூப்பேவத்த மதில்ல வீதி | ஷ்டி | 60,000 .. | 20,000.00 | 40,000 | 39,453.33 | | ஷ்டி .. | 18,000.00 | |
| | | 62,000 .. | 20,000.00 | | 36,950.45 | | ஷ்டி .. | — | |
| 6. ஸ்ரீ ஜயந்தி வீதி | ஷ்டி .. | 50,000 .. | 25,000.00 .. | | .. 12,475.96 | | ஷ்டி .. | — | |
| 7. திப்புத்த-பனகெட்டிபொலதம் பறலாவ வீதி | ஷ்டி .. | 51,000 .. | 25,000.00 .. | | .. 5,468.25 | | ஷ்டி .. | — | |
| 8. அத்தறமக- பொதட வீதி | ஷ்டி .. | 77,800 .. | 18,891.13 .. | | .. 18,891.13 | | ஷ்டி .. | 9,000.00 | |
| 9. புஜபிட்டிய பத்தகல்ல பொதட வீதி | ஷ்டி .. | 77,000 .. | 10,000.00 .. | 10 | .. 10,350.32 | | ஷ்டி .. | 9,000.00 | |
| 10. அக்குறணை- வெலிஹெட்டிய வீதியில் 6 வது மைல் கல்லடியில் பிங்க ஒயவின் பாலம் அமைத்தல் | அக்குறணையின் மாண்புமிகு இரண்டாவது அங்கத்தவர் .. | 54,500 | 10,000.00 .. | | .. 39,836.77 | | ஷ்டி .. | 4,500.00 | |
| 11. கண்டி—மாத்தளை வீதியின் 7 வது மைல் கல்லடியில் நீரெல்ல பாலம் கட்டுதல் | ஷ்டி .. | 56,000 .. | 3,500.00 .. | | .. 4,729.50 | | ஷ்டி .. | 27,000.00 | |
| 12. பிங்க ஒய மலவன்கின்ன பாலம் அமைத்தல் | ஷ்டி .. | 39,500 .. | 34,665.83 .. | | .. 34,665.83 | | ஷ்டி .. | 4,000.00 | |
| 13. கலகின்ன விலான வீதி | ஷ்டி .. | 73,000 .. | 20,000.00 .. | | .. 44,826.75 | | ஷ்டி .. | 4,500.00 | |
| 14. பள்ளேகம போதிகொடல்ல வீதி | ஷ்டி .. | 69,000 .. | 20,000.00 .. | | .. 18,869.69 | | ஷ்டி .. | 9,000.00 | |
| 15. குருகொட பங்கொல்லமட வீதி கத்தேகனுவ வீதி | ஷ்டி | 61,400 .. | 20,000.00 | 40,000 | 25,792.62 | 72,444.38 | | 9,000.00 | 18,000 |
| | | 93,000 .. | 20,000.00 | | 46,651.76 | | | 9,000.00 | |
| 16. தெகியங்க வீதி | ஷ்டி .. | 67,000 .. | 25,522.82 .. | | .. 25,522.82 | | ஷ்டி .. | 18,000.00 | |
| 17. குருந்துகொல்ல முருத்தலாவ வீதி | ஷ்டி .. | 64,300 .. | 21,016.67 .. | | .. 21,016.67 | | ஷ்டி .. | 9,000.00 | |
| 18. இனிகல்ல உக்குறஸ்ஸபிட்டி வீதி | ஷ்டி .. | 99,500 .. | 89,718.15 .. | | .. 89,718.15 | | ஷ்டி .. | 3,600.00 | |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| (அ) | (ஆ) | (இ) | (ஈ) | (உ) | | (ஊ) | |
|---|---|---|---|---|---|---|---|
| | | ரூ. | ரூ. ச. | ரூ. ச. | | | |
| 19. பொக்கவல பஹலஸிங்குல்வல வீதி | அக்குறணையின் மாண்பு மிகு இரண்டாவது அங்கத்தவர் .. | 67,100 .. | 61,159.24 .. | .. 61,159.24 | க்காரிய வேலை முடிந்துவிட்டது | 3,700.00 | |
| 20. அக்கும்பற எகொடமுல்ல வீதி | ஷை .. | 98,000 .. | 20,000.00 .. | .. 20,000.00 | ஷை | .. — | |
| 21. புளுககதென்ன வீதி | ஷை .. | 40,000 .. | 10,000.00 .. | .. 8,521.90 | ஷை | .. 18,000.00 | |
| 22. உக்குறஸ்ஸபிட்டிய வனககல தடொ கம வீதி | பொதுமக்களின் கோரிக்கை .. | 45,000 .. | 43,645.40 .. | .. 21,079.35 | ஷை | .. — | |
| 23. மதவெல கல்பொட்டவல வீதி | மதவெல கி. மு. ச. .. | 31,000 .. | 13,326.25 .. | .. — | ஷை | .. — | |
| 24. கல்லொளுவ ம. வி.தொழிற்சாலை | அக்குறணையின் 1வது மாண்பு அங்கத்தவர்.. | 24,638 .. | 950.00 .. | | ..முடிந்துவிட்டது | .. 2,000.00 | ..மிகுதி வேலைக்காக |
| 25. தெகிஅங்க முஸ்லிம் பா. ஆசிரியர் விடுதி | அக்குறணையின் 2வது மாண்பு. அங்கத்தவர் | 21,893 | 2,100.00 .. | | முடிந்துவிட்டது | .. இல்லை | |
| நீர் வசதி | ஷை .. | 14,991 | | | முடிந்துவிட்டது | .. ஷை | |
| 26. அக்குறணை முஸ்லிம் ம. வி. ஆசிரியர் விடுதி | ஷை .. | 24,939 .. | 10,300.00 .. | | ..முடிந்துவிட்டது | .. 2,087.00 | ..மிகுதி வேலைக்காக |
| 27. நுகவெல மத்திய பாடசாலை, விளையாட்டு மைதானம் | ஷை | .. 50,168.50 .. | 2,500.00 .. | | ..முடிந்துவிட்டது | .. | |
| 28. அக்குறணை முஸ்லிம் பா. விளையாட்டு மைதானம் | ஷை .. | 37,372 .. | 33,600.00 .. | | ..முடிந்துவிட்டது | .. 3,700.00 | ..மிகுதி வேலைக்காக |
| 29. ககடகஸ்தென்ன பா. கட்டிடம் | ஷை | .. 26,771.88 .. | 20,193.00 .. | | .. முடிந்து விட்டது | .. 6,500.88 | ..மிகுதி வேலைக்காக |
| 30. திப்பிட்டிய ஆசிரியர் விடுதி | ஷை | .. 14,180.47 .. | — .. | | ..முடிவடையும் நிலையிலுள்ளது | .. 12,300.00 | |
| 31. தலம்புககவத்த பா. கட்டிடம் | ஷை | .. 1,794.20 | .. 33,538.00 .. | | | .. 33,538.00 | |
| 32. கொககொட பா. கட்டிடம் | அக்குறணையின் 1ம்,2ம் மாண்புமிகு அங்கத் தவர்கள் .. | 15,926 .. | 8,000.00 .. | | ..முடிந்துவிட்டது | .. இல்லை | |
| 33. புஜபிட்டி ம. வி. நீர் வசதி | அக்குறணையின் 1ம் மாண்பு. அங்கத்தவர் .. | 17,395 .. | 15,808.00 .. | | ..முடிந்துவிட்டது | .. இல்லை | |
| 34. பொக்கவல பிரசவ விடுதி | அக்குணையின் 2ம் மாண்பு. அங்கத்தவர் .. | 88,000 .. | 49,468.00 .. | | ..முடிந்துவிட்டது | .. இல்லை .. | |
| 35. துனுவில நீர் வினியோகத்திட்டம் | கரிஸ்பத்து உடகம்பக கி. ச தலைவர் .. | 5,192.50 .. | 5,194.00 .. | | ..முடிந்துவிட்டது | .. 4,000.00 | ..மிகுதி வேலைக்காக |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| (A) | (B) | (C) Rs. c. | (D) Rs. c. | | | (E) Rs. c. | | (F) Rs. c. | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. Ankumbura-Udagama-Kitulgolla Road | Hon. 1st M.P. for Akurana | 64,000 0.. | 18,310 03.. | | .. Work done to cover an expenditure of | 18,310 03.. | | .. 9,000 0.. | |
| 2. Ketapitalla V. C. Road .. | do. | .. 58,500 0.. | 1,000 0.. | | .. do. | .. — .. | | .. 1,000 0.. | |
| 3. Maratugoda-Harankahawa Road | do. | .. 45,000 0.. | 38,634 95.. | | .. do. | .. 38,634 95.. | | .. 4,700 0.. | |
| 4. Malwarakawa-Maratugoda Road | do. | .. 96,500 0.. | 20,000 0.. | | .. do. | .. 26,068 35.. | | .. 18,000 0.. | |
| 5. Ruppewatta-Medilla Road | do.<br>do. | .. 60,000 0..<br>.. 62,000 0.. | 20,000 0<br>20,000 0 | 40,000 0.. | do.<br>do. | .. 39,453 33..<br>.. 36,950 45.. | | .. 18,000 0..<br>.. — .. | |
| 6. Sri Jayanthi Road .. | do. | .. 50,000 0.. | 25,000 0.. | | .. do. | .. 12,475 95.. | | .. — .. | |
| 7. Thibbutta-Penahetipola-Dembaralawa Road | do. | .. 51,000 0.. | 25,000 0.. | | .. do. | .. 5,468 25.. | | .. — .. | |
| 8. Attaragama-Botota Road .. | do. | .. 77,800 0.. | 18,891 13.. | | .. do. | .. 18,891 13.. | | .. 9,000 0.. | |
| 9. Pujapitiya-Batagalla-Botota Road .. | do. | .. 77,000 0.. | 10,000 0.. | | .. do. | .. 10,350 32.. | | .. 9,000 0.. | |
| 10. Construction of Bridge over Pinga-Oya at 6th Mile Post of Akurana-Welike-tiya Road | Hon. 2nd M.P. for Akurana | 54,500 0.. | 10,000 0.. | | .. do. | .. 39,836 77.. | | .. 4,500 0.. | |
| 11. Construction of Neerella Bridge at 7th Mile of Kandy-Matale Road | do. | .. 56,000 0.. | 3,500 0.. | | .. do. | .. 4,729 50.. | | .. 27,000 0.. | |
| 12. Construction of Pinga-Oya-Malwanhinna Bridge | do. | .. 39,500 0.. | 34,665 83.. | | .. do. | .. 34,665 83.. | | .. 4,000 0.. | |
| 13. Galhinna-Vilana Road .. | do. | .. 73,000 0.. | 20,000 0.. | | .. do. | .. 44,826 75.. | | .. 4,500 0.. | |
| 14. Pallegama-Bodhigodalla Road | do. | .. 69,000 0.. | 20,000 0.. | | .. do. | .. 18,869 69.. | | .. 9,000 0.. | |
| 15. Kurugoda-Pangollamada-Hathekanuwa Road .. | do. | .. 61,400 0..<br>93,000 0.. | 20,000 0<br>20,000 0 | 40,000 0.. | do.<br>do. | .. 25,792 62<br>.. 46,651 76 | 72,444 38.. | 9,000 0<br>9,000 0 | 18,000 0 |
| 16. Dehianga Road .. | do. | .. 67,000 0.. | 25,522 82.. | | .. do. | .. 25,522 82.. | | .. 18,000 0.. | |
| 17. Kurundugolla-Muruthalawa Road | do. | .. 64,300 0.. | 21,016 67.. | | .. do. | .. 21,016 67.. | | .. 9,000 0.. | |
| 18. Inigala-Uguressapitiya Road | do. | .. 99,500 0.. | 89,718 15.. | | .. do. | .. 89,718 15.. | | .. 3,600 0.. | |
| 19. Bokkawala–Pahala Hingul-wela Road | do. | .. 67,100 0.. | 61,159 24.. | | .. do. | .. 61,159 24.. | | .. 3,700 0.. | |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| (A) | (B) | (C) Rs. c. | (D) Rs. c. | | (E) Rs. c. | | (F) Rs. c. | |
|---|---|---|---|---|---|---|---|---|
| 20. Ankumbura–Egodamulla Road | Hon. 2nd M.P. for Akurana | 98,000 0 | 20,000 0 | Work done to cover an expenditure of | 20,000 0 | .. | — | .. |
| 21. Bulugahatenna Road .. | do. | 40,000 0 | 10,000 0 | do. | 8,521 90 | .. | 18,000 0 | .. |
| 22. Uguressapitiya-Wanahagala-Dadohogama Road | Public request | 45,000 0 | 43,645 40 | do. | 21,079 35 | .. | — | |
| 23. Medewela-Galpottawela Road | R. D. S., Medewela | 31,000 0 | 13,326 25 | .. | — | .. | — | .. |
| 24. Halloluwa M. V.—Workshop | Hon. 1st M.P. Akurana | 24,638 0 | 950 0 | .. | .. | Completed | 2,000 0 | for balance payment |
| 25. DehiangaMuslimS. Teachers' Quarters Water Service | Hon. 2nd M.P. Akurana | 21,893 0<br>14,991 0 | 2,100 0 | | | Completed<br>Completed | Nil<br>Nil | ..<br>.. |
| 26. Akurana Muslim M.V. Teachers Quarters | do. | 24,939 0 | 10,300 0 | .. | .. | Completed | 2,087 0 | for balance payment |
| 27. Nugawela Central S.—Playground .. | do. | 50,168 50 | 2,500 0 | .. | .. | Completed | Nil | .. |
| 28. Akurana Muslim S.—Playground | do. | 37,372 0 | 33,600 0 | .. | .. | Completed | 3,700 0 | for balance payment |
| 29. Kahatagastenna S.—Buildings | do. | 26,771 88 | 20,193 0 | .. | .. | Completed | 6,500 88 | do. |
| 30. Dippitiya-Teachers' Quarters | do. | 14,180 47 | 1,794 20 | .. | .. | Nearing Completion | 12,300 0 | .. |
| 31. Thelambugahawatta S.—Building | do. | 33,538 0 | — | .. | .. | do. | 33,538 0 | .. |
| 32. Gohagoda S.—Building .. | Hon. 1st & 2nd M.P.s for Akurana | 15,926 0 | 8,000 0 | .. | .. | Completed | Nil | .. |
| 33. Pujapitiya M.V.—Water Service | Hon. 1st M.P. for Akurana | 17,395 0 | 15,808 0 | .. | .. | Completed | Nil | .. |
| 34. Bokkawala Maternity Home | Hon. 2nd. M.P. for Akurana | 88,000 0 | 49,468 0 | .. | .. | Completed | 4,000 0 | for balance payment |
| 35. Dunuwila—Water Supply Scheme | Chairman., V. C. Haris Pattu Udagampaha | 5,192 50 | 5,124 0 | .. | .. | Completed | Nil | .. |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## කොස්ලන්ද ගම්සභාව

கொஸ்லாந்தை கிராமச்சங்கம்

## KOSLANDA VILLAGE COUNCIL

6. **ටී. බී. තෙන්නකෝන් මයා.** (ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා.—හපුතලේ—වෙනුවට)

*(திரு. ரீ. பி. தென்னகோன்—திரு. டபிள்யூ. பீ. ஜீ ஆரியதாச—ஹப்புத்தளை—சார்பாக)*

(Mr. T. B. Tennekoon—on behalf of Mr. W. P. G. Ariyadasa—Haputale)

පළාත් පාලන ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) බදුල්ල දිස්ත්‍රික්කයේ කොස්ලන්ද ගම්සභාවට සහ/හෝ සභාපතිතුමාට විරුද්ධව අකාර්යක්ෂමතාවය සහ අයථා පාලනය ගැන චෝදනා 11 ක් ඉදිරිපත් කරන ලද බව එතුමා දන්නේද? (ආ) එසේ නම්, චෝදනා කවරේද? (ඉ) ඉහත සඳහන් චෝදනා ගැන පරීක්ෂණයක් බදුල්ලේ සහකාර පළාත් පාලන කොමසාරිස්තුමන් විසින් පවත්වන ලද බව එතුමා දන්නේද? (ඊ) පරීක්ෂණයෙන් පසුව සහකාර පළාත් පාලන කොමසාරිස්තුමන් විසින් කරන ලද නිර්දේශ මොනවාද? (උ) ඔහුගේ නිර්දේශයන් ක්‍රියාත්මක කරන ලද්දේද? නො එසේ නම්, ඒ මන්ද?

*உள்ளூராட்சி அமைச்சரும், தகவல் ஒலி பரப்பு அமைச்சரின் பாராளுமன்ற காரிய தரிசியுமானவரைக் கேட்ட வினா: (அ) வதுளை மாவட்டத்திலே கொஸ்லாந்தை கிராமச் சங்கத் தலைவருக்கு எதிராக அல்லது கொஸ்லாந்தைக் கிராமச் சங்கத்திற்கு எதிராக அல்லது இரு சாராருக்குமெதிராக திறமையின்மை துர்நிர்வாகம் சம்பந்தமான 11 குற்றச்சாட்டுகள் அமைக்கப்பட்டதை அவர் அறிவாரா? (ஆ) எனின் குற்றச்சாட்டுகள் என்ன? (இ) உள்ளூராட்சி உதவி ஆணையாளர் இக்குற்றச் சாட்டுகள் சம்பந்தமாக விசாரணை ஒன்றினை நடத்தினர் என்பதை அவர் அறிவாரா? (ஈ) விசாரணைக்குப் பின் உள்ளூராட்சி உதவி ஆணையாளரின் விதப்புரைகள் என்ன? (உ) விதப்புரைகள் நடைமுறையாக்கப்பட்டனவா? இன்றேல், ஏன்?*

asked the Minister of Local Government and Parliamentary Secretary to the Minister of Information and Broadcasting: (*a*) Is he aware that 11 charges relating to inefficiency and maladministration were framed against the Chairman of the Koslanda Village Council and/or against the Koslanda Village Council in the Badulla District? (*b*) If so, what are the charges? (*c*) Is he aware that an inquiry was held in regard to the above charges by the Assistant Commissioner of Local Government, Badulla? (*d*) What are the recommendations made by the Assistant Commissioner of Local Government after the inquiry? (*e*) Were those recommendations implemented? If not, why?

**විමලසේන මයා. (පළාත් පාලන ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් වෙනුවට)**

*(திரு. விமலசேன—உள்ளூராட்சி அமைச்சரும் தகவல், ஒலிபரப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரியும் சார்பாக)*

(Mr. Wimalasena—on behalf of the Minister of Local Government and Parliamentary Secretary to the Minister of Information and Broadcasting)

(*a*) No. (*b*) Does not arise. (*c*) The A. C. L. G., Badulla, inquired into certain allegations made against the Chairman of the Koslanda Village Council by two members of the Village Council. (*d*) The A. C. L. G. had not made any recommendations but submitted a report on the allegations. (*e*) The report of the A. C. L. G. is being examined.

## ලං. ග. ම.: පළාත් පාලන ආයතන නියෝජිතයින් ලෙස පත්ව සිටින සේවකයින්

இ. போ. ச.: உள்ளூராட்சிச் சபைகளுக்கு அங்கத்தவராகத் தெரிவு செய்யப்பட்டுள்ள ஊழியர்கள்

## C. T. B.: EMPLOYEES ELECTED MEMBERS OF LOCAL BODIES

7. **ටී. බී. තෙන්නකෝන් මයා.** (ටී. බී. ඉලංගරත්න මයා.—කොළොන්නාව—වෙනුවට)

*(திரு. ரீ. பி. தென்னகோன்—திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னாவை—சார்பாக)*

(Mr. T. B. Tennekoon—on behalf of Mr. T. B. Ilangaratne—Kolonnawa)

ජනසතු සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ලං.ග.ම. සේවකයින්ට පළාත් පාලන මැතිවරණ අපේක්ෂකයින් ලෙස ඉදිරිපත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

[ටී. බී. තෙන්නකෝන් මයා.]
මට අවසර තිබේද ? (ආ) ලං.ග.ම. ේවකයෝ කී දෙනෙක් පළාත් පාලන යතනවල නියෝජිතයින් ලෙස පත් වී ින්ද ? (ඉ) ඔවුන්ගේ නම්, තනතුරු හා ළාත් පාලන ආයතනවල නම් සඳහන් රන්නේද ?

ேசியமயச்சேவை அமைச்சரைக் கேட்ட ு: (அ) (i) அவிசாவளை டிப்போவில் ாட்டியிட இ. போ. ச. ஊழியர்கள் தகவு டயவர்களா ? (ஆ) உள்ளூராட்சி சபைக லே அங்கத்தவர்களாக எத்தனை இ. போ. ஊழியர்கள் தெரிவு செய்யப்பட்டுள்ளார் ர ? (இ) இவர்களின் நாமங்கள், வகிக்கும் தவிகள் சம்பந்தப்பட்ட உள்ளூராட்சி சபை ரின் பெயர்கள் ஆகியவற்றை அவர் தரு ரா ?

ked the Minister of Nationalized ervices: (*a*) Are C.T.B. employees igible to contest local government ections ? (*b*) How many C.T.B. em-oyees have been elected as mem-ers of local authorities ? (*c*) Will he ate their names, the posts held by em and the names of the local ithorities to which they are tached ?

**එස්. ද එස්. ජයසිංහ මයා. (ජනසතු ේවා ඇමති වෙනුවට)**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ—தேசியமய வை அமைச்சர் பார்பாக)*
(Mr. S. de S. Jayasingha—on behalf of e Minister of Nationalized Services)
(අ) නැත. (ආ) දැනීමේ හැටියට දෙදෙ නකි. (ඉ) (1) ඩබ්ලිව්. ලිව්නිස් මහතා, ඇදුරු, තෝලංගමුව ගම් සභාව. (2) කේ. . පුංචි බණ්ඩා මහතා, කොපෝදොස්තර, බ්ලන්ගමුව ගම්සභාව.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
ලංගම සේවකයන්ට දේශපාලනය රන්න ඉඩ දී තිබෙන්නෙ අගමැතිතුමා න් ආසනයේ පමණක්ද ?

වාචික පිළිතුරු

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
That is not a relevant Question.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
8 වැනි ප්‍රශ්නය.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ගරු කථානායකතුමනි, නියම පිළිතුර තවමත් ලැබී නැති නිසා සති දෙකක් කල් ඉල්ලනවා.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
12 වැනි ප්‍රශ්නය.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා මාසයක් කල් දෙන මෙන් ගරු කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමා වෙනුවෙන් ඉල්ලනවා.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike )
ඒක එච්චර අමාරුවක් නොවෙයි.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
14 වැනි ප්‍රශ්නය.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)
මේ ප්‍රශ්නයට පිළිතුරු සපයා ගැනීම සඳහා කච්චේරි විස්සකින් ම තොරතුරු ලබා ගන්නට තිබෙන නිසා මාසයක් කල් ඉල්ලනවා.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

**අකුරණ කොට්ඨාශය : උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභා ආධාර, 1968-69**

அக்குறணைத் தொகுதி : கண்டிய கமக்காரர் புனருத்தாரணக் குழுவின் உதவி, 1968–69

AKURANA ELECTORATE : ASSISTANCE OF KANDYAN PEASANTRY REHABILITATION COMMISSION, 1968/69

15. ටී. බී. තෙන්නකෝන් මයා. (හේමචන්ද්‍ර සිරිසේන මයා. වෙනුවට)
*(திரு. ரீ. பி. தென்னகோன்—திரு. ஹேமச்சந்திர சிரிசேன சார்பாக)*
(Mr. T. B. Tennekoon—on behalf of Mr. Hemachandra Sirisena)
ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) 1968/69 මුදල් වර්ෂය වෙනුවෙන් උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාවේ ආධාර යටතේ ක්‍රියාත්මක කිරීම පිණිස අකුරණ ඡන්ද කොට්ඨාශය තුළ අනුමත වූ සියළුම කර්මාන්ත මොනවාද ? (ආ) එකී කර්මාන්ත යෝජනා කරනු ලැබූයේ කවුරුන් විසින් ද ? (ඉ) යථෝක්ත එක් එක් කර්මාන්තය වෙනුවෙන් ඇස්තමේන්තු කරනු ලැබූ මුදල් ප්‍රමාණයක් වෙන් වෙන් වශයෙන් කවරේද ? (ඊ) එම කර්මාන්ත වෙනුවෙන් 1968/69 වර්ෂයේ වැය ශීර්ෂයෙන් වෙන් කරන්නට යෙදී ඇති මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද ? (උ) අදාල කර්මාන්ත පිළිබඳව දැනට කොපමණ දුරට කටයුතු කර තිබේද යන වග එතුමා පැහැදිලි කරන වාද ?



உள்நாட்டு விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) 1968/69 நிதி வருடத்தில் அக்குறணைத் தொகுதியில் கண்டி கமக்காரர் புனருத்தாரணக் குழுவின் உதவியுடன் செயல் படுத்துவதற்காக அனுமதிக்கப்பட்டுள்ள வேலைகள் யாவை ? (ஆ) இவை யாரால் முன் மொழியப்பட்டுள்ளன ? (இ) இவ்வேலைக ளொவ்வொன்றினதும் மதிப்பிடப்பட்டுள்ள செலவுத் தொகையென்ன ? (ஈ) இவ்வேலைக ளொவ்வொன்றிற்காகவும் 1968/69 நிதி வருட வாக்குப்பணத்தில் ஒதுக்கப்பட்டுள்ள தொகை என்ன ? (உ) இவ்வேலைகள் ஒவ்வொன்றிலும் இது வரைக்கும் செயல்படுத்தப்பட்டிருக்கு மளவென்ன ?

asked the Minister for Home Affairs : (*a*) What are the various works in the Akurana Electorate approved for implementation in the financial year 1968/69 with the assistance of the Kandyan Peasantry Rehabilitation Commission ? (*b*) By whom were these works proposed ? (*c*) What was the estimated cost of each of these works ? (*d*) What is the financial provision made in the votes of the financial year 1968/69 in respect of each of these works ? (*e*) How far has action been taken up to date in respect of each of these works ?

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නයේ (අ) සිට (උ) දක්වා කොටස්වලට පිළිතුරු දැක්වෙන වාර්තාවක් සභාභිමුඛ කරමි.

**සභාමේසය මත තබන ලද පිළිතුරු මෙසේ යි :**
சபாபீடத்தில் வைக்கப்பட்ட விடைகள் வருமாறு :
*The answers tabled are as follows :*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(අ) උ.ගැ.පු. අරමුදල් යොදවා රජයේ වැඩ දෙපාර්තමේන්තුව මගින් කිරීමට යෝජිත මාර්ග වැඩ :

1. රණවන-පල්ලෙබොකලවෙල සිංහ ශ්‍රමදාන පාර
2. කැටපිටැල්ල පාර
3. කහවත්ත ගමට කුරුගොඩ ඔයෙන් පාලමක් බැඳීම
4. නිරැල්ල-පිහාඹය පාර—සැ. ½ ක් ගල් අතුරා තාරදැමීම
5. වැරැල්ලගම-දික්කුඹුර පාර—2 වැනි සැතපුම් ½ සෑදීම
6. බෝතොට පාර—සැ. ½ ක් ගල්අතුරා තාර දැමීම
7. උඩමුල්ල-උග්ගල්ල පාර—සැ. ½ ක පස්වැඩ
8. අංකුඹුර-පල්ලේගම—උඩගමපාර

උ.ගැ.පු. අරමුදල් යොදවා පළාත් පාලන ආයතන මගින් කරවීමට යෝජිත මාර්ග :

9. කොණකලගල-ශල්ඒදණ්ඩ—රතුකොහොා පාර
10. අලදෙනියේ සිට බෙරගම පාසල අසලින් බලවත්ගොඩ දක්වා විහිදී ඇති පාර
11. වතුවල හුන්නන්ඔය පාරේ පාලම බැඳීම
12. දිප්පිටිය-පතඹරගොල්ල පාර
13. මාලගම්මන-දඩොහොගම පාර
14. දෙහිගම-ගොඩමුදුන පාර—කහවතුගොඩ හරහා
15. දෙහිගම ඉඩම්පිටිය පාර
16. රාමකොටුව-වැල්ගාල පාර
17. අංගස්තලාව-රදනකෙටුගල පාර

යෝජිත වෛද්‍ය ගොඩනැගිලි වැඩ :

18. ගොඩහේන මාතෘ නිවාසය

යෝජිත ජල යෝජනා ක්‍රම :

19. දුල්වල ජලයෝජනා ක්‍රමය
20. යටිහලගල-උඩගම යෝජනා ක්‍රමය
21. යටිහෙලගල-පල්ලේගම යෝජනා ක්‍රමය
22. කිතුල්ගොල්ල-මාරාවිල ජනපද යෝජනා ක්‍රමය
23. ඉනිගල ගමට පොදු ළිං දෙකක්

යෝජිත පාසල් ගොඩනැගිලි :

24. අලවතුගොඩ විද්‍යාලයට විද්‍යාගාරයක්
25. පැලව විද්‍යාලයට විද්‍යාගාරයක්
26. පූජාපිටිය විද්‍යාලයට විද්‍යාගාරයක්
27. හරංකහව විද්‍යාලයට ගොඩනැගිල්ලක්
28. අංකුඹුර විද්‍යාලයට විද්‍යාගාරයක්
29. මැදවල විද්‍යාලයට විද්‍යාගාරයක්
30. අකුරණ විද්‍යාලයට ගොඩනැගිල්ලක්
31. අංකුඹුර විද්‍යාලයට ගොඩනැගිල්ලක්
32. යටිහෙලගල පල්ලේගම විද්‍යාලයට ගොඩනැගිල්ලක්
33. රඹුක්කේවෙල මුස්ලිම් විද්‍යාලයට ගොඩනැගිල්ලක්
34. බුලුගොහොතැන්න—මුස්ලිම් විද්‍යාලයට ගොඩනැගිල්ලක්
35. ගොහාගොඩ විද්‍යාලයට ගොඩනැගිල්ලක්
36. දුනුවිල විද්‍යාලයට ගොඩනැගිල්ලක්
37. කිතුල්ගොල්ල විද්‍යාලයට ගොඩනැගිල්ලක්
38. විලානේගම විද්‍යාලයට ගොඩනැගිල්ලක්
39. යහලතැන්න විද්‍යාලයට ක්‍රීඩා භූමියක්
40. දුනුවිල විද්‍යාලයට ගුරු නිවාසයක්
41. නුගවෙල මධ්‍ය විද්‍යාලයට ගුරු නිවාසයක්
42. ඉහගම විද්‍යාලයට ගුරු නිවාසයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෙම යෝජනා සියල්ලක්ම මහනුවර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරක සභා අනුමතියට ඉදිරිපත් කර තිබේ. නමුත් තවම අනුමතිය ලැබී නැත.

| | | |
|---|---|---|
| (ආ) 1. | රණවන-පල්ලෙබොකලවෙල සිංහ ශ්‍රමදාන පාර ... | අකුරණ 1 වැනි මන්ත්‍රීතුමාගේ යොජනාවකි |
| 2. | කැටපිටැල්ල පාර ... | එම |
| 3. | කහවත්ත ගමට කුරුගොඩ ඔයෙන් පාලමක් තැනීම | එම |
| 4. | නීරැල්ල-පිහාඔය පාර—සැ. ½ක් ගල් අතුරා තාර දැමීම | අකුරණ 2 වැනි මන්ත්‍රීතුමාගේ යොජනාවකි |
| 5. | වැරැල්ලගම-දික්කුඹුර පාර—2 වැනි සැතපුම ½ සෑදීම | එම |
| 6. | බෝතොට පාර—සැ. ½ක් ගල් අතුරා තාර දැමීම ... | එම |
| 7. | උඩමුල්ල-උග්ගල්ල පාර—සැ. ½ පස්වැඩ ... | එම |
| 8. | අංකුඹුර-පල්ලේගම-උඩගම පාර ... | අකුරණ 1 වැනි හා 2 වැනි මන්ත්‍රීවරුන්ගේ යෝජනාවකි |
| 9. | කොණකලගල-ගල්ඒදණ්ඩ-රතුකොහො පාර ... | අකුරණ 1 වැනි මන්ත්‍රීතුමාගේ යෝජනාවකි |
| 10. | අලදෙනියේ සිට බෙරගම පාසල අසලින් බලවත්ගොඩ දක්වා විහිදී ඇති පාර | එම |
| 11. | වතුවල-හුන්නන්ඔය පාරේ පාලම බැඳීම ... | එම |
| 12. | දිප්පිටිය-පතඹරගොල්ල පාර ... | එම |
| 13. | මාලගම්මන-දඩෝගම පාර ... | එම |
| 14. | දෙහිගම-ගොඩමුදුන පාර—කහවතුගොඩ හරහා ... | අකුරණ 2 වැනි මන්ත්‍රීතුමාගේ යෝජනාවකි |
| 15. | දෙහිගම-ඉඹිම්පිටිය පාර ... | එම |
| 16. | රාමකොටුව-වැල්ගාල පාර ... | එම |
| 17. | අංගස්තලාව-රැනකෙටුගල පාර ... | එම |
| 18. | ගොඩහේන මාතෘ නිවාසය ... | අකුරණ 1 වැනි මන්ත්‍රීතුමාගේ යෝජනාවකි |
| 19. | දූල්වල ජල යෝජනා ක්‍රමය ... | එම |
| 20. | යටිහෙලගල-උඩගම ජල යෝජනා ක්‍රමය ... | එම |
| 21. | යටිහෙලගල-පල්ලේගම ජල යෝජනා ක්‍රමය ... | එම |
| 22. | කිතුල්ගොල්ල-මාරාවිල ජනපද යෝජනා ක්‍රමය ... | එම |
| 23. | ඉනිගල ගමට පොදු ළිං දෙකක් ... | එම |
| 24. | අලවතුගොඩ විද්‍යාලයට විද්‍යාගාරයක් ... | එම |
| 25. | පැලව විද්‍යාලයට විද්‍යාගාරයක් ... | එම |
| 26. | පූජාපිටිය විද්‍යාලයට විද්‍යාගාරයක් ... | එම |
| 27. | හරංකහව විද්‍යාලයට ගොඩනැගිල්ලක් ... | එම |
| 28. | අංකුඹුර විද්‍යාලයට විද්‍යාගාරයක් ... | එම |
| 29. | මැදවල විද්‍යාලයට විද්‍යාගාරයක් ... | එම |
| 30. | අකුරණ විද්‍යාලයට ගොඩනැගිල්ලක් ... | අකුරණ 2 වැනි මන්ත්‍රීතුමාගේ යෝජනාවකි |
| 31. | අංකුඹුර විද්‍යාලයට ගොඩනැගිල්ලක් ... | එම |
| 32. | යටිහෙලගල පල්ලේගම විද්‍යාලයට ගොඩනැගිල්ලක් | එම |
| 33. | රඹුකේවෙල මුස්ලිම් විද්‍යාලයට ගොඩනැගිල්ලක් ... | එම |
| 34. | බුලුගොහොතැන්න මුස්ලිම් විද්‍යාලයට ගොඩනැගිල්ලක් | එම |
| 35. | ගොහාගොඩ විද්‍යාලයට ගොඩනැගිල්ලක් ... | එම |
| 36. | දුනුවිල විද්‍යාලයට ගොඩනැගිල්ලක් ... | එම |
| 37. | කිතුල්ගොල්ල විද්‍යාලයට ගොඩනැගිල්ලක් ... | එම |
| 38. | විලානේගම විද්‍යාලයට ගොඩනැගිල්ලක් ... | එම |
| 39. | යහලෙතැන්න විද්‍යාලයට ක්‍රීඩා භූමියක් ... | එම |
| 40. | දුනුවිල විද්‍යාලයට ගුරු නිවාසයක් ... | එම |
| 41. | නුගවෙල මධ්‍ය විද්‍යාලයට ගුරු නිවාසයක් ... | එම |
| 42. | ඉහගම විද්‍යාලයට ගුරු නිවාසයක් ... | එම |

අකුරණ පළමුවන පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා විසින් වැඩ යෝජනා 20ක් ද, අකුරණ දෙවන පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා විසින් වැඩ යෝජනා 21 ක් ද, ඉදිරිපත් කර ඇති අතර, එක් වැඩ යෝජනාවක් මන්ත්‍රීවරුන් දෙදෙනා විසින්ම ඉදිරිපත් කර ඇත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ඉ) මේ වැඩ යෝජනා සියල්ලම සඳහා අදාල දෙපාර්තමේන්තුවලින් ඇස්තමේන්තු කැඳවා තිබේ. ඒවායින් දැනට ඇස්තමේන්තු ලැබී ඇත්තේ පහත සඳහන් මාර්ග වැඩ සඳහා පමණි.

| | | | | රු. |
|---|---|---|---|---|
| අංක 2—කැටපිටැල්ල පාර—ඇස්තමේන්තු මුදල | ... | ... | ... | 58,500 |
| අංක 12—දිප්පිටිය පතඹරගොල්ල පාර—ඇස්තමේන්තු මුදල | | ... | ... | 38,000 |
| අංක 13—මාලගම්මන-දඩෝගම පාර—ඇස්තමේන්තු මුදල | | ... | ... | 27,000 |

මේ ඇස්තමේන්තු පිළිබඳ මූලික වැඩ කටයුතු කරගෙන යේ. අනිකුත් වැඩ සඳහා ඇස්තමේන්තු ලැබෙන තුරු ඒවායේ ඇස්තමේන්තු මුදල කිව නොහැකිය.

(ඊ) එක් එක් වැඩය සඳහා 1968–69 වර්ෂයේ වෙන්කරන මුදල් ප්‍රමාණයන් දැන්ම කිව නොහැක. ඇස්තමේන්තු අනුමතකර වැඩ ආරම්භ කරනවිටදී ඒ ගැන තීරණය කළ යුතුවේ.

(උ) ඉහත (අ) සහ (ඉ) හි සඳහන් මූලික වැඩ කර තිබේ.

**(அ) க. சி. க. திணைக்களத்தின் நிதியுடன் பொ. வே. தி. மூலம் செய்ய உத்தேசித்திருக்கும் வேலைகள்**

1. றன்வான—பள்ளே பொக்கலவல சிங்க சிரமதான வீதி.
2. கதபித்தல்ல வீதி.
3. குருகொட ஓயவின் மேல் ககவத்தைக்கு பாலம் அமைத்தல்.
4. நீரெல்ல—பீங்க ஓய வீதி. ½ மைலுக்கு கல்லும் தாரும் போடுதல்.
5. வரல்லகம—திக்கும்புற வீதி. இரண்டாவது ½ மைல் அமைத்தல்.
6. பொத்தொட வீதி. ½ மைலுக்கு கல்லும் தாரும் போடுதல்.
7. உடமுல்ல—உக்கல்ல வீதி. ½ மைலுக்கு நில வேலை.
8. அங்கும்புற—பள்ளேகம—உடகம வீதி.

**க. சி. க. திணைக்களத்தின் நிதியுடன் உள்ளூராட்சி தாபனங்களின் மூலம் செய்ய உத்தேசித் திருக்கும் வேலைகள்**

9. கோனுகலகல—கலேதந்த—றத்துகொஹொ வீதி.
10. பெறகம—பாடசாலே ஊடாக அலதெனியவிலிருந்து வலவத்கொடவிற்குப் போகும் வீதி.
11. வத்துவல—குன்னன் வீதியில் பாலம் அமைத்தல்.
12. திப்பிட்டி—பத்தம்பறகொல்ல வீதி.
13. மலகம்மன—தடொகம வீதி.
14. ககவத்துகொட ஊடாக தெஹிகம—கொடமுதுன வீதி.
15. தெஹிகம—இதம்பிட்டி வீதி.
16. ருமகொட்டுவ—வல்கல வீதி.
17. அங்கஸ்தலாவ—றெண்கேத்துகல வீதி.

**உத்தேசிக்கப்பட்டிருக்கும் வைத்திய கட்டங்கள்**

18. கொடகென பிரசவ விடுதி.

**உத்தேசிக்கப்பட்டிருக்கும் நீர் விநியோகத் திட்டங்கள்**

19. துல்வல நீர் விநியோகத் திட்டம்.
20. யட்டிகெலகல—உடகம நீர்விநியோகத் திட்டம்.
21. யட்டிகெலகல—பள்ளேகம நீர்விநியோகத் திட்டம்.
22. சித்துல்கொல்ல—பள்ளேகம நீர்விநியோகத் திட்டம்.
23. இனிகல்ல கிராமத்திற்கு இரு பொதுக் கிணறுகள்.

**உத்தேசிக்கப்பட்டிருக்கும் பாடசாலை வேலைகள்.**

24. அளுவத்துகொட வித்தியாலயம்—விஞ்ஞான ஆய்வுகூடம்.
25. பளவ வித்தியாலயம் ஷை
26. புஜபிட்டிய வித்தியாலயம் ஷை
27. கறங்ககவ வித்தியாலயம்—பாடசாலைக் கட்டடம்.
28. அங்கும்புற வித்தியாலயம்—விஞ்ஞான ஆய்வுகூடம்.
29. மெதவெல வித்தியாலயம்— ஷை
30. அக்குறன வித்தியாலயம்—பாடசாலைக் கட்டிடம்.
31. அங்கும்புற வித்தியாலயம்— ஷை
32. யட்டிகெல்கல—பள்ளேகம வித்தியாலயம்—பாடசாலைக் கட்டிடம்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| | |
|---|---|
| 33. நம்புக்கவெல முஸ்லிம் வித்தியாலயம் | பாடசாலைக் கட்டடம் |
| 34. புளுகொகொதென்ன ஷை | ஷை |
| 35. கொரகொட வித்தியாலயம் | ஷை |
| 36. துனுவில வித்தியாலயம் | ஷை |
| 37. சித்துல்கொல்ல வித்தியாலயம் | ஷை |
| 38. விளானேகம வித்தியாலயம் | ஷை |

39. யகல்தென்ன வித்தியாலயம்—விளையாட்டு மைதானம்.
40. துனுவில வித்தியாலயம்—ஆசிரியர் விடுதி.
41. நுகவெல மத்திய வித்தியாலயம்—ஆசிரியர் விடுதி.
42. இககம வித்தியாலயம்—ஆசிரியர் விடுதி.

இவ்வுத்தேச வேலைகள் யாவும் மாவட்ட இணைப்புச் சபையின் அநுமதிக்காக சமர்ப்பிக்கப் பட்டிருக்கின்றது. ஆனால் இதுவரையும் அநுமதி கிடைக்கவில்லை.

(ஆ)

| | | |
|---|---|---|
| 1. | நனவானே பள்ளே பொக்கவெல சிங்க சிரமதான வீதி | அக்குறணையின் 1 வது பா. உ. வின் பிரேரணை |
| 2. | கதபித்தல்ல வீதி .. .. .. | ஷை |
| 3. | குருகொட ஓயவின் மேல் ககவத்தைக்குப் பாலம் அமைத்தல் | ஷை |
| 4. | நீரெல்ல பீங்க ஓய வீதி—½ மைலுக்கு கல்லும் தாரும் போடுதல் | ஷை |
| 5. | வரல்லகம—திக்கும்புற வீதி—இரண்டாவது ½ மைல் அமைத்தல் | அக்குறணையில் 2 வது பா. உ. வின் பிரேரணை |
| 6. | பொத்தொட வீதி—½ மைலுக்குக் கல்லும் தாரும் போடுதல் | ஷை |
| 7. | உடமுல்ல—உக்கல வீதி ½ மைலுக்கு நில வேலை .. | ஷை |
| 8. | அங்கும்புற—பள்ளேகம—உடகம வீதி .. .. | அக்குறணையின் இரு பா. உறுப்பினர்களாலும் பிரேரிக்கப் பட்டது. |
| 9. | கோணகலகல—கலேதந்த—றத்துகொஹொ வீதி .. | அக்குறணையின் 1 வது பா. உ. வின் பிரேரணை |
| 10. | பெறகம பாடசாலை ஊடாக அலதெனியவிலிருந்து வலவத்கொடவிற்கு போகும் வீதி | ஷை |
| 11. | வத்துவல—குன்னன் ஓய வீதிக்குப் பாலம் அமைத்தல் | ஷை |
| 12. | திப்பிட்டி—பத்தம்பறகொல்ல வீதி .. .. | ஷை |
| 13. | மலகம்மன—தடொகம வீதி .. .. | ஷை |
| 14. | ககவத்துகொட ஊடாக தெகிகம—கொடமுதுண வீதி .. | அக்குறணையின் 2 வது பா. உ. வின் பிரேரணை |
| 15. | தெகிகம—இதம்பிட்டி வீதி .. .. | ஷை |
| 16. | ருமகெஆட்டுவ—வல்கல வீதி .. .. | ஷை |
| 17. | அங்கஸ்தலாவ—றென்கெத்துகல வீதி .. | ஷை |
| 18. | கெமடகென பிரசவ விடுதி .. .. | அக்குறணையின் 1 வது பா. உ. வின் பிரேரணை |
| 19. | துல்வல நீர் விநியோகத் திட்டம் .. .. | ஷை |
| 20. | யட்டிகெலகல—உடகம நீர் விநியோகத் திட்டம் .. | ஷை |
| 21. | யட்டிகெலகல—பள்ளேகம நீர் விநியோகத் திட்டம் .. | ஷை |
| 22. | சித்துல்கொல்ல—பள்ளேகம நீர் விநியோகத் திட்டம் .. | ஷை |
| 23. | இனிகல்ல கிராமத்திற்கு இரு பொதுக் கிணறுகள் .. | ஷை |
| 24. | அளுவத்துகொட வித்தியாலயம்—விஞ்ஞான ஆய்வுகூடம் | ஷை |
| 25. | பளவ வித்தியாலயம் .. .. .. | ஷை |
| 26. | புஜபிட்டி வித்தியாலயம் .. .. | ஷை |
| 27. | கறங்ககவ வித்தியாலயம்—பாடசாலைக் கட்டிடம் .. | ஷை |
| 28. | அங்கும்புற வித்தியாலயம்—விஞ்ஞான ஆய்வுகூடம் .. | ஷை |
| 29. | மெதவெல வித்தியாலயம்— ஷை .. | ஷை |
| 30. | அக்குறணை வித்தியாலயம்—பாடசாலைக் கட்டிடம் .. | அக்குறணையின் 2 வது பா. உ. வின் பிரேரணை |
| 31. | அக்கும்புற வித்தியாலயம்—பாடசாலைக் கட்டிடம் .. | ஷை |
| 32. | யட்டிகெல்கல—பள்ளேகம வித்தியாலயம்—பாடசாலைக் கட்டிடம் | ஷை |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| | | |
|---|---|---|
| 33. | றம்புக்கவெல முஸ்லிம் வித்தியாலயம் பாடசாலைக் கட்டிடம் | அக்குறணை 2 வது பா. உ. வின் பிரேரணை |
| 34. | புளுகொகொதென்ன முஸ்லிம் வித்தியாலயம் பாடசாலைக் கட்டிடம் | ஷெ |
| 35. | கொககொட வித்தியாலயம் பாடசலைக் கட்டிடம் .. | ஷெ |
| 36. | துனுவில வித்தியாலயம் பாடசாலைக் கட்டிடம் .. | ஷெ |
| 37. | கித்துல்கொல்ல வித்தியாலயம் பாடசாலைக் கட்டிடம் .. | ஷெ |
| 38. | விளாவேகம வித்தியாலயம் பாடசாலைக் கட்டிடம் .. | ஷெ |
| 39. | யகல்தென்ன வித்தியாலயம் விளையாட்டு மைதானம் .. | ஷெ |
| 40. | துனுவில வித்தியாலயம் ஆசிரியர் விடுதி .. | ஷெ |
| 41. | நுகவெல மத்திய வித்தியாலயம் ஷெ .. | ஷெ |
| 42. | இககம வித்தியாலயம் ஷெ .. | ஷெ |

அக்குறணையின் முதலாவது பாராளுமன்ற உறுப்பினரால் 20 விசயங்கள் பிரேரிக்கப்பட்டிருக்கின்றது. அக்குறணையின் 2 வது பாராளுமன்ற உறுப்பினரால் 21 விடயங்கள் பிரேரிக்கப்பட்டிருக்கின்றது. ஒரு விசயம் இரு உறுப்பினர்களாலும் பிரேரிக்கப்பட்டிருக்கின்றது.

(இ) இப்பிரேரணைகள் யாவும் சம்பந்தமாகக் குறிக்கப்பட்ட திணைக்களங்களில் இருந்து மதிப்பீடுகள் கோரப்பட்டிருக்கின்றன. இப்பிரேரணைகளில் பின்வரும் வீதிகளுக்குமட்டுமே மதிப்பீடு கிடைத்திருக்கின்றது.

விசய இல. 2—கதபித்தல வீதி —மதிப்பிடப்பட்ட தொகை ரூ. 58,500

விசய இல. 12—திப்பிட்டி–பத்தம்–பறகொல்ல வீதி —மதிப்பிடப்பட்ட தொகை ரூ. 38,000

விசய இல. 13—மலகம்மன–தடொகம வீதி —மதிப்பிடப்பட்ட தொகை ரூ. 27,000

இம் மதிப்பீடுகளையிட்டு ஆரம்ப நடவடிக்கைகள் யாவும் எடுக்கப் பட்டிருக்கின்றன. மதிப்பீடுகள் கிடைக்கும் வரைக்கும் ஏனைய விடயங்களில் மதிப்பீடு கொடுக்க இயலாது.

(ஈ) தற்பொழுது இவ்வேலைகளுக்காக 1968–69ல் எவ்வளவு பணம் ஒதுக்கப்படும் என்பதனைக் கூற முடியாது. வேலைகள் ஆரம்பித்ததன் பின்னரும் மதிப்பீடுகள் அநுமதிக்கப்பட்டதன் பின்னருமே இதனைத் தீர்மானிக்க முடியும்.

(உ) (அ) மற்றும் (இ) யில் கூறியவற்றின் ஆரம்ப நடவடிக்கைகள் எடுக்கப்பட்டுவிட்டன.

(*a*) *Proposed road construction works to be carried out through the P.W.D. with K.P.C. funds.*

1. Ranawana—Palle Bokalawela Sinha Sramadana road.
2. Ketapitalla road.
3. Construction of bridge over Kurugoda-oya, to Kahawatta.
4. Neerella-Pinga Oya road. Metalling and tarring half mile.
5. Werallagama-Dikkumbura road. Construction of 2nd half mile.
6. Botota road. Metalling and tarring half mile.
7. Udamulla-Uggalla road. Half mile earth-work.
8. Ankumbura-Pallegama—Udagama road.

*Proposed road construction works to be carried out through Local Govt. Institutions with K.P.C. funds.*

9. Konakalagala-Galedanda-Ratukoho road.
10. Road running from Aladeniya to Balawathgoda *via* Beragama school.
11. Construction of bridge on Watuwala-Hunnanoya road.
12. Dippitiya-Pathambaragolla road.
13. Malagammana-Dadogama road.
14. Dehigama-Godamuduna road *via* Kahawatugoda.
15. Dehigama-Idamptitiya road.
16. Ramakotuwa-Weligala road.
17. Angastalawa-Renaketugala road.

*Proposed medical buildings*

18. Godahena Maternity Home.

*Proposed water supply schemes*

19. Dulwala Water Supply Scheme.
20. Yatihelagala-Udagama Scheme.
21. Yatihelagala-Pallegama Scheme.
22. Kitulgolla-Marawila V. E. Scheme.
23. Two common wells to Inigala village.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

*Proposed school works*

24. Alawatugoda Vidyalaya—Science Laboratary.
25. Pelawa Vidyalaya—Science Laboratary.
26. Pujapitiya Vidyalaya—Science Laboratary.
27. Harankahawa Vidyalaya—School building.
28. Ankumbura Vidyalaya—Science Laboratary.
29. Medawala Vidyalaya—Science Laboratary.
30. Akurana Vidyalaya—School Building.
31. Ankumbura Vidyalaya—School Building.
32. Yatihelagala-Pallegama Vidyalaya—School building.
33. Rambukewela Muslim Vidyalaya—School building.
34. Bulugohotenna Muslim Vidyalaya—School building.
35. Gohagoda Vidyalaya—School building.
36. Dunuwila Vidyalaya—School building.
37. Kitulgolla Vidyalaya—School building.
38. Vilanegama Vidyalaya—School building.
39. Yahaletenna Vidyalaya—Play Ground.
40. Dunuwila Vidyalaya—Teacher's Quarters.
41. Nugawela Central College—Teacher's Quarters.
42. Ihagama Vidyalaya—Teacher's Quarters.

All these proposals have been submitted for D.C.C. approval. But approval has not been granted yet.

| | | | |
|---|---|---|---|
| (b) | 1. | Ranawana-Palle Bokalawela Sinha Sramadana road | Proposal of 1st M.P., Akurana |
| | 2. | Ketapitalla road .. .. | do. |
| | 3. | Construction of bridge over Kurugoda to Kahawatta | do. |
| | 4. | Neerella-Pingaoya road. Metalling and tarring Half-mile | Proposal of 2nd M.P., Akurana |
| | 5. | Werallagama-Dikkumbura road. Construction of second half-mile | do. |
| | 6. | Botota road. Metalling and tarring half-mile | do. |
| | 7. | Udamulla-Uggalla road. Earth work half-mile | do. |
| | 8. | Ankumbura-Pallegama-Udagama road. .. | Proposal of both M.PP., Akurana |
| | 9. | Konakalagala-Galedanda-Ratukoho road | Proposal of 1st. M.P., Akurana |
| | 10. | Road running from Aladeniya to Balawathgoda *via* Beragama School | do. |
| | 11. | Construction of bridge on Watuwala-Hunnan-oya road | Proposal of 1st M.P., Akurana |
| | 12. | Dippitiya-Pathambaragolla road .. | do. |
| | 13. | Malagammana-Dadogama road .. | do. |
| | 14. | Dehigama-Godamuduna road *via* Kahawatugoda | Proposal of 2nd M.P., Akurana |
| | 15. | Dehigama-Idampitiya road .. | do. |
| | 16. | Ramakotuwa-Welgala road .. | do. |
| | 17. | Angastalawa-Renaketugala road .. | do. |
| | 18. | Godahena-Maternity Home .. | Proposal of 1st. M.P., Akurana |
| | 19. | Dulwala Water Supply Scheme .. | do. |
| | 20. | Yatihelagala-Udagama Scheme .. | do. |
| | 21. | Yatihelagala-Pallegama Scheme .. | do. |
| | 22. | Kitulgolla-Marawila V. E. Scheme .. | do. |
| | 23. | Two common wells to Inigala village .. | do. |
| | 24. | Alawatugoda Vidyalaya—Science Laboratary | do. |
| | 25. | Pelawa Vidyalaya—Science Laboratary .. | do. |
| | 26. | Pujapitiya Vidyalaya—Science Laboratary .. | do. |
| | 27. | Harankahawa Vidyalaya—School Building | do. |
| | 28. | Ankumbura Vidyalaya—Science Laboratary | do. |
| | 29. | Medawala Vidyalaya—Science Labratary .. | do. |
| | 30. | Akurana Vidyalaya—School Building .. | Proposal of 2nd M.P., Akurana |
| | 31. | Ankumbura Vidyalaya—School Building .. | do. |
| | 32. | Yatihelagala-Pallegama Vidyalaya School Building | do. |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| | | |
|---|---|---|
| 33. | Rambukewela Muslim Vidyalaya—School building | Proposal of 2nd M.P. Akurana |
| 34. | Bulugohotenna Muslim Vidyalaya—School Building | do. |
| 35. | Gohagoda Vidyalaya—School Building .. | do. |
| 36. | Dunuwila Vidyalaya—School Building .. | do. |
| 37. | Kitulgolla Vidyalaya—School Vidyalaya .. | do. |
| 38. | Vilanegama Vidyalaya—School Building .. | do. |
| 39. | Yahaletenna Vidyalaya—Paly ground .. | do. |
| 40. | Dunuwila Vidyalaya—Teacher's Quarters .. | do. |
| 41. | Nugawela Central College—Teacher's Quarters | do. |
| 42. | Ihagama Vidyalaya—Teacher's Quarters .. | do. |

Twenty items of work have been proposed by the first M.P. for Akurana, and 21 items by the second M.P. for Akurana. One item of work was proposed by both M.PP.

(c) Estimates have been called for, from the respective departments, in respect of all these proposals. Of these proposals, estimates have been received so far only in respect of the following roads :—

| | Rs. | c. |
|---|---|---|
| Item No. 2—Ketapitalla road—Estimated cost .. | 58,500 | 0 |
| Item No. 12—Dippitiya-Pathambaragolla road—Estimated cost | 38,000 | 0 |
| Item No. 13—Malagammana-Dadogama Road—Estimated cost | 27,000 | 0 |

Preliminary steps are being taken in respect of these estimates. Estimated cost of the other items cannot be given until the estimates are received.

(d) The amounts of money to be allocated in 1968–69, for each of these works cannot be stated now. This should be decided only after the approval of the estimates and after commencement of work. (e) Preliminary action referred to in (a) and (c) above has been taken.

## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම්

சபை அமர்வு

## SITTINGS OF THE HOUSE

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I move,

"That this House at its rising this day do adjourn until 10 a.m. on Sunday, 23rd March 1969."

This arrangement was agreed to yesterday.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## ලංකා විදුලි බල මණ්ඩල පනත් කෙටුම්පත

*இலங்கை மின்சார சபை மசோதா*

## CEYLON ELECTRICITY BOARD BILL

කල් තබන ලද විවාදය නව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [මාර්තු 20.]

"කෙටුම්පත් පණත දැන් දෙවන වර කියවිය යුතුය."—[ගරු සී. පී. ද සිල්වා.]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

மார்ச் 20 ஆம் தேதிய வினா மீதான ஒத்திவைக்கப்பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

"மசோதா இப்பொழுது இரண்டாம் முறை மதிப்பிக்கப்படுமாக" [கௌரவ சி. பீ. டி சில்வா.]

வினா, மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Order read for resuming Adjourned Debate on Question—[20th March.]*

"That the Bill be now read a Second time".—[The Hon. C. P. de Silva.]

*Question again proposed.*

අ. භා. 2.22

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ගරු කථානායකතුමනි, විදුලි බල දෙපාර්තමේන්තුව සංස්ථාවක් බවට පත් කිරීම පිළිබඳ විවාදය පවත්වන මේ අවස්ථාව ඇත්ත වශයෙන්ම විදුලි බලය පරිහාණියට ගිය අවස්ථාවක් බව තමුන්නාන්සේ දන්නවා. විදුලි බලය අද මේ රටේ මහජනයාට හරියාකාරව ලැබෙන්නේ නැහැ. ඒ නිසයි මා ඒ ආකාරයට සඳහන් කෙළේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ රටේ අද පවතින විදුලි බලය පිළිබඳ හිඟයට වගකිවයුත්තා කවුද? මේ රටේ අද විදුලි බලය හිඟ වීමට වගකිවයුත්තේ මේ රටට ලැබෙන ස්වාභාවික වර්ෂාපතනය වත් විදුලි බලය නිපදවන ජලාශවත් නොවෙයි. එහෙම නම් ඒ සම්බන්ධයෙන් වගකිවයුත්තේ කවුද? මෙහි වරද තිබෙන්නේ විදුලි බලය පිළිබඳ ගරු ඇමතිතුමා කෙරෙහි බවයි මට නම් දැන් ප්‍රකාශ කරන්නට සිද්ධ වෙලා තියෙන්නේ. ඊයේ "ඔබ්සර්වර්" පත්‍රයේ සඳහන් වැදගත් කරුණක් ගැන ඔබ තුමාට මතක් කරන්නට කැමතියි. එහි ශීර්ෂ පාඨය වශයෙන් පළ කර තිබුණේ කොහොමද? විදුලි බල දෙපාර්තමේන්තුව ගරු ඇමතිතුමාට මීට කලකට පෙර උප දෙස් වශයෙන් කියා තිබුණාලු වර්තමාන තත්ත්වයෙන්ම තව දුරටත් ටිකකාලයක් විදුලි බලය බෙදා හැරීම කරගෙන ගියොත් වැඩි කලක් යන්නට ඉස්සර වෙලා—ඒ කියන්නේ 1969-70 වන විට—විදුලි බලය සපයන්නට විදුලි දෙපාර්තමේන්තු වට ශක්තියක් නැති වන බව. මේ පත්‍රය වුවමනා නම් ගරු ඇමතිතුමාට මම දෙන්නම්.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ගරු කථානායකතුමනි, කිලවට් 90,000ක් නිපදවන්නට ශක්තිය තිබෙන මස්කෙළිය පළමුවැනි පියවරේ වැඩ කරන්නට පටන් ගන්නේ මේ අවුරුද්දේ. ඒ නිසා හිඟයක් ඇති වන්නට බැහැ. 1969 අවසන් වීමට තවත් මාස කිහිපයක් තිබෙනවා. ළඟදී ඉවර කරන්නට පුළුවන් වේවි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

තමුන්නාන්සේ ගණන් ඉදිරිපත් කරන්නට ගියාම කථා කරන්නේ අනූ දාස්වලින්, ලක්ෂවලින්, දශලක්ෂවලින් සහ කෝටි වලිනුයි. ඒ කොයි හැටි වෙතත්, දවසකට පැය පහක් හයක් දාඩිය පිස පිස ඉන්නටත්, කළුවරේම ඉන්නටත් මේ උෂ්ණ පළාත්වල අපට සිද්ධ වෙලා තිබෙනවා. එපමණක් නො වෙයි, නුවරඑළිය වාගේ ප්‍රදේශවලට දහ වලට විදුලි බලය ටිකක් අඩු වුණොට එපමණ හානියක් සිදු වන්නේ නැහැ. රාත්‍රියට විදුලි බලය නැති වුණොත් පම ණයි ඒ ප්‍රදේශවාසීන්ට හානියක් සිදු වන්නේ. ගරු ඇමතිතුමා ඉදිරිපත් කරන සංඛ්‍යා ලේඛනවල මොනවා තිබුණත් මෙම "ඔබ්සර්වර්" පත්‍රය කියනවා, අමාත්‍යාංශයේ තිබෙන දුර්වලකම් නිසා, නොසැලකිල්ල නිසා, උනන්දුවක් නැති කම නිසා, ඇලිමැලි දුබල ගතිය නිසා විදුලි බල දෙපාර්තමේන්තුවෙ උපදෙස් නොපිළිගත් නිසා ගරු ඇමතිතුමාට අද මේ තත්ත්වයට මුහුණ පාන්න සිද්ධ වී තිබෙනවාය කියා. නෝටන් බ්‍රිජ් ජල විදුලි බල මධ්‍යස්ථානයේ ජලය හිඟකම නිසා විදුලි බලය සැපයීම මේ තත්ත්වයට පත් වුණායයි ගරු ඇමතිතුමා කියනවා නම් එය අසත්‍යයක් බව, එදා සභාග රජය අත්හැර අනික් පැත්තට ගොස් වාඩි වී, එතුමා විසින් ආරක්ෂා කර ගැනීමට උත්සාහ කරනු ලැබූ ලේක්හවුස් ආයතනයේ පත්‍රවලින්ම අද කියනවා. එහෙමනම් ඇත්ත මොකක්ද කියා අප දැනගන්න කැමතියි. තමුන්නාන්සේ මෙම වාර්තාව මෙතෙක් කියවූයේ නැති නම් දැන්වත් කියවා බලන්න. ගරු ඇමති තුමාගේ දුර්වලතාව උඩයි—

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

වෙන මොනවාද ඇමතිතුමා ගැන පත්‍රයේ කියා තිබෙන්නෙ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

තමුන්නාන්සේ අහන හැම ප්‍රශ්නය කටම උත්තර දෙන්න මා ලැහැස්ති නැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

පත්‍රයේ දෙවන පිටුව බලන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
තමුන්නාන්සේට ඕනෑ නම් පත්‍රය අර ගෙන කියවන්න. සමහර විට තමුන්නාන් සේ කල්පනා කරනවා ඇති මට මෙය කිය වන්න බැරිය කියා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
ඒකයි තමුන්නාන්සෙගේ අදහස. චේත නාව හරි නැහැ, තමුන්නාන්සේගෙ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
නැහැ, නැහැ. ඒකෙ කියා තිබෙනවා—

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
මට ඕනෑකමක් නැහැ, තමුන්නාන්සේ කියන හැම දෙයක්ම කියවන්න. මට වුව මනා දේවල් පමණයි මා කියවන්නෙ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
ගරු සභාවෙ දැනගැනීම සඳහායි කියවන් නට යයි කීවේ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
මා කියවන්න ලැහැස්ති නැහැ, තමුන් නාන්සේගේ චේතනාව හරි නැති නිසා. [බාධා කිරීමක්]

මගේ කථාවට වුවමනා කරන කොටස පමණයි මා කියවන්නෙ. වුවමනා කොටස මා ඉදිරිපත් කළා. තවත් කාට හරි වුවමනා නම්, මාතර මන්ත්‍රීතුමාට (බී. වයි. තුඩාවේ මයා.) වුවමනා නම්, ගරු කථානායකතුමාට වුවමනා නම් කියවන්න මෙම පත්‍රය දෙන්න පුළුවනි. කෙසේ හෝ වේවා, ගරු ඇමතිතුමාගේ ක්‍රියා කලාපය නිසා, දුර්වල තාවය නිසා විදුලි බලය අපට නැති වී තිබෙනවාය කියා කෙළින්ම මා ප්‍රකාශ කරන්න කැමතියි. ගරු කථානායකතුමනි, මේ රටේ දේශපාලන කටයුතුවල නිරතව සිටින, සාමාන්‍ය මහජනතාවගේ නියෝජිත යන් හැටියට අපට නොයෙකුත් ප්‍රශ්න වලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. මෙම විදුලි බලය පිළිබඳ ප්‍රශ්නය පමණක් නො වෙයි, නොයෙකුත් ප්‍රශ්නවලට මුහුණ පාන්න සිද්ධවෙනවා. ශ්‍රේෂ්ඨාධි කරණයෙ හෝ වේවා, පාර්ලිමේන් තුවෙ හෝ වේවා, මේ රටේ තිබෙන උසස් යයි සම්මත ඕනෑම ආයතන යක හෝ වේවා, අප කථා කරන්න ගියාම, මේ රටේ සාමාන්‍ය මහජනතාවගේ නියෝ ජිතයන් හැටියට අප කථා කරන්න ගියාම, ටිකක් සොයා බලනවා රාජකීය විද්‍යාලයේ ද, සාන්ත තෝමස් විද්‍යාලයේද ඉගෙන ගෙන තිබෙන්නෙ, කුරුඳුවත්තේද ඉපිද තිබෙන්නෙ, නැතිනම් මේ රටේ උසස් යයි සම්මත පවුලකට සම්බන්ධකම් තිබෙන වාද කියා. අන්න එබඳු හැඟීමක් තිබෙන කාලයක තමුන්නාන්සේ කළ ප්‍රකාශය ගැන මට වැරදි හැඟීමක් ඇති වීම ගැන කරුණාකර සමාවන්න. මට එබඳු වැරදි හැඟීමක් ඇති වන්න පුළුවනි. මා කලින් සඳහන් කළ අන්දමේ වේදනාවකින් ජීවත් වන, මේ රටේ සාමාන්‍ය මහජනතාවගේ මන්ත්‍රීවරයකු හැටියට, තමුන්නාන්සේ කළ ප්‍රකාශයක් වැරදි ලෙස තේරුම් ගත් තොත් ඒ ගැන මා පිළිබඳව වැරදි හැඟී මක් ඇති කර ගන්න එපා. ඒ වාගේ සමාජයක් අද මේ රටේ තිබෙන්නෙ. මා කියන්නෙ නැහැ, වරදක් කළොත් ඒ වරද හරිය කියා. කොයි පැත්තෙන් කළත් වරද වරදමයි. ගරු කථානායකතුමනි, අද මේ රටේ පවතින තත්ත්වය මේකයි. එක් කෝ සිවිල් සේවකයකු වන්න ඕනෑ, එහෙම නැතිනම් කුරුඳුවත්තේ උපදීම ලබා තිබෙන්න ඕනෑ, එහෙම නැතිනම් ලොකු පවුලකට නෑකම් තිබෙන්න ඕනෑ, එහෙමත් නැත්නම් සාන්ත තෝමස් විද්‍යාලය හෝ රාජකීය විද්‍යාලය වැනි විද්‍යාලයක හෝ ඉගෙනීම ලබා තිබෙන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඔනෑ, එහෙම නැතිනම් සාමාන්‍ය මිනිසකුට මොන තරම් දක්ෂතාවත් තිබුණත් එම දක්ෂතාවන්ගෙන් රටට ප්‍රයෝජනයක් ලබා දෙන්න බැරි තත්ත්වයකට තවමත් සකස් වී තිබෙනවා.

**ගරු ඩී. පී. අතපත්තු (වැඩබලන රාජ්‍ය කටයුතු ඇමති)**
*(கௌரவ டீ. பீ. அத்தபத்து—பதில் இராஜாங்க அமைச்சர்)*
(The Hon. D. P. Atapattu—Acting Minister of State)
තමුන්නාන්සේ හිතන ඒ යුගය ඉවරයි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
ඒ යුගය තවම ඉවර නැහැ.

**ගරු අතපත්තු**
*(கௌரவ அத்தபத்து)*
(The Hon. Atapattu)
අප භය නැතුව කියනවා, ඒ යුගය ඉවරයි කියා. එහෙම නැතිනම් තමුන්නාන්සේටවත් මටවත් මෙතැන තැනක් නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
ඒක ඇත්ත. රාජ්‍ය ඇමතිතුමා පිටරට ගිය නිසා මිස නැතිනම් ඔතැන වාඩි වෙන්න තමුන්නාන්සේට ලැබෙන්නෙ නැහැ.

**ගරු අතපත්තු**
*(கௌரவ அத்தபத்து)*
(The Hon. Atapattu)
නොලැබුණොත් මට පසුපස ආසනයෙ සිටින්න පුළුවන් නොවැ. තමුන්නාන්සේට ඒ ගැන තිබෙන කැක්කුම මොකක්ද? විලිලැජ්ජා නැති කථා කියනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
තමුන්නාන්සේට ඔතැන සිටින්න හම්බු වෙන්නෙ නැති බවයි මා කීවෙ. මාත් ඔතැන සිටියා, මැදවච්චියෙ ගරු මන්ත්‍රීවරයා (මෛත්‍රීපාල සේනානායක මයා.) පිටරට ගිය වේලාවෙදී.

**ගරු අතපත්තු**
*(கௌரவ அத்தபத்து)*
(The Hon. Atapattu)
මම එපාය කිව්වයැ. අදහස්වල තිබෙන කැත කම නිසා—

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
මොකද කැත කතාය කියන්නෙ?

**ගරු අතපත්තු**
*(கௌரவ அத்தபத்து)*
(The Hon. Atapattu)
කැතකම නොවෙන්නම්. නැතිනම් එහෙම කියයිද?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
වැඩබලන ඇමතිවරයා කීවාම ඒකෙ තිබෙන කැතකම මොකක්ද?

**ගරු අතපත්තු**
*(கௌரவ அத்தபத்து)*
(The Hon. Atapattu)
ඇමතිතුමා නැති විට වැඩ බැලීම පිණිස මෙතැන වාඩිවෙන්න ලැබුණාය කියා අපහාස කරන්න මන්ත්‍රීතුමාට වටිනවාද?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
ඇමතිතුමා ඉන්නවා නම් තමුන්නාන්සේට ඔය ස්ථානයේ වාඩිවෙන්න බැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Order, Please.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
එය කැත කථාවක් නොවෙයි.

**ගරු අතපත්තු**
*(கௌரவ அத்தபத்து)*
(The Hon. Atapattu)
මට කතා කරන්න ඉඩ දෙනවා නම්—


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඇමතිවරයා පිටරට ගොස් සිටින නිසා තමුන්නාන්සේ ඔය ස්ථානයේ වාඩි වී සිටිනවා. එතුමා සිටිනවා නම් තමුන්නාන්සේට ඔය ආසනයේ වාඩි වී සිටින්න බැහැ. එය එක් වරක් නොවෙයි, 500 වරක් වුණත් මා කියනවා. රාජ්‍ය ඇමතිතුමා ඉන්නවා නම් තමුන්නාන්සෙට ඔතන වාඩි වෙන්න බැහැ.

**ගරු අතපත්තු**
*(கௌரவ அத்தபத்து)*
(The Hon. Atapattu)

වාඩිවෙන්න යුතුකමක් නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

එය යුතුකමක් නොවේය කියා තමුන්නාන්සේ පිළිගන්නවා නම් මා කැත කතාවක් කිව්වාය කියන්නේ කොහොමද ? ඒ නිසා එය ඉල්ලා අස් කර ගන්න.

**ගරු අතපත්තු**
*(கௌரவ அத்தபத்து)*
(The Hon. Atapattu)

තමුන්නාන්සේගේ අදහස හොඳ නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ගරු කථානායකතුමනි, විදුලි බලය ගැන කතා කරන විට හුඟ දෙනෙක් බලවේග ඇතුව කතා කරනවාය කියා සමහරුන් කල්පනා කරනවා විය හැකියි. නමුත් මා කතා කරන්නේ බලවේග නැතුවයි. එයට හේතුව මෙයයි. අපේ ගම්වලට විදුලි බලය ලබා දෙන්නය කියා විදුලි බල දෙපාර්තමේන්තුවට කොයි තරම් කියා සිටියත් අපට විදුලි බලය ලබා ගන්න පුළුවන් කමක් නැහැ. එවැනි දෙපාර්තමේන්තුව කුයි විදුලි බල දෙපාර්තමේන්තුව. නිල් දණ්ඩාහින්න, වතුමුල්ල, කුඹල්ගමුව, හරස්බැද්ද යන ස්ථානවලට විදුලි බලය ලාභ සහිතව ලබාදිය හැකි බව නුවර එළියේ විදුලි බල දෙපාර්තමේන්තුවේ අධිකාරී මහතෙකු විසින් විශේෂ වාර්තාවක් සපයා තිබෙනවා. නමුත් විදුලි බල දෙපාර්තමේන්තුව එය ප්‍රතික්ෂේප කර තිබෙනවා. එයට හේතුව මා විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වීමයි. ඒ ආසනයේ සිටින මන්ත්‍රීවරයා විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් නිසා විදුලි බලය සපයා දීමට විදුලි බල දෙපාර්තමේන්තුව සූදානම් නැහැ. එයින් කොයි තරම් ලාභයක් ලබා ගත හැකි වුණත් එය කර දෙන්න දෙපාර්තමේන්තුව සූදානම් නැහැ. නමුත් ගරු ඇමතිතුමාට යම්කිසි විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් පරාජය කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා එතුමාට මෙන්න මෙවැනි නියෝගයක් කරන්න පුළුවනි. පොළොන්නරුවේ අහවල් ගම් සභාවට අයත් ප්‍රදේශයට වහාම—මාස 3 ක් ඇතුළත විදුලි බලය ලබා දෙන්න කියා නියෝග කරන්න ඇමතිතුමාට පුළුවනි. "මට අවශ්‍ය වී තිබෙන්නේ පොළොන්නරුවේ මන්ත්‍රීතුමා පරාජය කරන්නයි; ඒ නිසා ඉක්මණින්ම ඒ පළාතට විදුලි බලය ලබා දීමට ක්‍රියා කරන්න." ඔන්න ඔය වගේ නියෝගයන් නම් ඇමතිතුමාට කරන්න පුළුවනි. ඇමතිවරයා කියන දේවල් කරන්න නිලධාරීන්ට සිදු වී තිබෙනවා. එපමණක් නොවෙයි, සමහර බලවත් රජයේ මන්ත්‍රීවරුන්ගේ වුව මනාවල් ඉටු කිරීමටත් විදුලි බල දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සිදු වී තිබෙනවා. අපේ යටිනුවර ආසනයේ මන්ත්‍රීතුමා (එස්. එස්. අබේසුන්දර මයා.) ආණ්ඩු පක්ෂයේ කෙනෙක් වුණත් එතුමා ඒ තරම් බලවත් කෙනෙක් නොවන නිසා එතුමාගේ ආසනයේ සමහර පාරිභෝගිකයින් විදුලි බලය ලබා ගැනීමට නොහැකිව නොයෙකුත් කරදර විඳිනවා. ඒ අය විදුලි බලය ලබා ගැනීම සඳහා රුපියල් 60 බැගින් විදුලි බල දෙපාර්තමේන්තුවට මුදල් ගෙවා දැනට අවුරුදු 3 ක් පමණ ගත වී තිබෙනවා. අද වන තෙක් ඔවුන්ට විදුලි බලය ලැබී නැහැ. එයට හේතුව ඒ ආසනයේ මන්ත්‍රීතුමා ඒ තරම් බලවත් කෙනෙක් නොවීමයි. මා දැන් අහනවා ඒ පුද්ගලයන් විසින් ගෙවන ලද රුපියල් 60 බැගින් වන මුදල පොළියත් සහිතව ආපසු ගෙවන්න තමුන්නාන්සේලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සූදානම්ද කියා. පොලියත් සමගම ආපසු ගෙවන්න ඕනෑ. නමුත් මේ ස්ථානයේ ඇමතිවරයෙක් නැති නිසා මේවාට පිළිතුරු දෙන්න කෙනෙක් නැහැ නේ. තමුන්නාන්සේත් සමග හැප්පීමෙන් මට කිසිම වැඩක් නැහැ. එහි කිසිම තේරුමක් නැහැ. මා දැන් තමුන්නාන්සේලාට මේ පත්‍රයේ තිබෙන කොටසක් කියවන්නම්. තමුන්නාන්සේලා නම් මේ "ඇත්ත" පත්‍රය පිළිගන්නේ නැහැ. මෙහි තිබෙන දේවල් නැත්තය කියා තමුන්නාන්සේලා කිව්වත් මේවා මේ ගරු සභාවේදී කියවන්න මට අයිතියක් තිබෙනවා. ඇත්ත වුණත් නැත්ත වුණත් මට කියවන්න අයිතියක් තිබෙනවා.

1960 මාර්තු 20 වැනි දින "ඇත්ත" පත්‍රයෙනුයි මා මේ කියවන්නෙ.

"මන්ත්‍රීගෙ බලපෑම නිසා හරියට වැඩ කරන්න බෑ.

උඩුනුවර (යූ. එන්. පී.) මන්ත්‍රීවරයාගේ අයුතු බලපෑම නිසා රජයේ විදුලි දෙපාර්තමේන්තුවට මහනුවර දිසාවේ වැඩ කටයුතු නිසියාකාර ගෙන යා නොහැකි තත්ත්වයක් එළැඹ ඇතැයි දිසාව බාර විදුලි ඉංජිනේරුවාත් ප්‍රධාන විදුලි අධිකාරීත් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත පැමිණිලි කොට ඇත."

මේවා බොරු නම් ඇමතිතුමා මේවාට පිළිතුරු දෙන්න. විදුලි අධිකාරීතුමා, විදුලි ඉංජිනේරුතුමා සහ ස්ථිර ලේකම්තුමා ඉන්නේ ඔය දෙපාර්තමේන්තුව ඇතුළේයි. නැහැ, එහෙම දෙයක් සිදු වී නැත කියා ඇමතිතුමාට නැගිට කියන්න බැරි ඇයි? ස්ථිර ලේකම්තුමාට එහෙම පැමිණිල්ලක් ලැබී නැත කියා නැගිට කියන්න බැරි ඇයි? එතුමා මෙතැන නැතිව කොහොමද මේවාට පිළිතුරු දෙන්නෙ? ඉතින් උන්නැහේ පැනල ගියා නම් මේක ඇත්ත. එක්කො මෙතැන උන්නැහේගෙ පාර්ලිමේන්තු ලේකම්තුමා ඉන්නට ඕනෑ. එතුමාත් නැහැ. දෙන්නම නැත්නම් මේක ඇත්ත. අර කුඩුවේ සිටින ස්ථිර ලේකම්තුමාට බැහැනෙ උත්තර දෙන්න.

**ගරු අතපත්තු**
*(கௌரவ அத்தபத்து)*
(The Hon. Atapattu)

ඒ රුසියාවෙ—

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

තමුන්නාන්සේ ඇමෙරිකාවට ගිහින් බලන්නකො. මොකක්ද මේකෙ තේරුම? මේ පුංචි රටේ සමහරු ඇමෙරිකාවට පන්දම් අල්ලනවා; තවත් සමහරු තවත් රටවලට පන්දම් අල්ලනවා. එහෙම නම් මේ රටේ ජාතික සංවර්ධනයක් ඇති කරන්නට බැහැ. කවුරුත් පන්දම් ඇල්ලීම නවත්වල මේ රට හදන්නට ලැහැස්ති වෙමු. තමුන්නාන්සේලා ඇමෙරිකාවට පන්දම් අල්ලමින් අනික් අයට කියනවා, රුසියාවට පන්දම් අල්ලනවා ක්‍යා. මධ්‍යස්ථ දේශපාලන අදහස් දරන අපි ඇමෙරිකාවට පන්දම් අල්ලන්නෙත් නැහැ; රුසියාවට පන්දම් අල්ලන්නෙත් නැහැ. බණ්ඩාරනායක ප්‍රතිපත්තිය කියන්නේ මධ්‍යස්ථ වාදයටයි. ඒ නිසා අපි කථා කරන්නේ පන්දම් අල්ලන පක්ෂයක උදවිය හැටියට නොවෙයි. තමුන්නාන්සේලා ඇමෙරිකාවට පන්දම් අල්ලනවා. උන්නැහේලා රුසියාවට පන්දම් අල්ලනවා. මොකක්ද ඔකෙ වෙනස? තමුන්නාන්සේලාට පුළුවන් නම් තව අය ඇල්ලුවාම වරද මොකක්ද?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

කවුද රුසියාවට පන්දම් අල්ලන්නෙ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

අල්ලනවා කියල ඒගොල්ල කියනවා. අපි කියනවා ඒගොල්ල ඇමෙරිකාවට පන්දම් අල්ලනවා කියා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

මේ යෝජනාව පන්දම් ගැන නොවෙයිනෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඇයි, ගරු කථානායකතුමනි, එහෙම කියන්නේ ? මේ රටේ තිබෙන නොම්මර එකේ පන්දම අද විදුලි බලයයි. දැන් අපේ පන්දම විදුලි බලය තමයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ඒ පන්දම ගැන නොවෙයිනෙ මේ දැන් කථා කළේ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

හොඳයි, මේ පත්තර වාර්තාව තවදුරටත් කියවමු. මෙන්න ඉතුරු හරිය :

"මේ අර්බුදය ඇති වී තිබෙන්නේ උඩුනුවර මන්ත්‍රීවරයා විදුලි දෙපාර්තමේන්තුවේ මහනුවර පෝමන් තැන අල්ලා ගෙන, උසස් නිලධාරීන්ගේ නියෝගවලට පිටින්—"

මම ඒ ටික නැවත වරක් කියනවා ;

"—උසස් නිලධාරීන්ගේ නියෝගවලට—පිටින් ගිනුවක්කාර අන්දමට දෙපාර්තමේන්තුවේ වැඩට ඇඟිලි ගසන නිසාය.

උඩුනුවර ඡන්ද කොට්ඨාශය වෙනුවෙන් දෙපාර්තමේන්තුව අනුමත නොකළ වැඩ පවා, මේ පෝමන්ගේ මාර්ගයෙන් කරවා ගැනීමට උඩුනුවර මන්ත්‍රී සමත් වී ඇති බව දැනගන්නට තිබේ. එක වතාවෙක, වෙනත් ඡන්ද කොට්ඨාශයෙක, වැඩට මහනුවර දුම්රිය පළට ගෙනෙන ලද විදුලි කනු වගයක් උඩුනුවර ඡන්ද කොට්ඨාශයේ වැඩට ඔහු විසින් නීති විරෝධී ලෙස පාවිච්චි කොට ඇත."

මේ වාර්තාවේ තිබෙන්නේ එපමණයි. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයකු නියෝජනය කරන වෙනත් කොට්ඨාශය කට යැවූ කනු මේ පෝමන් මාර්ගයෙන් උඩුනුවරට අරගෙන ගියා. මේ පෝමන් මහත් මයා උඩුනුවර මන්ත්‍රීතුමාට (විජේතුංග මයා.) විශේෂ සැලකිල්ලක් දක්වා එහෙම කළේ උඩුනුවර මන්ත්‍රීතුමාට අසීමිත බල තල තිබෙන නිසයි. එච්චර විතරක් නොවෙයි. මේ පෝමන්වරයා දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරීන්ට අකීකරු වූ නිසා ඒ නිලධාරීන් විසින් මේ පෝමන්වරයා මාරු කරන්නට නියෝගයක් යැව්වා. පුළුවන් නම් "එහෙම දෙයක් වුණේ නැහැ" කියා ඇමතිතුමා කියන්න. උඩුනුවර මන්ත්‍රීතුමාගේ බලපෑම උඩ ඇමතිතුමා ඒ නියෝගය අවලංගු කළා. ඉතින් ඔය දෙපාර්තමේන්තුවට ඇමතිවරයකු මොකටද ? ඇමතිවරයකු නැත්නම් වඩා හොඳයි. මේ පාර්ලිමේන්තුවේ සම්මත කරන නීති රීතිවලින් බලය පවරා අපි යම්කිසි දෙපාර්තමේන්තුවකට නිලධාරියකු පත් කරනවා නම්, ඒ නීති රීති යටතේ ඒ උදවිය යටතේ සිටින නිලධාරීන් පාලනය කරන්නට ඔහුට බලය තිබෙන්නට ඕනෑ. දැන් ඊට ඉඩක් නැහැ. ඇයි ? පෝමන් කළ වැරදි සියල්ලම වසා ගන්නට උඩුනුවර මන්ත්‍රීතුමාගේ බලපෑම් නිසා ඇමතිතුමා අනුබල දී තිබෙනවා.

එදා අපි පත්තරයක් ගන්නට ගිය වෙලාවෙ උන්නැහේ ආණ්ඩුව පැත්තෙන් නැගිටල ඇවිත් විරුද්ධ පාර්ශ්වයෙන් වාඩි වුණා. ඒ කාගේදෝ පත්තරයක් ගන්නට ගිය වෙලාවෙයි. එහෙත් උන්නැහේගේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ක්‍රියා මාර්ගය ඉදිරියට ගෙන යන්නට උැහැස්ති වන වෙලාවෙ මන්ත්‍රීවරුන් අල්ලාගෙන පෝමන්වරයා බලපෑම් කරනවිට උන්නැහේ තවමත් ඒ පැත්තෙම පරණ පුටුවෙම වාඩි වෙලා ඉන්නවා. එයින් පෙනී යන්නේ උන්නැහේට ශක්තියක් හෝ ආත්ම ගෞරවයක් නැති බවයි.

ගරු කථානායකතුමනි, ගම්බදව විදුලි බලය සැපයීම පිළිබඳ යෝජනා ක්‍රමය ප්‍රමුඛතා ලැයිස්තු ගැන නොසලකා, දේශපාලන බලපෑම් උඩ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ආසනවලට විතරක් විශේෂ සැලකිලි දක්වමින්, ඇමතිවරයාගේද ඇඟිලි ගැසීම් ඇතිව ක්‍රියාවේ යෙදීම ගැන මේ අවස්ථාවේදී මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. නුවරඑළි දිස්ත්‍රික්කයේ තිබෙන සම්බන්ධතා කාරක සභාව විසින් දෙන ලද ප්‍රමුඛතා ලැයිස්තු සම්පූර්ණයෙන්ම අමතක කර දමා තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය එන්. එම්. පෙරේරා** (යටියන්තොට)
*(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)*
(Dr. N. M. Perera)—Yatiyantota)

What has happened to the Hon. Minister? Neither the Minister nor the Parliamentary Secretary is here.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඇමතිතුමා නැති නිසා කරුණාකර මේ විවාදය කල් දමන්න.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු කථානායකතුමනි, ගණපූරණයක් ඇත්තේත් නැහැ.

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොතිබියෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.**

**පසුව ගණපූරණයක් තුබුයෙන්—**

சபை எண்ணப்பட்டு நிறைவெண் இல்லாததால் பிரிவு மணி அடிக்கப்பட வேண்டுமென ஆணையிடப்பட்டது.

பிறகு, நிறைவெண் இருந்ததனால்—

*House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present—*

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ගරු කථානායකතුමනි, දැන් ගණපූරණය තිබෙන නිසා මට කථා කරගෙන යන්නට පුළුවන් බව ඇත්තයි. එහෙත් ඇමතිතුමා හෝ පාර්ලිමේන්තු ලේකම්තුමා හෝ අද මෙහි නැති නිසා මෙම විවාදය කල් දමන ලෙස මා කරුණාවෙන් ඉල්ලා සිටිනවා. ඇමතිතුමාට පැමිණිය හැකි දවසක අප මේ විවාදය පවත්වමු. එතෙක් වෙනත් විෂයයන් ගැන සාකච්ඡා කරමු.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු කථානායකතුමනි, මේ විෂයය ගැන සාකච්ඡාව නවත්වන්නට යෝජනාවක් ගේන්නට බැරිද? [බාධා කිරීමක්]

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඇමතිතුමා පැමිණීම ගැන බොහොම සන්තෝෂයි. අර වැරදි කළ ෆේර්මන් තැන මාරු කර යවන්නට විදුලිබල දෙපාර්තමේන්තුවට ඉඩ නොදුන්නේ ඇමතිවරයා බවට මා දැන් එතුමා ඉදිරියේ චෝදනා කරනවා. යටිනුවර කොට්ඨාශයට යැවූ කණු උඩුනුවර කොට්ඨාශයට ගෙන ගිය ෆෝර්මන් මාරු කර යවන්නට විදුලි බල දෙපාර්තමේන්තුව ක්‍රියා කරද්දී උඩුනුවර ගරු මන්ත්‍රීතුමාගේ (ඩී. බී. විජේතුංග මයා.) ඕනෑකම පිට ඊට හරස් කැපුවේ ඇමතිතුමායි. විනයානුකූලව ක්‍රියා කරන්නට ඇමතිතුමා ඉඩ දෙන්නේ නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ස්ථාන මාරු කිරීම විනයට සම්බන්ධ එකක් නොවෙයි. චෝදනාවක් තිබෙනවා නම් ඒ ගැන විභාග කරනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඒ ෆේර්මන් තැන වරදක් කර තිබෙන බව අද විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් තිරණය කර ඉවරයි. ඉතින් ඔහුට විරුද්ධව චෝදනා පත්‍රයක් ඉදිරිපත් කරන්නට ඉඩ නොදෙන්නේ ඇයි? චෝදනා පත්‍රයක් යවන්නැයි ගරු ඇමතිතුමා නියෝග කරනවාද?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

එහෙම නියෝග කරන්නෙ කොහොමද? යම් කෙනකු වරදක් කර තිබෙන බව පෙනී ගියහොත් චෝදනා පත්‍ර ඉදිරිපත් කරාවි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඒ ගැන ඇමතිතුමා ඇඟිලි ගසන්නේ නැද්ද?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

නෑ. චෝදනාවක් කරන්නැයි ගරු මන්ත්‍රීතුමා මට කීමෙන් අදහස් කරන්නේ මා ඇඟිලි ගැසිය යුතු බව නේද?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

උඩුනුවර ආසනයට ගෙන යා යුතු කණු යටිනුවර ආසනයට ගෙන ගියා නම් වැරදි කාරයාට දඬුවම් කරන්නේ නැද්ද?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ගරු මන්ත්‍රීතුමා දැන් එහෙම චෝදනාවක් කර තිබෙනවා. ඒක විභාග කරනවා ඇති. මා ඒ ගැන ඇඟිලි ගසන්නේ නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

යටිනුවර ඡන්ද කොට්ඨාශයේ පාරිභෝගිකයන් රුපියල් 60 බැගින් ගෙවා දැන් අවුරුදු තුනක් ගත වී තිබෙනවා. එහෙත් යටිනුවර ගරු මන්ත්‍රීතුමා (අබේසුන්දර මයා.) ප්‍රබල කෙනකු නොවන නිසා යටිනුවර ගෙන යන්නට වෙන් කළ කණු උඩුනුවරට ගෙන ගියා. ඉතින් ඒ අනුව "ඇත්ත" පත්‍රයේ වරදක් නැහැ. මෙතැන තිබෙන්නේ වැඩ පිළිවෙළේ වරදක්. මගේ චෝදනාව ගරු ඇමතිතුමා මෙවැනි කාරණා වලට ඇඟිලි ගසන බවයි. එදා පත්තරයක් රජයට ගන්නට ගිය අවස්ථාවේදී ගරු ඇමතිතුමා පත්තර බල වේගයට යට වී ඔය පැත්තේ සිට මේ පැත්තට ආවා. දැන් විදුලි බල වේගය නිසා කොයි පැත්තට යත්දැයි කියන්නට බැහැ. [බාධා කිරීමක්] කොහොමද දන්නේ? මනුෂ්‍යයකුගේ ඔළුව ඇතුළේ මොන මොන විධියේ දේවල් තිබෙනවාදැයි කිව හැක්කේ කාටද? ඒ ශාස්ත්‍රය තවම කවුරුන්වත් හොයාගෙන නැහැ. ඒ නිසා මේක මටවත්, තමුන්නාන්සේටවත් තීරණය කරන්නට බැහැ. මිනිස්සු කියන ජාතිය පුදුම සත්තු ජාතියක්. [බාධා කිරීමක්] ඔව්, මාත් ඇතුලුවයි කියන්නේ. මොනවා කරයිද කියා අප කාටවත් තීරණය කරන්නට බැහැ. [බාධා කිරීමක්] මනුෂ්‍යයො කිව්වම පිරිමි, ගෑණු භේදයක් නැහැ.

ගරු කථානායකතුමනි, විදුලි බල දෙපාර්තමේන්තුව නීතිගත සංස්ථාවක් කිරීමෙන් සේවකයන්ට ඇති වන යම් යම් අමාරුකම් පිළිබඳවත්, වෙනත් ප්‍රශ්න පිළිබඳවත් මා තමුන්නාන්සේට කරුණු කීපයක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. විදුලි බල දෙපාර්තමේන්තුවත්, පාරිභෝගිකයාත් අතර යම් කිසි ආරවුලක් පැනනැංගොත් 1950 අංක 33 දරණ විදුලි බල සංශෝධන පනත යටතේ, විදුලි බල පරීක්ෂකවරයකුට හෝ වර්තමාන විදුලි ඉංජිනේරුතුමාට හෝ බලයක් තියෙනවා, මැදහත් වී ඒ ආරවුල විසදීමට. විදුලි බල ඉංජිනේරුතුමා තමයි, ඒ ආරවුල විසඳන තැනැත්තා. එහෙත් මේ පනත සම්මත වුනාට පසු, විදුලි බල පාරිභෝගිකයාත් සංස්ථාවත් අතර ආරවුලක් ඇති වුනොත් එය නිරාකරණය කරන්නට බලය තිබෙන්නේ කාටද කියා පෙන්වන ලෙස මා ගරු ඇමතිතුමාට අභියෝග කරනවා. පාරිභෝගිකයාත්, සංස්ථාවත් අතර ඇති වන ආරවුලක් විභාග කර තීරණයක් දෙන්නට විදුලි බල පරීක්ෂකවරයකුට තිබෙන බලතල මේ පනතින් අහෝසි කර තිබෙනවා; නැති කර තිබෙනවා. ඒ වෙනුවෙන් ගන්නට යන ක්‍රියා මාර්ගය කුමක්ද? මීට පසු මේ ප්‍රශ්නය බේරන තුන්වැන්නා කවද? ගරු ඇමතිතුමා විදුලි බල සංස්ථාවට නිෂේධ බලයක් දෙන්න යනවාද හිතුවක්කාර අන්දමින් කටයුතු කරගෙන යාමට? එසේ නැතිව එවැනි ආරවුලක් බේරීමට තුන්වැන්නෙකුට බලයක් දෙනවද? නැහැ, ගරු ඇමතිතුමා ඒ වගේ බලයක් දෙන්නෙ නැහැ. ඒ නිසා මේ තත්ත්වය නැති කිරීමට කටයුතු කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එක පැත්තකින් විදුලි බලය පාවිච්චි කරන පළාත් පාලන ආයතන තිබෙනවා. අනික් පැත්තෙන් විදුලි බල සංස්ථාව තිබෙනවා, පාලනය කිරීමට. ඔය දෙගොල්ල අතර අරගලයක් ඇති වුනොත් එය විස දන පුද්ගලයා වශයෙන් සිටියේ විදුලි බල පරීක්ෂකතුමා නැත්නම් විදුලි බල ඉංජිනේරුතුමයි. මේ පනතෙන් ඒ විසඳන්නාගේ බලය නැති කර තිබෙනවා. එසේ නම් කව්ද දැන් බලධාරියා ? ගරු ඇමතිතුමාද බලධාරියා ? ඇමතිවරයකුගෙන් එවැනි අරගලයකදී යුක්තිසහගත තීරණයක් බලාපොරොත්තු වන්නට පුළුවන්ද ? කවදාවත් බැහැ. මේ අන්දමේ ආරවුලක් ගැන විභාග කරන්නට යම්කිසි මණ්ඩලයක් හෝ පුද්ගලයකු හෝ පත් කිරීමට වගන්තියක් මේ පනතට ඇතුළු කිරීමට, එසේ නැත්නම් ඒ ගැන කල්පනා කර බලා කටයුතු කිරීමට ගරු ඇමතිතුමා කැමතිද කියා මා දැන ගන්නට සතුටුයි. කෝ ඇමතිතුමා, නිදි. මේක තමයි, අපට තියෙන ලෙඩේ. ඉඩම් සංවර්ධනය ගැන කථා කළත්, විදුලි බලය ගැන කථා කළත්, වාරිමාර්ග ගැන කථා කළත් ඇමතිතුමා නිදි. 1956 සිට හැමදාම ඇමතිතුමා නිදි. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව යටතේ පමණක් නොවෙයි, අපේ ආණ්ඩුව යටතේත් තිබුණේ මේ ලෙඩේමයි. එක්කො නිදි; එහෙම නැත්නම් ඉඩම් ගැන කථා කරන්නට ගියාම ටිකක් හිනහ වෙලා ධීවර සංසථාව ගැන කථා කරලා මහත්මයෝ මට ඉක්මනට යන්න තියෙනවාය කියා ඉක්මනට පාස් වෙලා යනවා. මේ ප්‍රශ්නයට ගරු ඇමතිතුමාගේ විසඳුම කුමක්ද ?

ඊළඟට සේවක ප්‍රශ්නය දෙස බලමු. මේ පනත් කෙටුම්පතේ 31 වැනි වගන්තියේ මෙන්න මෙහෙම තිබෙනවා :

"31. මණ්ඩලය විසින්, 5 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, අවශ්‍ය යයි මණ්ඩලය විසින් සැලකිය හැකි නිලධරයන් හා සේවකයන් එහි කාර්ය මණ්ඩලයට පත් කළ හැකි අතර ඔවුන්ගේ පාරිශ්‍රමික නිගමනයන් හා වෙනත් සේවා කොන්දේසිද නිශ්චය කළ හැකිය."

මෙහි වැදගත් ස්ථාන දෙකක් තිබෙනවා. එකක් තමයි "5 වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව, අවශ්‍ය යයි මණ්ඩලය විසින් සැලකිය හැකි නිලධරයන්" යන්න. මා ඊයේ සඳහන් කළ අන්දමට පැරදුණු දේශපාලනඥයින් ඇතුළු තමුන්නාන්සේලාගේ හිතවතුන් මණ්ඩලයට පත් කළාට පසුව අවශ්‍ය යයි හිතෙන නිලධාරීන් අන්න අහවල් අය පමණයි කියා ඒ මණ්ඩලය හිතනවා නම් අන්න ඒ අය පමණයි මේ පනත යටතේ විදුලි බව සංස්ථාවට ඇතුළත් වන්නේ. අනවශ්‍යයි කියා හිතෙන අය ගෙදර යන්න ඕනෑ. එයට එකඟ වන්නට මට නම් බැහැ. විදුලි බල සංස්ථාවට බඳවා ගන්නේ අවශ්‍යයයි හිතෙන අය පමණයි, අනික් අය ගෙදර යන්න ඕනෑ, කියන එකයි මේ පනතින් කියන්නේ. අවශ්‍ය වුණත් අවශ්‍ය නොවුණත් දැනට විදුලි බල දෙපාර්තමේන්තුවේ සේවය කරන සියලුදෙනාම මේ සංස්ථාවට බඳවා ගත යුතුයි කියන එකයි අපි කියන්නේ. එහෙත් අවශ්‍ය යයි හිතෙන අය පමණයි ගන්නේ කියා ගරු ඇමතිතුමා ඒ සඳහා මේ පනතින් බලය අරගෙන තිබෙනවා. ගරු කථානායකතුමනි, එය පුදුම සිතුවිල්ලක්. අවශ්‍ය යයි ගරු විදුලිබල ඇමතිතුමා හිතන දේවල් නොවෙයි අවශ්‍ය යයි මා හිතන්නේ.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
**(Dr. N. M. Perera)**

අවශ්‍ය නැත්නම් මෙපමණ කල් තබා ගත්තේ ඇයි ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
**(Mr. T. B. M. Herath)**

මේ අය අවශ්‍ය නැත්නම් මෙපමණ කල් තබා ගත්තේ ඇයි කියා ගරු වටියන්තොට මන්ත්‍රීතුමා අහනවා. මෙපමණ කල් තබා ගැනීමෙන් පෙනී යන්නේ ඒ අය අවශ්‍යයි කියන එකයි. දැනට සිටින අය අවශ්‍ය නම් "අවශ්‍ය යයි මණ්ඩලය විසින් සැලකිය හැකි නිලධරයන්" කියා වගන්තියක් දම්මේ ඇයි ? ඒ අය නිල් පාටද, රතු පාටද, කොළ පාටද, මොන ජාතියේද, මොන කුලයේද යනාදී කරුණු ගැන තමුන්නාන්සේලා බලනවාද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලංකා විදුලි බල මණ්ඩල පනත් කෙටුම්පත —දෙවන වර කියවීම

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
32 වැනි වගන්තියේ 5 වැනි උප වගන්තිය බලන්න.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
හොඳයි මම ඒකත් කියවන්නම්.

"32. (5) මේ වගන්තියෙහි ඉහත දක්වුණු විධි විධානවලින් කිසිවක් යටතේ අහෝසි කරන ලද හෝ අහෝසි කරන ලදැයි සැලකෙන තනතුරක් දරන දෙපාර්තමේන්තුවේ සෑම රජයේ නිලධරයකු ඒ නිලධරයා විසින් හා මණ්ඩලය විසින් ගිවිස ගනු ලැබිය හැකි නියමයන් හා කොන්දේසි යටතේ මණ්ඩලය විසින් නොපමාව සේවයට ගත යුතු ය."

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඒකයි උත්තරය. වෙනත් උත්තරයක් එයට දෙන්නේ නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
තමුන්නාන්සේලාට ඒ උත්තරය දීල බේරෙන්නට බැහැ. මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණය නැත්නම් උසාවිය ඔය වගේ බොළඳ පිළිතුරකින් නතර වන්නට ලැහැස්ති නැහැ. අවශ්‍ය යයි සැලකෙන අය පමණක් නොවෙයි ඔක්කොම ගන්නයි අපි කියන්නේ. ඊංගා යන්නට සිදුරු තබන්නේ මොකටද? [බාධාකිරීමක්] සංස්ථාව පිහිටුවන විට විදුලි බල දෙපාර්තමේන්තුවේ සිටින හැම නිලධාරියකුම එයට බඳවා ගන්නට ඕනෑ. සිදුරු තබන්නට ඕනෑ නැහැ. සංස්ථාව පිහිටුවූවාට පසු යම් කෙනෙකුගේ සේවය අනවශ්‍ය නම් එය තීරණය කරන්නේ සංස්ථාව නේද? සේවකයන්ගේ පොදු වුවමනාවන් හා අනිකුත් සියළුම සේවා කොන්දේසි පිළියෙළ කරන්නේ සංස්ථාව නේද? සංස්ථාව පිහිටුවූවාට පසු මේ සේවකයන්ට බල පාන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ව්‍යවස්ථා නොවෙයි. [බාධා කිරීමක්]

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
It can be a disciplinary transfer.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
We must first have an inquiry.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
The only point is that they become new employees under new conditions.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
You suggest an amendment. Clause 32 (5) says:

"Every public officer of the Department whose post is abolished or deemed to be abolished under any of the preceding provisions of this section, shall be immediately offered employment by the Board on such terms and conditions as may be agreed upon by such officer and the Board."

ඒ අනුව සියළු දෙනාම ගන්නයි නියමය. ඒ වගන්තිය පිළිබඳව වෙනසක් කරන්නට වුවමනා නම් සංශෝධනයක් ඉදිරිපත් කරන්න.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
තමුන්නාන්සේ පිළිගන්නට ලැස්ති නම් සංශෝධනයක් ඉදිරිපත් කරන්නම්. හොඳයි ඒ ප්‍රශ්නය ස්වල්ප වේලාවකට නවත්වා ඊළඟ එකට යමු.

32 වන වගන්තිය අනුව අවුරුදු දහය කට නො අඩු සේවා කාලයක් තිබෙන සෑම කෙනෙකුටම විශ්‍රාම ගන්නට ඉඩ දී තිබෙනවා. ඒ කොටස පිළිබඳව අපේ විරුද්ධත්වයක් නැහැ. මේ රටේ රජයේ සේවයේ අවුරුදු විස්සක් විසිපහක් සේවය කර මේ රටට ඉතාම වැදගත් සේවයක් කරන්නට මේ ගරු සභාවට, පාර්ලිමේන්තුවට එන මන්ත්‍රීවරුන්ට නොලැබෙන අයිතියක් වරප්‍රසාදයක් මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සේවකයන්ට ලැබීම ගැන මා සතුටු වෙනවා. අවුරුදු පහළොවක රජයේ සේවා කාලයක් තිබුණත් මන්ත්‍රීකමට පැමිණි නිසා විශ්‍රාම වැටුප අහිමිවූ කෙනෙකු වන මා විදුලි බල දෙපාතීමේන්තුවේ අවුරුදු දහයක සේවාකාලයක් තිබෙන සේවකයන්ට විශ්‍රාම වැටුප් සහිතව එළියට යන්නට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. ඒ ගැන මා තුළ කිසිම අසතුටක් නැහැ. නමුත් මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ට දක්වන සැලකිල්ල ගැනයි මගේ කණගාටුව. මේ රටේ සාමාන්‍ය සේවකයන්ට ඊට වැඩි සැලකිල්ලක් දැක්වීම ඇත්ත වශයෙන් ම මා උසස් කොට සලකන්නට ලැස්තියි.

ඊයේ සවස මා කථා කරන අවසථාවේදී තමුන්නාන්සේ සිටියේ නැහැ. අප පක්ෂ භේදයකින් තොරව මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රශ්න වැනි දේවල් ගැන යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. අවුරුද්දක් තිස්සේ ඒ යෝජනාව න්‍යාය පත්‍රයේ තිබෙනවා. තවම අපට ඒ ගැන සාකච්ඡා කරන්නට දිනයක් ලැබී නැහැ. මේ රටට අත්‍යවශ්‍ය වූ සේවයක් කළ, සියළු දෙනාම පිළිගන්නා වූ අධ්‍යාපනික සේවයක් කළ, සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර හිටපු අධ්‍යාපන ඇමතිතුමාට විශේෂ දීමනාවක් ගෙවන්නට මේ ගරු සභාවට විශේෂ යෝජනාවක් ඉදිරිපත් කරන්නට සිද්ධ වුණා. ඒ කද මේ රටේ මන්ත්‍රීවරුන්ගේ තත්ත්වය? තමුන්නාන්සේ කරුණාකර මේ තත්ත්වය ගැන කල්පනා කර බලන්න. අවුරුදු විස්ස විසිපහ මේ රටට සේවය කරන මන්ත්‍රීවරුන්ට මන්ත්‍රීකමින් පසු මහ පාරට යන්නට සිද්ධ වී තිබෙනවා.

ඒ ගැන අපේ කණගාටුව ප්‍රකාශ කරන අතර රජයේ විදුලිබල දෙපාර්තමේන්තුවේ සේවකයන්ට මේ ලැබී තිබෙන වරප්‍රසාදය ගැන අප සතුටු වෙනවා. නමුත් ඒක අංග සම්පූර්ණ වරප්‍රසාදයක් නොවෙයි. විදුලි බල දෙපාර්තමේන්තුව විනාශ කර, නැති කර, විසුරුවා හැර සංස්ථාවක් පිහිටුවන්නට ඇමතිතුමා තීරණය නොකළා නම් ඔවුන්ට ලැබෙන්නේ දස අවුරුදු සේවා කාලයක විශ්‍රාම වැටුපක් නොවෙයි. ඔවුන්ගේ සම්පූර්ණ සේවා කාලයට සරිලන විශ්‍රාම වැටුපක් ඔවුන්ට ලැබෙන්නට තිබුණා. නමුත් තමුන්නාන්සේගේ අවාසනාවන්ත පනත නිසා පන්දහසක් පමණ වූ විදුලි බල දෙපාර්තමේන්තුවේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප් වරප්‍රසාදවලට පහර වැදී තිබෙනවා. ඒ ගැන අපට කොහෙත්ම සතුටු වන්නට පුළුවන්කමක් නැහැ.

නමුත් ඒක නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය. මට තේරුම් ගන්නට බැරි මේ ඇමතිතුමාගේ දෙබිඩි ප්‍රතිපත්තියයි. ඇමතිතුමා මේ පනතින්ම පළාත් පාලන සේවයේ හෝ රජයේ සේවයේ හෝ යෙදී සිටින අත්‍යවශ්‍යයයි සැලකෙන උදවිය මේ සංස්ථාව තුළට ගෙන ඔවුන්ට දැනට තිබෙන වරප්‍රසාද එහෙමම දී, ඔවුන්ට දැනට තිබෙන විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් යනාදිය එහෙමම දී—ඒ සියළුම වරප්‍රසාද සහිතව—ඒ උදවිය මේ සංස්ථාව තුළ ඕනෑ තරම් කාලයක් තබා ගන්නට ඉඩ සලසා තිබෙනවා. ඒ සඳහා ඇමතිතුමා තවත් වගන්තියක් මේ පනතට ඇතුළු කොට තිබෙනවා. එහෙත් සිටින අයට බැහැ. ඒ අය එළියට යා යුතුයි. අළුතින් ගන්නා අයට ඉඩ දී තිබෙනවා. මොකක්ද මේ දෙබිඩි ප්‍රතිපත්තිය; දෙපැත්තට ක්‍රියා කරන ප්‍රතිපත්තිය? අළුතින් ගන්නා අයට එසේ ඉඩ දී තිබෙනවා නම්, දැන් සිටින අය විශ්‍රාම යන තුරු ඔවුන්ට ලැබෙමින් තිබුණු පැරණි අයිතිවාසිකම් උඩ ඒ ආකාරයටම ක්‍රියා කරන්නට ඉඩ දෙන්නට තමුන්නාන්සේට බැරිද? එසේ කරන්නට තමුන්නාන්සේට පුළුවන් විය යුතුයි. එක් කෙනෙක් අවුරුදු 10 න් යායුතුයි. තව කෙනෙක් අවුරුදු 10 ට අඩු නම් අවුරුදු 8 ට වැඩි නම් ඔහුට 10 වන තුරු ඉන්න ඉඩ දෙනවා. තව කෙනෙකුට අවුරුදු 8 ට අඩු නම් මොකවත් නැහැ. මොකක් ද මේ ප්‍රතිපත්තිය? අවුරුදු 1 සිට 8 වන තුරු අයට මොකවත් නැහැ. අවුරුදු 8 සිට 10 වන තුරු අයට තව අවුරුදු 2 ක් දෙනවා. 10 ට වැඩි නම් ගෙදර යන්නට වෙනවා. එය සිදු වන්නේ කෙසේද? අවශ්‍යයි කියන එක ගැන සලකන්නට එපාය කිව්වා. ඒක භාර ගත්තා. එහෙත් එම වගන්තියේ තව දුරටත් කියනවා, වෙනත් සේවා කොන්දේසිද නිශ්චය කළ හැකි බව. අළුතින් ඇති කරන සේවා කොන්දේසිවලට ඔවුන් යටත් නම් පමණයි සිටිය හැක්කේ. එසේ නැතිනම් ඉවත් වෙන්නට ඕනෑ. සංස්ථාවේ මණ්ඩලයක් හැටියට පැරදිච්ච අපේක්ෂකයන් එකතු වෙලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

කියාවි, "මේවායි සේවා කොන්දේසි ; මේවාට අත්සන් කරන්නට සූදානම් විය යුතුයි" යනුවෙන්. ඒකට ලැස්ති නැතෙයි කිව්වොත් ගෙදර යන්නට වෙනවා ; ලැස්ති නම් සිටින්නට පුළුවනි. මේ උදවිය රජයේ සේවාවට බැඳුනේ තමුන්නාන්සේ අළුතින් ඇති කරන සේවා කොන්දේසි අනුව ක්‍රියා කරන්නට නොවෙයි. ඔවුන් සේවයට බැඳුණේ පොදු රාජ්‍ය සේවා කොන්දේසි උඩයි ; පොදු පරිපාලන සේවා ව්‍යවස්ථා උඩයි ; පොදු මුදල් රෙගුලාසි උඩයි. එසේ සේවයට බැඳුණු අය එළියට දමා අවසාන වී කියනවා, "මෙන්න මේ අළුත් කොන්දේසිවලට අනුව කටයුතු කරන්නට පුළුවන් නම් රක්ෂාව කරන්නට හැකියි ; බැරිනම් ගෙදර පලයල්ලා" යනුවෙන්.

සේවකයන් 5,000 කගේ පමණ නිදහස නැත්තටම නැති කර දමා ඔවුන් අළුත් බැඳීම් වගයකට ඇතුළත් කරගෙන ඒ මාර්ගයෙන් ඔවුන් තම සංස්ථාවෙහි වහලුන් බවට පත් කර ගන්නට මහන්සි ගන්නා බව පෙනෙනවා. තමුන්නාන්සේගේ සංස්ථාව ඔවුන්ගෙන් එවැනි වහල් සේවයක් ගැනීමට සූදානම් වෙනවා නම් එතන ප්‍රජාතන්ත්‍රවාදයක් නැති බව කරුණාකර පිළිගන්න. 1965 දී යන්තම් ප්‍රජාතන්ත්‍රවාදය රැක ගත්තාලු. එහෙත් තමුන්නාන්සේලාගේ ප්‍රජාතන්ත්‍රවාදයය කියන්නේ මේකටද ? සේවකයන් 5,000 ක් පමණ භුක්ති විඳගෙන ආ අයිතිවාසිකම් සියල්ල නැත්තටම නැති කර දමා ඔවුන්ට අළුත් කොන්දේසි මාලාවක් පනවා ඒවාට ඔවුන් ලවා අත්සන් කරවා ගෙන එමගින් ඔවුන් වහල් භාවයකට පත් කර ගන්නට මහන්සි ගන්නා බවයි පෙනෙන්නේ. එම නිසා අපට පුළුවන් කමක් නැහැ මෙවැන්නකට පක්ෂ වන්නට. මෙම සේවකයන් සියළුදෙනාම වෙනත් දෙපාර්තමේන්තුවලට මාරු කර යවා ඔවුන්ට කලින් තිබුණු අයිතිවාසිකම් සියල්ල දෙනවායයි තමුන්නාන්සේ කිව්වොත් අපට පුළුවනි ඒකට එකඟ වන්නට. මාරු කළ හැකි සේවකයන් මෙහි සිටිනවා. විදුලි බල දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිලධාරීන් මෙන්ම ලිපිකාර ශ්‍රේණියේ නිලධාරීන්ද එම ගොඩට ඇතුළත් වෙනවා. මාරු කළහැකි ශ්‍රේණි රාශියක් මෙහි තිබෙනවා. එම උදවිය මාරු කර යවන්න. එසේ යැව්වොත් මෙම සංස්ථාව පවත්වා ගෙන යන්නට පුළුවන් වන්නේ නැහැ. එම නිසා ඔවුන්ට මෙවැනි මර්දන නීති රීති දමා ගෙන නාස් ලණු දමා ගෙන තමන්ට වුවමනා වුවමනා තැන්වලට ඔවුන් ගෙන යන්නට කල්පනා කරනවා. මේ හේතු නිසා මෙයට කොහෙත්ම එකඟ වන්නට අපට බැහැ.

මෙම සේවකයන් මෙතුවක් කල් විඳපු වරප්‍රසාද කෝ ? ඔවුන්ට තිබුණු දුම්රිය ප්‍රවේශ පත්‍ර අයිතිවාසිකම් සහ වෙනත් අයිතිවාසිකම් කෝ ? මේ සේවකයන්ගේ වැන්දඹු අනත්දරු අරමුදල් කෝ ? විශ්‍රාම වැටුප් වෙනුවෙන් ඔවුන් මෙතෙක් කල් දායක මුදල් ගෙව්වා නේද ? ඒවාට මොකද වුණේ ? අවුරුදු 8 ට අඩුවෙන් සේවය කළ අයට විශ්‍රාම වැටුප් ලැබෙන්නේ නැහැ. එහෙත් ඒ අයත් මෙපමණ කල් දායක මුදල් ගෙව්වා නේද ? ඒ මුදල්වලට මොකද වන්නේ ? මාත් අවුරුදු 15 ක් තිස්සේ විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු අරමුදලට දායක මුදල් ගෙවූ රජයේ සේවකයකුව සිටියා. දේශපාලනයට බැසීම නිසා මට ඒ සියල්ලක්ම නැති වුණා. මට එසේ වුණාවේ. එහෙත්, මේ සේවකයන්ට ඒ අයිතිවාසිකම් නොලැබෙන්නට හේතුව මොකක්ද ? ඒවා ගැන මේ පණතෙහි කිසිවක් සඳහන් වී නැත්තේ ඇයි ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

තිබෙනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

මොනවද තිබෙන්නේ ? පෙන්නන්න. තමුන්නාන්සේ මා කියන දේට ඇහුම් කන් දෙන්නේවත් නැහැ. මුළු ලෝකය පෙරළුණත් ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ගරු ඇමතිතුමා ඔහේ හිටි තැනම හිටිනවා. හැබැයි, පෙරලීම අවසාන වුණු දාට පළමුවෙන්ම යට වන්නේ එතුමායි. [බාධාකිරීමක්] උමගකට යට වෙනොත් ඒකත් එකක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තවත් මන්ත්‍රීවරුන් රාශියක් මේ සම්බන්ධව කථා කරන්නට බලාපොරොත්තු වන නිසා, තව කරුණක් දෙකක් පමණක් පෙන්වා දීමෙන් පසු මගේ කථාව නතර කරන්නට මා අදහස් කරනවා. ප්‍රධාන වශයෙන් මෙහි කරුණු කීපයකටම මා විරුද්ධයි. අවුරුදු 10 ට වැඩියෙන් සේවය කළ අය විශ්‍රාම යැවීම ගැන මා විරුද්ධයි. අවුරුදු 8 සිට 10 දක්වා සේවය කළ අයට ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිය ලබා ගන්නට ඉඩ දෙතොත්, අවුරුදු 10 ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කළ අයට ඔවුන්ගේ සම්පූර්ණ සේවා කාලය විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයක් බවට පත් කර ගැනීමට ඉඩ දිය යුතුයි. සේවා කාලය අවුරුදු 8 ට අඩු අයටත්, අවුරුදු 10 ට වැඩි සේවා කාලයක් ඇති අයට දෙන අයිතිවාසිකම් දිය යුතුයි. එසේ නැත්නම්, ඒ අය වෙනුවෙන් වෙන යම් ක්‍රමයක් යෙදිය යුතුයි· අඩු ගණනේ, ඔවුන් විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු අරමුදල් වෙනුවෙන් ගෙවූ මුදල් රජයෙන් වන්දි මුදලකුත් සමග ඔවුන්ට ආපසු ගෙවීමවත් කළ යුතුයි. රජයෙන් වන්දි මුදලක් ගෙවිය යුත්තේ ඇයි? විශ්‍රාම වැටුප් සඳහා දායක මුදල් ගෙවන කෙනකුට ආපසු ලැබෙන්නේ ඔහු ගෙවූ මුදල පමණක් නොවෙයි. රජයෙන් වැඩිපුර ගණනකුත් ලැබෙනවා. වැන්දඹු අනත්දරු අරමුදල සම්බන්ධයෙනුත් තත්වය ඒකයි. එම නිසා, මෙකී සේවකයන් සඳහාත් එවැනි ක්‍රමයක් යෙදිය යුතුයි. එසේ නැතිව ඇමතිතුමාට ඕනෑ හැටියට පණතක් සම්මත කරගෙන මහජන ජීවිත 5,000 ක් සමග සෙල්ලම් කරන්නට එතුමාට ඉඩ දෙන්නට බැහැ. සේවකයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් මෙහි දක්වා තිබෙන දේ කොහෙත්ම ප්‍රමාණවත් නැහැ. එපමණකුත් නොවෙයි.

ගරු ඇමතිතුමා මේ සේවකයන්ට කොළේ වැහුවා. "මෙවැනි පණතක් ඉදිරිපත් කරන්නට කලින් මා තමුන්නාන්සේලා සමග සාකච්ඡා කරනවා" යි ගරු ඇමතිතුමා මේ සේවකයන්ට පොරොන්දුවක් දුන්නා. එහෙත්, ඇමතිතුමා එසේ කෙළේ නෑ· සේවකයන් සමග සාකච්ඡා නොකරම එතුමා මේ පණත දැන් මෙම ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. මා ඊයේ මේ සම්බන්ධව ලියුමක් සභාගත කළා. ගරු ඇමතිතුමා මෙහි සිටියේ නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මා ඒ සියල්ලක්ම කියවනවා.

**ටී. බී. එම්. හේරත් මයා·**
*(திரு· ரி. பி· எம்· ஹேரத்)*
(Mr. T. B. M. Herath)

බොහෝම හොඳයි. තමුන්නාන්සේ කියවන දේ අපට නොතේරෙන එකයි වරද. සේවක ප්‍රශ්නය සම්බන්ධයෙන් මීට වඩා යමක් මා ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට භාජන කරන්නට අදහස් කරන්නේ නැහැ.

ඊළඟට මා මෙම පණතේ 56 වන වගන්තියේ 4 වන ඡේදයෙහි, ගැසට් නිවේදන සම්බන්ධයෙන් දක්වා තිබෙන කරුණ ගැන ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරවන්නට අදහස් කරනවා. එහි සඳහන් වන්නේ මෙසේයි:

> "ඇමතිවරයා විසින් පනවන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කිරීමෙන් පසු හැකි තාක් ඉක්මනින් අනුමත කිරීම සඳහා උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත නොකළ යම් නියෝගයක් යටතෙහි කලින් කරන ලද යම් දෙයකට හානියක් නොමැතිව, එය අනුමත නොකළ දිනයෙහි සිට අවලංගු වූ ලෙස සැලකිය යුතුය."

ඒ අනුව ඇමතිතුමා යම් කිසි නියෝග මාලාවක් හෝ රෙගුලාසි මාලාවක් සකස් කර ගැසට් නිවේදනයක් මගින් නිකුත් කරනවා. එදින සිටම ඒ නියෝග ක්‍රියාවේ යොදනවා. ඊට පසුව මන්ත්‍රී මණ්ඩලයට ගේනවා. මන්ත්‍රී මණ්ඩලය එය අනුමත කරන්නේ නැතුව ප්‍රතික්ෂේප කරනවා. ඊට පසු මොකක්ද සිද්ධ වෙන්නෙ? අර ඇමතිතුමා ගැසට් නිවේදනය නිකුත් කළ අවස්ථාවත් මන්ත්‍රී මණ්ඩලයෙන් එය ප්‍රතික්ෂේප කළ අවස්ථාවත් අතරතුර කාලයේදී ඇමතිතුමා ගත් වැරදි තීරණ සියල්ලම මේ වගන්තියෙන් නීත්‍යනුකූල කර තිබෙනවා. ඇයි මේ හදිස්සිය? මේ අනුව ඇමතිතුමාට පුළුවන් ඕනෑම හිතුවක්කාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කමක් කරන්න. ගැසට් නිවේදනයක් නිකුත් කිරීමට පමණයි තිබෙන්නෙ. එතුමා අදහස් කළොත් විදුලි බල යුනිට් එකකට ගෙවන මිල වැඩි කරන්නට ඕනෑය කියා, දැනට ශත 10ක් වශයෙන් තිබෙන මිල රුපියල් 25ක් දක්වා වැඩි කර ගැසට් නිවේදනයක් නිකුත් කරන්න පුළුවන්. ගැසට් නිවේදනය නිකුත් කළ දින සිටම එය ක්‍රියාත්මක වෙනවා. රුපියල් 25 ගණනේ අය කරන්නට පටන් ගන්නවා. තුන් මාසෙකට හෝ හය මාසෙකට පසුව එම නිවේදනය මන්ත්‍රී මණ්ඩලයට ගෙනෙනවා. රු. 25ක් බැගින් ගෙවන්නට කර තිබෙන ඒ නියමය මහජනයාට විශාල බරක් හැටියට මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරුන් පක්ෂ භේදයෙන් තොරව කල්පනා කර ඒ නිවේදනය ප්‍රතික්ෂේප කරනවා. එතකොට ඇති වන තත්ත්වය මොකක්ද? ගැසට් නිවේදනය නිකුත් කළ අවස්ථාවත් එය මන්ත්‍රී මණ්ඩලයෙන් ප්‍රතික්ෂේපවූ අවස්ථාවත් අතර කාලසීමාව තුළ එසේ රුපියල් 25 ගණනේ අය කිරීම නීත්‍යනුකූල කරනවා. මම කියනවා, කථානායකතුමනි, ඒ ප්‍රතිපත්තිය වැරදියි කියා. එවැනි බලයක් මෙවැනි ඇමතිවරයකුට දෙන්න පුළුවන් කමක් නැහැ. එහෙම දුන්නොත් මොනවා කරාවිද කියා කවුද දන්නෙ? ඒ නිසා මා ඇමතිතුමාගේ සැලකිල්ලට යොමු කරනවා —සලකන්න අහගෙන ඉන්න එපායැ. අසාගෙන සිටින ඇමතිවරයෙකුට එපායැ අපි කියන්න. මහජනයාත් අසාගෙන ඉන්නවා, මන්ත්‍රීවරුනුත් අසාගෙන සිටිනවා, මුළු රටත් අසාගෙන සිටිනවා. එහෙත් ඇමතිතුමා අර පරණ මහා නින්දේමයි. ඇමතිතුමනි, මා ඇසුවේ මොකක්ද කියා කරුණාකර කියන්න.

මා රීති ප්‍රශ්නයක් මතු කරනවා, කථානායකතුමනි, ඇමතිතුමා එතුමාගෙ ආසනයේ නොවෙයි ඉන්නෙ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ආසනයේ නොවෙයි නම් කථා කරන්න හෝ පිළිතුරු දෙන්න බැහැ. ඕනෑ ආසනයක වාඩි වී සිටින්න පුළුවන්.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ගරු ඇමතිතුමා අහගෙනද මා ඇසූ ප්‍රශ්නය? නැහැ, ඉතින් මොකටද අපි මේවා කියන්නෙ?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

එතැන ඉඳගෙන උත්තර දෙන්න බැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

කරුණාකර ආසනයට ගිහින් උත්තර දෙන්න. මා අසන්නෙ මේකයි. ගරු ඇමතිතුමා ගැසට් නිවේදනයක් මගින් යම් කිසි රෙගුලාසි මාලාවක් පළ කරනවා. එම රෙගුලාසියකින් එතුමා නියම කරනවා, විදුලි බල යුනිට් එකකට රුපියල් 25ක් බැගින් ගෙවන්නය කියා. මෙම පනතේ 56(4) වගන්තිය යටතේ එතුමාට ඊට බලය තිබෙනවා. තමුන්නාන්සේ එසේ නියමයක් කර ඉන් පසුව මන්ත්‍රී මණ්ඩලයේ අනුමැතිය ගැනීම සඳහා එය මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කරනවා. අපි එය ප්‍රතික්ෂේප කරනවා. තමුන්නාන්සේගේ නියමය මෙහිදී පැරදුණත් තමුන්නාන්සේ ගැසට් නිවේදනය නිකුත් කිරීමත් සමගම එසේ වැඩිපුර අය කිරීම නීත්‍යනුකූල කරනවා. ඇයි මේ විධියේ ඉඩක් තිබෙන්නෙ?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)

අතරතුර කාල සීමාව අවුරුද්දක් වෙන්නත් පුළුවන්.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඔව්, අවුරුද්දක් වෙන්නත් පුළුවන්. අවුරුදු දෙක තුනක් වෙන්නත් පුළුවන්. අවුරුදු 5ක් වෙන්නත් පුළුවන්. ඒ අතර තුර කාලයේ අය කිරීම් සියල්ලම නීත්‍යනුකූලයි. කොහොමද ඒක වෙන්නෙ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
Those are usual provisions.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
" යුක්තිවල් " ද මොනවද කියා මා දන්නෙ නැහැ. මට ඕනෑ කරන්නෙ වැරද්දෙන් මහජනයා බේරාගන්නයි. මේ ක්‍රමය වැරදියි. මොකටද මේ පරණ කෝන්දරේම ඒ විධියටම ලිය ලියා ගෙනෙන්නෙ? ඒකද නීති සම්පාදනය කියන්නෙ? පරණ ඒවායේ තිබුණ පළියට ඒවා අනුමත කරන්නය කියලද අපට කියන්නෙ? මම ලැහැස්ති නැහැ ඒකට. මා කියා සිටින්නේ ගැසට් නිවේදනයක් මන්ත්‍රී මණ්ඩලයෙන් අනුමත නොකළොත්, එම නිවේදනය මගින් එතෙක් අය කරන ලද මුදල් සියල්ලම ආපසු ගෙවන්නය කියායි. එය මන්ත්‍රී මණ්ඩලයෙන් ප්‍රතික්ෂේප වූ හැටියෙම සම්පූර්ණ නිවේදනයම ක්‍රියා විරහිත වෙන්න ඕනෑ. ප්‍රතික්ෂේප වූ දෙයක් නීත්‍යනුකූල වෙන්නේ කොහොමද? එසේ නොකරනවා නම් මන්ත්‍රී මණ්ඩලයට ගෙනෙන්නේ මොකටද? මේක සම්පූර්ණයෙන්ම වැරදියි. ඒක මම පැහැදිලිවම ප්‍රකාශ කරනවා. ගරු ඇමතිතුමා මේ සම්බන්ධයෙන් කරන්නට යන්නේ මොකක්ද? මෙය සකස් කරන්නට ගරු ඇමතිතුමා සූදානම්ද?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)
ගරු ඇමතිතුමා සංශෝධනයක් භාර ගන්නට ලැස්තියි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මම එහෙම කිව්වෙ නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
තමුන්නාන්සේ වෙන දෙයක් හරි කිව්වද? මොකක්ද එහෙනම් තමුන්නාන්සෙ කිව්වේ? අහල කියන්නම් කියලාවත් කිව්වද ගරු ඇමතිතුමා?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
නැහැ, මම එහෙම කිව්වෙත් නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
මොකක්ද එහෙනම් පිළිතුර?

ගරු ඇමතිතුමාගෙන් මොනම පිළිතුරක්වත් ලබා ගන්නට බැරි වුණා නොවැ. මමත් මිනිත්තු පහළොවක්ම උත්සාහ කෙළේ පිළිතුරක් ගැනීමටයි. මා කී දේ ගරු ඇමතිතුමා අහගෙන හිටියේ නැහැ. එතුමා වෙන මොනවා නමුත් කර කර සිටියා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
නැහැ, මම අහගෙනයි හිටියෙ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
මා කියාපු දේවල් තේරුම් ගත්තා නම් ඒත් ඇති. කරුණා කරලා කාරක සභා අවස්ථාවේදී හදන්න.

ඊළඟට මම තවත් කාරණයක් මතක් කරන්නම්. අපි මෙපමණ කාලයක් මේ ගරු සභාවේදී යම් යම් අවස්ථාවල විදුලි බල දෙපාර්තමේන්තුව විවේචනය කළා. දෙපාර්තමේන්තුවේ දුර්වල තැන් පෙන්වා දුන්නා. දැන් සිද්ධ වෙලා තියෙන්නේ මොකක්ද? දැන් අපේ අයිතිය සම්පූර්ණයෙන්ම නැති කර තිබෙනවා. මේ පනතෙ 51 වැනි වගන්තිය බලන්න. ගරු ඇමතිතුමා එහි සඳහන් කර තිබෙන්නේ කුමක්ද?

"51. (1) මණ්ඩලයේ එක් එක් මුදල් අවුරුද්ද අවසන් වීමෙන් පසු හැකිතාක් ඉක්මනින් මණ්ඩලය විසින් ඒ වර්ෂය තුළ ස්වකීය බලතල හා යුතුකම් පාවිච්චි කිරීම හා ඉටු කිරීම පිළිබඳවත්, ස්වකීය ප්‍රතිපත්ති හා වැඩ පිළිවෙළ පිළිබඳවත් වාතර්තාවක් ඇමතිවරයා වෙත සැපයිය යුතුය. යම් වර්ෂයක් සඳහා වූ එබඳු වාර්තාවක් ඒ අවුරුද්ද තුළ ඇමතිවරයා විසින් මණ්ඩලයට කර ඇති යම් නියමයක් දැක්වීම ජාතික ආරක්ෂාවට අහිතකර වේය යන මතයක් ඔහු නිවේදනය කොට නොමැත හොත්, එහි ඒ නියමය දැක්විය යුතුය. ඇමතිවරයා විසින් ඒ වාර්තාවේ පිටපතක් උත්තර මන්ත්‍රී මණ්ඩලය වෙත හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙතද ඉදිරිපත් කළ යුතුය."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]
මෙහි පළමුවැනි කොටස බලන්න. අවුරුද්ද ඉවර වුණාට පස්සේ වාර්තාවක් එවන්නට ඕනෑය කියනවා. ගරු ඇමතිවරයාටයි එය එවන්නට ඕනෑ. මෙපමණ කලක් තිබුණේ කොයි ආකාරයටද? මෙපමණ කාලයක් අවුරුද්ද පටන් ගන්නට පෙර ඒ ඒ දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තු සාකච්ඡා කරන විට අපට විදුලි බල දෙපාර්තමේන්තුව විවේචනයට ලක් කරන්නට පුළුවන්කමක් තිබුණා. ඒ අනුව, ඉදිරි කාලයේදී ඉතාමත් ප්‍රවේශමින් වැඩ කරන්නට නිලධාරීන් මහන්සි ගන්නවා. දැන් නිලධාරීන්ට එවැන්නක් වුවමනා කරන්නේ නැහැ. ඇයි? අවුරුද්ද අවසානයේදී වාර්තාව ලියන නිසයි. වාර්තාව ගරු ඇමතිවරයා වෙත එව්වාම කුමක් වෙනවාද? නැවතත් ඒ කොටස මම කියවන්නම්:

"යම් වර්ෂයක් සඳහා වූ එබඳු වාර්තාවක් ඒ අවුරුද්ද තුළ ඇමතිවරයා විසින් මණ්ඩලයට කර ඇති යම් නියමයක් දැක්වීම ජාතික ආරක්ෂාවට අහිතකර වේය යන මතයක් ඔහු නිවේදනය කොට නොමැතහොත් එහි ඒ නියමය දැක්විය යුතුය."

ඇමතිවරයා කළ නියෝගයක් ජාතික ආරක්ෂාවට අහිතකරයයි හිතුනොත් මේ වාර්තාවේ ඒක ලියන්නට ඕනෑ. ඇමතිවරයා කර තිබෙන නියෝගයක් දැක්වීම අහිතකර යයි නිවේදනය කර තිබුණොත්, ඒ වාර්තාව එතැනින් නවතිනවා. ඒක ඉතින් මෙහාට එන්නේ නැහැ. ගරු ඇමතිතුමා ළඟදී මැතිවරණයක් එහෙම එන නිසා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රිවරුන් ඉන්න අසුවල් අසුවල් ආසනවල මේ මේ වැඩ කරන්නට ඕනෑයයි නියෝගයක් නිකුත් කළායයි හිතමු. එය ජාතියට අහිතකර යයි සංයුක්ත මණ්ඩලයේ අය කල්පනා කරනවා නම් ඒ ආකාරයට ඒ අය තමන්ගේ වාර්තාවේ ලියනවා ඇති. එතකොට ඒක ගරු ඇමතිතුමා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට හෝ උත්තර මන්ත්‍රී මණ්ඩලයට හෝ එවන්නේ නැහැ. ඒකටත් බලය තිබෙනවා. කොහොමද මේ නීති කොපි කෙළේ ගරු ඇමතිතුමා? ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේ මේවා මෙහාට එවන්නට ඉස්සර වෙලා කියෙව්වාද? මේවා කරන්නේ මහජන මුදලිනුයි. ඒ නිසා මහජනයාට හිතකර දේවල් කෙරෙන්නටත්, ඒවා මහජනයාට දැනගන්නටත් විධිවිධාන සැලැස්සිය යුතුව තිබෙනවා. ඇමතිවරයාට අහිතකර ඒවා මෙහාට ඒම නවත්වන්නටත්, හිතකර ඒවා එවන්නටත් හොඳ නැහැ. තමන්ට අහිතකර ඒවා පෙන්වන්නට බැදී නැහැ කියලා එතුමා කියාවී. ගරු ඇමතිවරයාගේ පෞද්ගලික නියෝගයක් ගැන නොවෙයි මා සඳහන් කරන්නේ. එතුමා විදුලි බල සංයුක්ත මණ්ඩලයට කරන නියෝගයක් ගැනයි මා කථා කරන්නේ. මෙය නිකම් නොවෙයි හොඳට කියා තිබෙනවා. 51 (1) වැනි නියෝගය ඉතාම පැහැදිලියි.

ගරු කථානායකතුමනි, පරණ පනත් වල තිබුණු පලියට හැම දෙයක්ම ඒ ලෙසින් බාර ගන්න අප ලැහැස්ති නැහැ. අප තේරුම් ගන්න ඕනෑ ඒවායින් හිතකර මොනවාද අහිතකර මොනවාද කියා. ඉස්සර කාලයේ නම් නොවැම්බර, දෙසැම්බර මාසවල වහිනවා; ස්වභාවික උල්පත් ඇති වෙනවා; ස්වභාවික අන්ද මට ජලය ලැබෙනවා. දැන් එම ස්වභාව වෙනස් වෙලා. කැලෑ ටික එළිකර දැමීම නිසා නියම කාලයට වර්ෂාව ලැබෙන්නෙ නැහැ; ජලය නොමැති නිසා විදුලි බලයත් නැහැ. කැලෑ කපන්න ඉඩ දුන්නෙත් තමුන්නාන්සේයි. ඒ නිසා වෙනත් කෙනෙකු ඊට වරදකාරයා ලෙස අල්ලන්න පුළුවන්කමකුත් නැහැ.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
I do not think this provision regarding national security which you have introduced in Clause 51 is the usual provision.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
ජාතික ආරක්ෂාව ගැන කථා කරනවා. ජාතික කියන විට තමුන්නාන්සේලා පමණක්ද? අප ඊට ඇතුළත් නැද්ද? ජාතික ආණ්ඩුවය කියන විට ඔය පැත්තේ අය—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා** (අගලවත්ත)
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகலவத்த)*
(Dr. Colvin R de Silva—Agalawatta)

The fact that Rev. Ratnasara was cremated seven days after he was shot dead has at last been given in evidence in the coup case. In the same way the question of national security also might come in here.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ජාතියේ ආරක්ෂාව පිණිසය කියා ගරු ඇමතිතුමා ශ්‍රාවස්තියේ ඇති විදුලි බලය වෙනත් කටයුත්තක් සඳහා පාවිච්චි කළොත්, වෙනත් විධියකට පාවිච්චි කළොත්, අප පිළිස්සී මැරෙන්න පුළුවනි. ඒ ගැන පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කරන්න බැහැ. එපමණක් නොවෙයි; ජාතියේ ආරක්ෂාව පිණිසය කියා විදුලි බලය හිතුමනාප අන්දමට යොදන්න බලය දුන්නොත් තමුන්නාන්සේත් අපත් කපෝතියි. එම නිසා මේ කාරණය ගැන හිතන්න. මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ වගන්තියෙහි ඇති භයානක කම ගැන කල්පනා කර එය වෙනස් කිරීමට යම් පියවරක් ගන්නටය කියා.

ගරු කාථායකතුමනි, මෙහි 51 වන වගන්තියේ 2 වන ඡේදයේ මේ අන්දමට සඳහන් වෙනවා:

"(2) එක් එක් අවුරුද්ද තුළ ගණන් පරීක්ෂකාධිකාරීගේ වාර්තාව ලැබුණු කල්හි මණ්ඩලය විසින් පහත දැක්වෙන ලේඛන ඇමතිවරයා වෙත යැවිය යුතුය:

(අ) ඒ වාර්තාවේ පිටපත්; හා

(ආ) 49 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ පිළියෙළ කරන ලද ගිණුම් විස්තරයේ සහ සංඛ්‍යා ලේඛන වල පිටපතක්.

(3) (2) වෙනි උප වගන්තියේ සඳහන් වාර්තාවේ සහ විස්තරයේ පිටපත් ඇමතිවරයා විසින් උත්තර මන්ත්‍රී මණ්ඩලය වෙත හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය"

ගරු කථානායකතුමනි, කොපමණ කාල පරිච්ඡේදයක් ගත වෙනවාද, කොපමණ කාලයක් තුළදී ඉදිරිපත් කළ යුතු ද කියන කාල නියමයක් කර නැහැ. අප ස. තො. ස. ගැන මෙම ගරු සභාවේදී සාකච්ඡා කළ අවස්ථාවේදී පෙන්නා දුන්නා 1962 වර්ෂයට පස්සෙ ගණන් පරීක්ෂක වාර්තා ඉදිරිපත් කර නැතැයි කියා. ඇමතිතුමා ඒ අදහස ඒ අවස්ථාවේ දී පිළිනොගත්තත්, ඊට පසුව 1962 වර්ෂයට පසුව වාර්තා ඉදිරිපත් කර නැති බව පිළිගත්තා. මේ 1969 අවුරුද්ද. එතකොට පසුගිය අවුරුදු හයක කාලය තුළ ගණන් පරීක්ෂක වාර්තා ඉදිරිපත් කර නැති බව පෙනී යනවා. එහෙනම්, අපි මෙයින් පාඩමක් ඉගෙන ගෙන ඒ වරද නිවැරදි කරන්න දැන්වත් උත්සාහ දරන්නෙ නැත්තෙ මන් ද? මෙම පනතෙහි කොතැනකවත් සඳහන් වෙන්නෙ නැහැ, මෙ පමණ කාලයක් තුළදී ගණන් පරීක්ෂක වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය කියා. අවුරුද්දක් මදි නම් අනික් අවුරුද්දේවත් ඉදිරිපත් කළ යුතුය කියා නියමයක් තිබෙන්න ඕනෑ. එක් මුදල් වර්ෂයක් සඳහා ගණන් පරීක්ෂක වාර්තාව අනික් මුදල් වර්ෂයට පෙර ඉදිරිපත් කරන්න නියමයක් කිරීමට ඇමතිතුමා ක්‍රියා කළා නම් හොඳ බවයි කියන්න තිබෙන්නෙ. නමුත් මෙයින් විවෘත ඉඩක් දී තිබෙනවා; ඕනෑ කාලයක් තුළදී වාර්තාව ඉදිරිපත් කරන්න ඉඩ දී තිබෙනවා. වාර්තාව තමුන්නාන්සේට ඉදිරිපත් කර, රජයේ මුද්‍රණාලයට යවා මුද්‍රණය කර කටයුතු අවසන් කරන විට අවුරුදු හතරක් පහක් ගත වේවි. එතකොට අපට සියල්ල අමතකව ගොස් තිබෙන්න පුළුවනි. එම නිසා, එපමණ කාලයක් ගත වීමට පෙර——

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr .Tudawe)

ගරු කථානායකතුමනි, සභාවේ ගණ පූරණයක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොතිබියෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදි.**

**පසුව ගණපූරනයක් තුබූයෙන්—**

*சபை எண்ணப்பட்டு நிறைவெண் இல்லாததால் பிரிவு மணி அடிக்கப்பட வேண்டுமென ஆணையிடப் பட்டது.*

*பிறகு, நிறைவெண் இருந்ததனால்—*

*House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present—*

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

ගරු කථානායකතුමනි, සංස්ථාවන්ට මේ අන්දමට විවෘත ඉඩපහසුකම් සැලසීම නිසා ගණන් පරීක්ෂක වාර්තා ඉදිරිපත් කරන්න අවුරුදු පහ—හය ගත වෙනවා. මෙපමණ කාලයක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය කියා කාල සීමාවක් දී නැහැ. ඒ නිසා ඕනෑ තරම් හිතුවක්කාරකම් කරන්න ඉඩ තිබෙනවා. ඒ නිසා මෙපමණ කාල යක් ඇතුළත ඇමතිතුමා විසින් ගිණුම් වාර්තාව ඉදිරිපත් කළ යුතුයි කියා කරුණා කර සීමාවක් ඇති කරන්න. අවුරුද්දක් මදි නම් අවුරුදු එකහමාරක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය කියා නියමයක් කරන්න. මේ විධියට විවෘත ඉඩක් දී තිබීම කිසිසේත්ම සුදුසු නැහැ. නොයෙ කුත් විධියේ දූෂණකම්, හොර මැරකම් කර මින් ඒවා වසා ගැනීම සඳහා ගිණුම් වාර්තා ඉදිරිපත් නොකර සිටිනවා. අන්තිමට අවු රුදු 10 ක් පමණ ගත වූවාට පසුව වාර්තා ඉදිරිපත් කරනවා. එය ඉදිරිපත් කරන විට වෙනමම මන්ත්‍රීවරුන් පිරිසකුයි මෙහි සිටින්නේ. මේ කරුණු ගැන කිසිම දෙයක් නොදන්නා පිරිසක් සිටින විටයි වාර්තා ඉදිරිපත් කරන්නෙ. ඒ වන විට මහජන මුදල් නාස්ති කර අවසානයි. ඒ නිසා මහ ජන මුදල් ආරක්ෂා කිරීම සඳහා වගකිව යුතු මන්ත්‍රීවරයෙක් වශයෙන් මා ඉතාම තදින් ඉල්ලා සිටින්නේ කරුණාකර මෙයට කාල සීමාවක් නියම කරන්නය කියායි. ගිණුම් වාර්තාව මෙපමණ කාලයක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය කියා නියම කරන්න.

ගරු කථානායකතුමනි, මීට වැඩියෙන් කතා කිරීමට මා බලාපොරොත්තු වන්නේ නැහැ. අවසාන වශයෙන් මා කියන්නේ ඇමතිතුමාගේ මේ විදුලි බල සංස්ථා පන තින් එහි සේවකයින්ට පහර වැදී තිබෙන බවයි. දෙවන කරුණ නම් පළාත් පාලන ආයතන මගින් අද පවත්වා ගෙන යන විදුලි බල සේවය තමන් අතට පත් කර ගැනීමට ඇමතිතුමා විසින් නීති රීති පනවා තිබෙනවා. තමන්ට වුවමනා විධි යට ඒ කටයුතු කිරීමට හැකි වන සේ නීති රීති පනවා තිබෙනවා. තුන්වැනි කරුණ නම් මෙයයි. විදුලි බලයෙන් ලැබෙන ආදා යම කෙළින්ම මහජන කටයුතු සඳහා නැත් නම් මහජන සංවර්ධන වැඩ සඳහා යොදවා ගැනීම පිණිස මෙතෙක් කල් කෙළින්ම මහජන භාණ්ඩාගාරයට යැවෙන තත්ත්ව යක් තිබුණා. නමුත් මේ පනතින් එම තත්ත්වය නැති කර දමා තිබෙනවා. ඒ වගේම වෙනත් සංස්ථා පුද්ගලයන් එහෙම නැත්නම් ධනපතියන් සතු කළා වාගේ මෙයත් ඔවුන් සතු කිරීමේ චේතනාවෙන් මෙසේ විදුලි බල මණ්ඩල සංස්ථාවක් ඇති කිරීමට මෙවැනි පනතක් ගෙන ආ බවයි මගේ විශ්වාසය. කාලාන්තරයක් තිස්සේ මේ රටේ විදුලි බලය සංවර්ධනය කිරී මෙන් එක අතකින් රටටත් අනෙක් අතින් ජාතික ආදායමටත් සෑහෙන සේව යක් කළ හැකි වූ ව්‍යාපාරයක් මෙපමණ කල් අඩ පණ කරමින් සිටි, ඒ ව්‍යාපාරය ඉදිරියට ගෙන යාමට ඉඩ නොදෙමින් සිටි, මේ ඇමතිවරයාට සම්පූර්ණයෙන්ම චෝද නාව එල්ල කරමින් මේ පනතට මගේ විරුද්ධත්වයත් පළ කරමින් මගේ කතාව අවසාන කරනවා.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

The hon. Member referred to a Motion included in the Order Book and stated that it has been in the Order Book for one year and that the Speaker must ascertain why a date has not been fixed for debate. It is not the duty of the Speaker to fix a date. Hon. Members have got their remedy and if they want any Motion taken up they must use the normal channels and get a date fixed for a debate on that Motion.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3.30

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

ගරු කථානායකතුමනි, ලංකා විදුලි බල මණ්ඩලයක් පිහිටුවීමට ඉදිරිපත් කර තිබෙන පනත ගැන මන්ත්‍රීවරුන් කීප දෙනෙක්ම කතා කරන්නට යෙදුනා. ඒ වගේම මෙහි තිබෙන අඩුපාඩු ගැනත් කරුණු ඉදිරිපත් කළා. ඇත්ත වශයෙන්ම මේ විදුලි බල මණ්ඩලය මේ විධියට පිහිටුවීමට ගරු ඇමතිතුමා කල්පනා කර තිබෙන්නේ ලෝක බැංකුවේ ඉල්ලීම උඩ බව අප කවුරුත් දන්නා කාරණයක්. ගරු ඇමතිතුමා බොහෝ අවසථාවලදී, ප්‍රසිද්ධ වේදිකාවලදී කියා තිබෙනවා, ඇමෙරිකාව කියන විධියට රුසියාව කියන විධියට අපි වැඩ කරන්නේ නැත කියා. අපට අමෙරිකන් ඉංජිනේරුවන් හෝ රුසියන් ඉංජිනේරුවන් වුවමනා කරන්නේ නැත, අපට ලංකාවේ ඉංජිනේරුවන් ඉන්නවාය කියා එතුමා කියා තිබෙනවා. මේ පසු ගිය දිනක මාතර රැස්වීමකදීත්—කඹුරුපිටියේ මන්ත්‍රීතුමාත් එහි සිටියා—අපට ඇමෙරිකන් ඉංජිනේරුවන් හෝ රුසියන් ඉංජිනේරුවන් අවශ්‍ය නැත, ලංකාවේ ඉංජිනේරුවන් අපට ඉන්නවාය කියා එතුමා කිව්වා. මා දන්නේ නැහැ, මොන අදහසක් ඇතිව මෙවැනි ප්‍රකාශයන් කරනවාද කියා. දැන් මේ විදුලි බල මණ්ඩලය පිහිටුවීමට යන්නේ කාගේ වුවමනාවකටද ? අපේ වුවමනාවකටද ? ඇත්ත වශයෙන්ම මෙය කරන්න යන්නේ ලෝක බැංකුවේ වුවමන ව උඩයි. ඇමතිවරුන්ගේ බලපෑම් නිසා දැනට තිබෙන විදුලි බල දෙපාර්තමේන්තුව මගින් නියම විධියට වැඩ කරන්නට බැරි බවත් ඒ වගේම භාණ්ඩාගාර රෙගුලාසි නිසා දැනට ගෙන යන විදුලි බල වැඩ පිළිවෙල සාර්ථක අන්දමින් ඉදිරියට ගෙන යන්නට බැරි බවත් ලෝක බැංකුව පෙන්නුම් කර දී තිබෙනවා. එපමණක් නොවෙයි. ස්වාධිනත්වයෙන් යුක්තව දක්ෂ පුද්ගලයන්ට වගකීමක් ඇතිව අද වැඩ කරගෙන යන්නට පුළුවන් ක්‍රමයක් නැති බවත් ලෝක බැංකුව පෙන්වා දී තිබෙනවා. ඇත්ත වශයෙන්ම එය දෙපාර්තමේන්තුවේ වරද නොව ඇමති මණ්ඩලයේ වරදයි. මේ විදුලිබල දෙපාර්තමේන්තුව භාර ඇමතිතුමාගේ දුර්වලකම නිසා තමයි, අද සෑහෙන තරම් විදුලියෙන් මේ රටට ලබාගත හැකි ප්‍රයෝජන ලබා ගන්නට බැරිව ගොස් තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, අද විදුලි බලය කපා හැර තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. අද ජලය සැපයීම සීමාකර තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. මේ තත්ත්වයන් සියල්ලම ඇති වී තිබෙන්නේ ආණ්ඩුවේ වැරදි නිසයි. විදුලිය නැති වී තිබෙනවා. ජලය නැතිවී තිබෙනවා. පැවිල්ල ඇතිවී තිබෙන්නේත් මේ ආණ්ඩුව ගෙන යන ව්‍යාපාරවල වරද නිසයි. ගරු ඇමතිතුමා නම් කිව්ව, " දෙවො වස්සතු කාලෙන," කියා. එදා එතුමා දෙවියන්ගෙන් තමයි, වර්ෂාව බලාපොරොත්තු වුණේ. දැන් කියනවා වලාකුළුවලින් කෘත්‍රිම වර්ෂාව ලබා ගන්නට ඕනෑ කියා. මම එදා ඒ කාරණය කිව්වාම ඒක රුසියන් ධර්මයයි කිව්වා. දැන් එතුමා නියම කර තිබෙනවා. කෘත්‍රිම වර්ෂාව ලබා ගන්න ක්‍රියා කරන්න කියා. විශේෂයෙන් මාතර ගිහින් ආවාට පසු, දැන් දෙවියන් කෙරෙහි විශ්වාසය ටිකක් අඩු කරගෙන, ස්වභාව ධර්මය කෙරෙහි විශ්වාසය ටිකක් වැඩි කර ගෙන එතුමා වැඩ පටන් ගෙන තිබෙනවා. ඒ ගැන අපි බොහොම සන්තෝෂ වෙනවා. මාතර ඉන්නෙ ටිකක් උගත් මිනිසුන්. ඒ මිනිසුන් බොහොම විද්‍යාත්මක විධියටයි කල්පනා කරන්නෙ. ඒ නිසා මාතර ගියාම, මාතර හුළඟ වැදුණාම එතුමාගේ අදහස් වෙනස් වී දැන් වලාකුළුවලින් කෘත්‍රිම වර්ෂාව ලබා ගන්නට බලාපොරොත්තු වෙනවා යයි එතුමා මතක් කිරීම අපේ සන්තෝෂයට කාරණයක්.

ගරු කථානායකතුමනි, විදුලි බල මණ්ඩලය පත් කිරීමෙන් පසු විදුලි බල කටයුතු පාලනය කරන උදවියට වැඩිපුර බලතල දෙන්නට අදහස් කරනවා. ඉතාම සුදුසු පුද්ගලයන් ඉතාම සුදුසු ස්ථානවලට දමා කටයුතු කරන්නට බලාපොරොත්තු වෙනවා. එයින් වැටහෙන්නේ කුමක්ද ? විදුලි බල දෙපාර්තමේන්තුවේ සුදුසු පුද්ගලයන් දැනට සුදුසු තැන්වල නැති බවයි. මෙවැනි විදුලි බල මණ්ඩලයක් පිහිටුවා සුදුසු පුද්ගලයන්ට සුදුසු තැන් දෙන්නට පුළුවන් බව ලෝක බැංකුව මේ ආණ්ඩුවට කියා තිබෙනවා. ඒ වගේම එන්ගලන්තයේ විදුලි බල මණ්ඩලය ආදර්ශයට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

ගෙන සාකච්ඡා ආදිය මාර්ගයෙන් එහි උපදෙස් ලබාගෙන ඒ අනුව කටයුතු කර ගෙන යන්නය කියාත් ලෝක බංකුව මේ ආණ්ඩුවට උපදෙස් දී තිබෙනවා. ගරු කථා නායකතුමනි, යම් යම් අනපණත් සෑදීමේදී එන්ගලන්තය අනුගමනය කරන්නට ගිහින් තමයි. අද අපට මේ අමාරුකම්වලට මුහුණ පාන්නට සිදු වී තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, අපේ රටේ විදුලි බලය සීමා කරන්නට කිසිම හේතුවක් හෝ යුතුකමක් නැහැ. ලංකාවේ ස්වාභාවික තත්ත්වයන් දිහා බලන විට අපේ රටට පමණක් නොව අපේ රටට කිට්ටුවෙන් තිබෙන ඉන්දියාවටත් විදුලි බලය සපයන්නට තරම් පොහොසත් රටක් ලංකාව. අපේ ගංගා නියම විධියට සංවර්ධනය කරනවා නම් අපට පුළුවන් ලංකාවට විදුලි බලය දීල ඉන්දියාවටත් විදුලිය සපයන්න. එහෙත් මේ දුර්වල නිදිමත ඇමතිවරයකු යටතේ විදුලි බල දෙපාර්තමේන්තුව තිබීමේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි, මේ තත්ත්වය ඇති වී තිබෙන්නෙ.

පසුගිය දවසක ඇමතිතුමා මාතර ගිය වෙලාවකදී එක්සත් ජාතික පක්ෂයේ මාතර නායකයකු කියා සිටියා, මේ විදුලි බල ඇමතිතුමා සුදු ඇතෙක්ය කියා. ඊට සාක්ෂිය තමයි, කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා (පර්සි වික්‍රමසිංහ මයා.). එදා මාතරදී විදුලිබල ඇමතිතුමා, "සුදු ඇතකු" හැටියට හඳුන්වා දෙන්නට යෙදුණා. "සුදු ඇතා" යයි කියන්නේ කිසිම වැඩකට නැති වැඩි පුර වියදම් යන වැඩකටයි.

**ගරු ආර්. ප්‍රේමදාස (පළාත් පාලන ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(கௌரவ ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரும் தகவல், ஒலிபரப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியும்)*

(The Hon. R. Premadasa—Minister of Local Government and Parliamentary Secretary to the Minister of Information and Broadcasting)

"සුදු ඇතා" සුබ ලකුණක්.

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

"සුදු ඇතා" සුබ ලකුණකැයි පළාත් පාලන ඇමතිතුමා කියනවා. මට නම් පේන්නේ අසුබ ලකුණක් හැටියටයි. ජලය කපා හැරලා නම්, ජල විදුලි බලය කපා හැරලා නම් එතුමා සුබ ලකුණක් හැටියට හඳුන්වන්නේ කොහොමද? කෙසේ වුවත් එක්සත් ජාතික පක්ෂයේ මාතර නායකයන් විදුලිබල ඇමතිතුමාට "සුදු ඇතා" යයි කීවත් මා නම් එසේ කියන්නේ නැහැ. අවුරුදු ගණනාවක්ම විදුලිබල අංශය භාරව තිබුණේ මේ ඇමතිතුමාටයි. ඒ අවුරුදු ගණනාව තුළ විදුලි බලය නියම විදියට සංවර්ධනය කළා නම් ඇත්තෙන්ම දකුණු ඉන්දියාවටත් විදුලි බලය දෙන්නට ඉඩ තිබුණා නේදැයි මා එතුමාගෙන් ප්‍රශ්න කරන්නට කැමතියි. ඇමතිතුමාගේ දුර්වලකම නිසා දකුණු ඉන්දියාවට තබා ලංකාවට වුවමනා කරන විදුලි බලයවත් සපයන්නට පුළුවන් වී නැහැ. ග්‍රාමීය විදුලි බල යෝජනා ක්‍රමය යටතේ ගරු ඇමතිතුමා ගම් කීයකට විදුලි බලය සපයා තිබෙනවාදැයි මා අහන්නට කැමතියි. මාතර අවට නම් එකම ගම කටවත් විදුලි බලය දෙන්නට පුළුවන් වී නැහැ. 1964 දී ගස් කපා කණු හිටවන්නට යෙදුණා. ඒ පාරවල තවමත් ඒ කණු ඒ විධියටම තිබෙනවා. මඩිහ-ගොඩගම ගම්සභා ප්‍රදේශයේ සහ නාවිමන—මාකවිට ගම්සභා ප්‍රදේශයේ මාතර සිට වල්ගම දක්වා, මාතර නගරයේ සිට ගොඩගම දක්වා, මාතර නගරයේ සිට තල්පාවිල දක්වා, මාතර නගරයේ සිට වෙහෙරහේන එසේ නැත්නම් ඉතාමත්ම වැදගත් සංස්කෘතික මධ්‍යස්ථානයක් වන වෙහෙර හේන පන්සල දක්වා, යන මේ එකම මාර්ගයකටවත් තවම විදුලි බලය සපයා නැහැ. ගොළුබෙලි ගමනින් ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළකුයි, විදුලි බල ඇමතිතුමාට තිබෙන්නේ.

තමන් වැඩ කරන බවක් විදුලිබල ඇමතිතුමා කියනවා. එහෙත් එතුමාගේ වැඩ සිදු වන්නේ මේ ආකාරයෙන් බව මාතර මන්ත්‍රීවරයා හැටියට කනගාටුවෙන් ප්‍රකාශ කරන්නට මට සිදු වී තිබෙනවා. 1964 න් පසුව මාතර පළාතේ නම් කිසිම වැඩක් අලුතෙන් කෙරී නැහැ. මාතර පළාතේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කළ යුතු වැඩ ගැන මා මාතරදීත් එතුමාට මතක් කළා. එහෙත් මා කී දේවල් එතුමා ගණනකටවත් ගත්තේ නැහැ. එතුමා මගේ ඉල්ලීම් ගණනකටවත් නොගෙන යන්නට ගියා. පළාතේ මන්ත්‍රීවරයාට සල කන්නේ ඒ විධියටද? එතුමා සලකන්නේ එක්සත් ජාතික පක්ෂයේ කොළ කෝට් ඇඳ ගත් උදවියට පමණක්ද? මහජන නියෝජිතයන්ට සලකන්නේ නැද්ද? මා මේ ගැන කීම නිසා විදුලි බලය සැපයීම එතුමා තව දුරටත් කල් දමාවි. කොතරම් කල් දැම්මත් මාතර ආසනය දිනා ගන්නට බැරි බව මා ගරු ඇමතිතුමාට මතක් කරන්නට ඕනෑ. ඔය වගේ වැරදි වැඩ කර, මහජනයාට විදුලිබලය නොදී කඩා කප්පල්කාරී ක්‍රියාවල යෙදෙමින් සිට තමුන්නාන්සේලා මහා මැතිවරණයේදී ඉදිරියට ඒවි. [බාධා කිරීමක්] මාතර පැත්තේ රැස්වීම්වල කථා කරන්නට තමුන්නාන්සේත් ඒවි.

**ජෝර්ජ් කොතලාවල මයා.** (බණ්ඩාරගම)
*(திரு. ஜோர்ஜ் கொத்தலாவல—பண்டாரகம)*
(Mr. George Kotelawala—Bandaragama)
අපි එනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
තමුන්නාන්සේ සුප්‍රිම් උසාවියෙන් ආ මන්ත්‍රීවරයා නොවැ? M.S.C.—Member of the Supreme Court තමුන්නාන්සේ කියන ඒවා මෙම ගරු සභාව ගණන් ගන්නේ නැහැ; මහජනයා ගණන් ගන්නේත් නැහැ. තමුන්නාන්සේ මහජනයාගේ නියෝජිතයෙක් නොවෙයි. මහජන ඡන්දයක් ලබා නොගත්, කිසිම අයිතියක් නැති සුප්‍රිම් උසාවියෙන් මෙම ගරු සභාවට පැමිණි තමුන්නාන්සේ මගේ කථාවට බාධා කිරීම හරිද? එසේ කරන්නේ මොන බලයක් උඩද? මොන අයිතියක් උඩද?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
උන්නැහේත් මාතර ඒවි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
කවුරුන් මාතර ආවත් අප භය නැහැ. ඕනෑ කෙනකු ආවාවේ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
නිල්වලා ගඟේ කිඹුල්ලුන් ඉන්නවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
නිල්වලා ගඟේ ඉන්න කිඹුල්ලුන්ට අප ඒ තරම් භය නැහැ. භය වන්නෝ තමුන්නාන්සේලායි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
අප කිඹුල්ලුන් හීලෑ කරනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
තමුන්නාන්සේට කාන්තාවකවත් හීලෑ කර ගන්නට බැරි වුණු කොට කිඹුල්ලු හීලෑ කර ගන්නට පුළුවන් වෙයිද? මනුෂ්‍යයකු හීලෑ කර ගන්නට බැරි කෙනකුට ගඟේ යන කිඹුල්ලු හීලෑ කරන්නට පුළුවන්ද?

ගරු කථානායකතුමනි, ලංකාවට වුව මනා විදුලි බලය සැපයීමට ගරු ඇමතිතුමා මෙතෙක් ගෙන ගිය වැඩ පිළිවෙළ දෙස බලන විට ඒ කටයුත්ත සාර්ථකව කරන්නට එතුමාට පුළුවන් වේය කියා අපට විශ්වාස කරන්නට බැහැ. එහෙත් නියම විධියේ සැලැස්මක් ඇතිව විදුලි බල මණ්ඩලයක් පිහිටුවා අපේ රටේ ගම්මානවලට විදුලි බලය සැපයීමට පුළුවන් නම් ඒ මගින් විශාල කාර්මික විපර්යාසයක් ඇති කර ඒ ගම්වල ආර්ථික තත්ත්වයත් දියුණු කිරීමට පුළුවන් වෙනවා. එහෙත් අධිරාජ්‍යවාදී වැඩ පිළිවෙළ අනුගමනය කරන—ධනපති ක්‍රමය අකුරටම ක්‍රියාත්මක කරන—ආණ්ඩුවක් මගින් අපේ රටට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

වුවමනා විදුලි බලය ලබා දීමටවත්, ඒ විදුලි බලය ප්‍රයෝජනයට ගෙන කාර්මික සංවර්ධනයක් ඇති කිරීමටවත් පුළුවන් වන්නේ නැහැ. ඒ නිසා මේ අමාත්‍යාංශය කෙරෙහි—මේ ආණ්ඩුව කෙරෙහි—අපට කිසිම විශ්වාසයක් නැහැ. මේ මණ්ඩලය හොඳ අරමුණක් ඇතිව ආරම්භ කරන්නට යන මණ්ඩලයක් හැටියට භාර ගන්නට පුළුවන්. මේ මණ්ඩලය පිහිටුවා, ලබන මැතිවරණයෙන් පසු සමගි පෙරමුණේ ආණ්ඩුවක් මගින් මේ මණ්ඩලය ක්‍රියාත්මක කර ගම්බද ප්‍රදේශවලට විදුලි එළිය ලබා දෙන අතරම ඒ ප්‍රදේශවල කාර්මික සංවර්ධනයක් ඇති කිරීමට පුළුවන් වන නිසා මේ පනතට අපේ එකඟත්වය ප්‍රකාශ කරන්නට කැමතියි. මාතර නගරය අවට ගම්වලට විදුලි බලය ලබා දීමේ කටයුත්ත මේ වර්ෂය අවසාන වන්නට පෙර සම්පූර්ණ කරන ලෙස විදුලි බල දෙපාර්තමේන්තුවට නියම කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් නැවතත් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 3.43

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சி. பி. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

Various matters have been raised by various hon. Members. The hon. Member for Matara (Mr. Tudawe), quite apart from talking about "kimbulas" and all that, said that I am bringing this Bill at the request of the World Bank. I shall now read to the House an extract from a Cabinet Memorandum of the then Minister of Transport and Power. I read this once yesterday, but I shall read it again for the information of hon. Members. This is what the then Minister of Transport and Power said in 1957 :

"The World Bank has for some time been urging the Government to set up a corporation on the above lines"—

That is, on the lines of this Bill.

—"to take over the functions of the Department of Electrical Undertakings. Recently, "—

That was in 1959.

—"in connection with the application for a loan for Stage IIB of the Laxapana Hydro-electric Scheme, the Bank insisted that the establishment of such a corporation must be a prerequisite for the grant of the loan. The Government has given an undertaking that a corporation would be established within the shortest possible time and negotiations for the loan have been proceeding on that basis."

So you will see that an undertaking was given by a different and previous Government to establish a corporation —this undertaking was not given by the present Government--and a loan was obtained for Stage IIB of the Laxapana Hydro-electric Scheme.—[*Interruption*]. I am reading from a Cabinet Paper of 1959. It was in 1959 that the then Government negotiated for a loan for Stage IIB of the Laxapana Hydro-electric Scheme. The then Government had discussions with the workers and everybody else, and as you know the Bill was unanimously passed by the House but lapsed on prorogation of Parliament. So it is incorrect to say that the present Government is bringing this Bill at the request of the World Bank. As I said earlier, an undertaking was given by the late Mr. S. W. R. D. Bandaranaike of the then M. E. P. Government and not by the present Government. I am saying these things for purposes of record.

Some people have a habit of repeating that I had said I would give current to South India. Somebody else said that I had promised to give current to every bush. Well, this is the usual tactic of first telling a lie and then accusing somebody else of having said that lie.

I repeat again that an undertaking to establish a corporation was given by a different Government over ten years ago ; the undertaking was not given by the present Government.

As regards the officers of the department, Clause 32 is fairly clear. This is what Clause 32 (5) says :

"Every public officer of the Department whose post is abolished or deemed to be abolished under any of the proceding provisions of this section, shall be immediately offered employment by the Board on such terms and conditions as may be agreed upon by such officer and the Board."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

What are the terms and conditions? They are going to be new employees.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

In fact, with the consent of the Treasury we have appointed legal officers along with officials of the Department of Electrical Undertakings to work out the terms and conditions of the employees. They have not ccme to a decision, but the details are being worked out by the committee. On that committee are the General Manager and some of his officers and the officers of the Treasury and the Ministry of Land.

I said in my first speech that in the Committee stage I will bring an amendment to ensure that these employees will get terms of employment not less favourable than what they now enjoy. I gave this undertaking at the request of the Government Parliamentary Group. They wanted it specifically put in here as law. I said I shall do it at the correct time. I said that we will go before a Standing Committe of the House and that at that stage I will bring an amendment. I cannot say how it will happen, whether the fringe benefits will continue or will be converted into money value. I do not know what the railway warrants will come to and so on.

Clause 51 is about national security and is a reproduction from the old 1963 Bill. This clause is there in the old Bill that was passed by this honourable House unanimously. The same thing is reproduced, but if there is any objection to that I am quite prepared to consider at the correct time any recommendation made.

I find that certain hon. Members, a few of them, have a habit of criticizing in general without making any concrete suggestions. If a Bill or a particular clause is bad, they should give the reasons why they consider it bad and suggest amendments. This morning we had a Standing Committee in relation to a Lands Bill. The hon. Member for Habaraduwa (Mr. Prins Gunasekera) had suggested some amendments but did not turn up. However, I moved them on his behalf in the Standing Committee and got them passed because they were good.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

එයින්ම තේරෙනවා කොතරම් හොඳ යෝජනාද කියන එක.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

ඒක තමයි කියන්නේ. හොඳ යෝජනා අපි බාර ගන්නවා. එපමණක් නොවෙයි තමුන්නාන්සේලා වෙනුවෙන් අපි එම යෝජනා ඉදිරිපත් කර සම්මත කර ගන්නවා.

I just said how things are happening. If hon. Members who find things wrong make recommendations and suggest what should be done, it would be more useful; it is wrong to merely criticize because we are on this side and they are on that side. It is not worthy of the Parliament to which we belong.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

සංශෝධන ඉදිරිපත් කිරීමට නම් පනත් කෙටුම්පත ස්ථාවර කාරක සභාවකට යන්න එපායැ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

ඔව්. එය ගිය වාරයේත් මා කීවා.

This is going to be referred to a Standing Committee. At that time we shall consider all the recommendations made. Even if the hon. Members are not present, we will accept them if they are good. Some

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

Now, I do not know that the establishment of a Labour Secretariat in a centralized spot is going to be all that helpful. What are the departments that are going to be concentrated under this one roof ? What is the purpose of this ? The basic function of labour officers must be to function in the field. It is not a question of huddling in one place in close contact with each other, with canteens available to them, with all the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

staff facilities. The basic function of labour officers is one of law enforcement. Their job is in the field, in the factories, in the shops and in establishments, making sure that the rights of workers which had been so jealously safeguarded by legislation enacted by Parliament are properly secured. But what are you contemplating here ? Assuming your unit rate is going to be something like Rs. 30 a square foot, it means that you are providing 300,000 square feet of space to house your labour secretariat. How many officers do you have in your department to be housed in 300,000 square feet ? Just work it out and see. What you are contemplating is completely out of proportion to the head office staff. If the E. P. F. is what is involved, it has already been subordinated to the Central Bank and in practice the Central Bank is your agent for the collection of all the employees' provident fund monies. There is no question of our providing another Central Bank building at government expense to house a group of people whose responsibility basically is for the same work.

Very well, then, is it for the Employment Exchange ? Is it for the headquarters of Mr. Balasingham who seems to find it possible upon private letters issued by individuals to offer employment ? I have got one or two of those letters in my possession. I have been wondering whether they should be referred to the Hon. Minister directly or referred to some other authority. I propose to take it up with the Hon. Minister in the first instance. I actually hold a letter of appointment sent by Mr. Balasingham—issued by Mr. Balasingham —to one of my constituents requesting that he should be particularly appointed to a particular job. And for what ? The circumstances in which this man got this letter and the endorsement made on it reveal a fantastic story in regard to procedures adopted at the Employment Exchange. I do not know whether this is also planned to come under the Labour Secretariat. Is the Hon. Minister aware that this Mr. Balasingham is a strange gentleman ? He functions under your Ministry and was actually at one time private secretary to another Minister. Is it not a fact that this Mr. Balasingham deals in strange ways with letters written in different coloured ink and with particular instructions on how to dispose of persons who bring the letters, depending on the colour of the ink with which the letter is written ?

Have there not been instances in the Employment Exchange of free fights between women candidates coming for jobs who have discovered the significance of the different colour of ink, and have ultimately ended up pulling each other's hair off by their roots ? I refer to those seeking employment once upon a time at the Angoda Hospital, of all places. These are facts which the Hon. Minister ought to be aware of. If he is not, this kind of situation is something that cannot be countenanced. If Mr. Balasingham is called upon to explain how his signature in a letter appears in this form, if this is the procedure he adopts to employ people, which is completely beyond reproach within the aegis of the Labour Ministry, one begins to wonder whether any allegation in normal circumstances would be made against any officer who operates in that way. It would be extremely strange to find individual letters being offered to people with whom that particular public servant possibly has no contact, except upon some scheduled list or proper procedures. The suggestion can only be that in some improper manner employment is being found every day for individuals who for whatever reason are able to have access to individuals within your department and your Ministry.

Is it correct that a private secretary to a Minister should function as the principal employment agent, if I may say so, on behalf of the public service



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

and government corporations in this country ? Is it desirable ? Is it indeed wise ? Is it expedient ? Is it in the Minister's own interest that it should be so ? These are questions which are very material and germane particularly when discussing questions of the construction of a secretariat, and one cannot help wondering whether we are going to move the Employment Exchange to where it ought logically to be—much closer to the Hon. Minister, much closer to the Ministry, because, if his Private Secretary is also to function as the principal recruiting officer, it may well be that Lotus Road is too far away, and one should seriously consider the question of bringing it altogether much closer, under the same roof, where the same job can be performed, perhaps with greater efficiency, with less delay, and with less paper used in the transacting of business !

So, you see, questions about secretariats are not as simple as they seem. Rs. 10 million may seem a reasonable price to put up a grand building. I myself am not averse to spending money to render public service more efficient, but I am by no means convinced that the different aspects of the workings of the Ministry of Labour—and I have referred to some of them—are in any sense of the word efficient. I think I would be right in saying that there are deficiencies in law enforcement procedure, in regard to the methods of recruitment.

One does not mind it particularly if you want to say that you are employing people even where you have no vacancies—like the Minister of Nationalized Services. He creates the vacancies himself, and he fills them ; and he does not bother. That is one very good approach, and I think he won plaudits from the last U. N. P. conference for doing it. As a good party man that is fair enough, and when he wants to regard the Nationalized Services in that way, well, that is one approach. I am not saying that he is the only one who did that. I think the Prime Minister, if he was here and if he did not get angry and walk across and want to attack us as he sometimes does when he goes berserk, assuming that he does not run amok and assuming that the Minister of Social Services decides to keep his tie on, then all I can say is that you will immediately find a situation where they would laugh and say, " Oh ! but in the C. W. E. in the old days did not similar things happen ? " Well, may be, they did, and I am not defending that. But neither the C. W. E. nor the nationalized services, the C. T. B. of the Minister, constitutes the Public Service.

The Minister of Labour and Employment is concerned primarily with the Public Service and recruitment to different grades, maybe, labour grades may be unimportant jobs. People are called for interviews according to the vacancies available in different departments, and if you know the correct approach to Mr. Balasingham you can get there, you can get your name on the list.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

And the correct ink also !

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

And the correct ink. Of course, they give it to you in different colours. Unfortunately, the people have a knack of opening these envelopes and checking the colours, and then there is a free fight as I said. The hon. fair Member for Galigomuwa will probably remember the " famous " incident when they had to cancel the entire interview and start all over again at the Mental Hospital in Angoda ! I think the Minister of Scientific Research was at that time Minister of Health, and he may recall this incident of the " famous " row where the women who came for the interview found the letters in different inks and had a free fight.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන (විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස ඇමති)**

*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன—விஞ்ஞான ஆய்வு, வீடமைப்பு அமைச்சர்)*

(The Hon. M. D. H. Jayawardena—Minister of Scientific Research and Housing)

It happened recently.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**

*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*

(Mr. F. R. Dias Bandaranaike)

He says it happened recently. It proves my point. He is doing even more scientific research than I thought was possible! So, you can see that what I am saying carries with it the stamp of authority by one who knows, and when he says it I think it proves my point far better than I could ever dream of making it.

But you cannot do this. You must change the system and you cannot have it going on under the guise of pretending that labour secretariats are going to make the Ministry work better. As a matter of fact, the Ministry of labour is full of gems of this kind. You find it loaded. Instances can be multiplied and proliferated at will, and all I can say is before you start thinking of better buildings into which to put these gems, you had better start thinking in terms of your doing a rooting out process. Change the system, put it at least on a solid foundation.

You, Mr. Minister, had a reputation of being a Mayor once upon a time of this, our City, and of doing, according to some people at least, a very good job of work. At least try to maintain some of the standards that you created then, in the present Ministry of Labour to which you now belong. It is a greater responsibility than you had in the past and a responsibility which I have no doubt you are capable of fulfilling. But please remember that ultimately these things tend to leave a black trail. Sometimes it is not your fault, but, when you are called upon to account and when you are attacked in Parliament in this way, it is not entirely for your own sins alone, it is for the fault of allowing the subordinates below you to get away with it. It is not your function, if I may say so respectfully, to defend those underlings and running dogs in the Ministry when they default and work against the interests of the people of our country. I am not suggesting for a single moment that you are obliged to appoint one S. L. F. P. man to every U. N. P. man appointed through the Employment Exchange. I do not want the quota of numbers. I am not suggesting that.

Let the Ministry of Nationalized Services, the C. W. E., the Salu Sala and places of that order try to create favourites if they can as the Hon. Prime Minister used to say those days of the C. W. E. He said that the men whom the S. L. F. P. appointed to the C. W. E. from Dedigama ended up as his strongest supporters. May be there is a lesson or a moral in that. I do not know. Our experience is that all the new recruits to the C. T. B. are now joining the left-controlled unions. All the best boys of Mr. Sugathadasa are going straight to the left-controlled unions. The same is true of the National Textile Corporation, but it does not matter. As far as we are concerned it makes no difference. The employment of one more person in our country from our point of view is an achievement. Considering the way you are going and utilizing the resources you have, if you are able to employ a single soul it is something gained. Of course, a lot of employment is provided on the basis of throwing out a few and then engaging a few new ones in their place. That does not solve anything.

The Labour Secretariat that you have in mind here is a venture to which I personally find it is difficult to subscribe in the absence of a far better explanation as to what exactly you have in mind, how you are going to improve the situation by the present proposal you have made, before Rs. 10 million is voted. We have a knack of passing millions of rupees

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

without any question. We do sometimes sanction a token vote of Rs. 10 —[*Interruption*]. Well, if you talk of the hon. Member for Minuwangoda (Mr. de Zoysa Siriwardena) and the fact that he wanted a Labour Secretariat, I agree that as Minister of Labour he did want to build one. The reason for the Minister wanting to build it at that time—I do not know the amount he had in mind or what he was contemplating—was that he found he was paying a large sum by way of rent for the Eastern Bank Buildings those days. From the Eastern Bank Buildings he moved to Hemas Buildings and still paid a high rent. Then he said, "Look, it will be cheaper to put up a building to house some of these offices". But that was before the E. P. F. organization was run by the Central Bank; those were the days when the E. P. F. was actually run directly under the control of the Labour Department. That is where the difference comes in. So, do not quote the authority of the hon. Member for Minuwangoda for your proposals.

As Minister of Finance at that time I am perfectly well aware of what the hon. Member for Minuwangoda proposed as Minister of Labour, and do not think I have forgotten them, and that you are able to catch me unawares by simply telling me that those proposals emanated from the hon. Member for Minuwangoda. That argument will not convince me one little bit and even then the hon. Member for Minuwangoda was met with exactly the same points I am making now—the unit rate per square foot, cost of buildings, the number of square feet required, the total number of people to be housed and the very purpose for it. Of course, at that time too the question of the site of the building cropped up, and as the hon. Member for Colombo South (Mr. Bernard Soysa) pointed out, it has been the knack of Ministers of all Governments to look to the Anderson Golf Links with covetous eyes whenever they were short of space to put up a building. It is a remarkable thing. There is hardly a single Minister I am aware of who at some time or another did not contemplate putting up all manner and types of constructions at the Golf Links in Narahenpitiya. I, at one time contemplated putting up a general secretariat at the Anderson Golf Links as Minister of Finance. On another occasion I thought of putting up a dry fish store at the Anderson Golf Links. I think it is fortunate that in the interest of the hon. Member for Colombo South that my plan did not materialize because possibly no other building, a Labour Secretariat or otherwise, could have been put up in the vicinity if a dry fish store had actually come up there.

So the need for building is a fact; the need for facilities is a fact. But apart from trying to concentrate a few labour officers you have got who are spending far too much time in their offices making bogus detections and withdrawing prosecutions, or trying to run a labour exchange on the strangest principle of absolutely —pardon me for saying so—blatant dishonesty, prevailing under the authority and political patronage of the Balasingham I referred to, I think it is high time that the Hon. Minister tried to clean the Augean stables before he tries to modernize the stables and provide better feeding troughs and better quarters for the horses whom he is trying to keep in them.

අ. භා. 5.44

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரோரா)
(Dr. N. M. Perera)

There is something a little curious in this estimate. I must say it is rather laconic. For Head 158—Minister of Labour and Employment—the original provision estimated in 1968-69 is Rs. 700,000. The revised provision for 1968-69 is. Rs. $3\frac{1}{2}$ million. The additional sum required for 1968-69 is Rs. 2,800,000. Now, I looked up the estimate for 1968-69. I find that on page Q-5, Head 158, Vote No. 2, Administration Charges, Capital Expenditure, the total sum provided is Rs. 700,000. In respect of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the labour secretariat, the total estimated cost is Rs. 4,900,000. Estimated expenditure up to 30th September, 1968 already passed, that is at the end of last year, is Rs. 4,200,000. Therefore, actually they expected to have spent by 30th September 1968, at the end of last year, Rs. 4,200,000 of their estimated expenditure, and only Rs. 700,000 was left to be expended.

Now, the Hon. Minister comes before this House and places an estimate, for how much? Rs. 2,800,000, on the basis that the revised provision for 1968-9 is Rs. 3½ million. From where did you get all this? This is not in the Budget Estimates. The Budget Estimates say that at the end of 1968, that is by the end of September 1968, Rs. 4,200,000 would have been spent. You cannot now come here with an estimate showing the revised provision as Rs. 3,500,000. Where do you get this Rs. 3,500,000? What is more, look at the explanation: It is the most laconic and uncommunicative explanation—

"The sum of Rs. 2,800,000 now asked for is required during the current financial year to meet the cost of construction of Labour Secretariat, Narahenpita, at a revised total estimated cost of Rs. 10 million."

How does that happen? Suddenly this has come up to Rs. 10 million. I want to ask the Hon. Minister of Finance, what is happening in your Treasury? In my time when the estimates came up the Minister of Finance vetted the estimates. He must satisfy himself as to the accuracy of the figures placed before him. He okays this estimate. Then in the Cabinet he supports it. Where are you, Mr. Minister of Finance? The Minister of Labour is asking this House, apparently with your sanction, a sum of Rs. 10 million. Where is your estimate of Rs. 10 million? Your own revised estimate is Rs. 4,900,000, and you had only to provide Rs. 700,000 to complete the whole business. Now you are telling us that you are going to spend Rs. 10 million. That is more than double the original estimate. What has happened? Have you modified the whole thing? Have you increased the number of—[*Interruption.*]

ගරු එම්. එච්. මොහමඩ්
(*கௌரவ எம். எச். முகம்மது*)
(The Hon. M. H. Mohamed)

I will explain.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(*கலாநிதி என். எம். பெரேரா*)
(Dr. N. M. Perera)

That is what you should have done at the start. Are you going to give an explanation after I have spoken? Are we getting another chance of speaking after him?

ගරු එම්. එච්. මොහමඩ්
(*கௌரவ எம். எச். முகம்மது*)
(The Hon. M. H. Mohamed)

I shall answer the hon. Member.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(*கலாநிதி என். எம். பெரேரா*)
(Dr. N. M. Perera)

What is the use of his answering? He must first give us an explanation of the proposal he is placing before the House. He cannot place before the House all sorts of fantastic explanations and say he will answer me. He must place a rational explanation before the House.

I blame the Hon. Minister of Finance. How did he come to sanction this money and how does he reconcile this with his own Budget proposals? There must be some basis on which this House is asked to vote money.

You say that an advance of Rs. 800,000 obtained from the Contingencies Fund will be repaid when the Supplementary Estimate is passed. Why did you go to the Contigencies Fund? There was no urgent expenditure. The Contingencies Fund can be utilized when there is urgent expenditure and money is required, but what is the urgency, in this expenditure? This

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

House is entitled to know what has happened. You cannot play ducks and drakes with the money of this country. That is what they did in the Colombo Municipal Council. They just expended money. They took money from here and there and they did all sorts of things. My good Friend who is seated there started a hospital without the sanction of the council. What is happening in this Government ? Surely we are entitled to know what is happening ?

You must give a decent explanation for this sudden jump in the estimate. Let us assume for a moment that the total cost has gone up to Rs. 10 million. Surely, a full explanation is required in the light of the fact that your original estimate placed before the House not long ago was revised up to 30th September 1968 ? The revised estimate was Rs. 4,900,000, and now you come here asking for Rs. 10 million without so much as a word as to how this Rs. 10 million has arisen.

You must tell us whether the number of storeys has been increased. It was originally, I think, a seven-storeyed building. Have you increased it to eleven storeys or have you increased the accommodation provided ? The Hon. Minister is entitled to say that prices have gone up. You will say that ! This is part of the hidden taxes you are now imposing. This is the price we have to pay for your devaluation. We have got no benefit from your devaluation. At the last auctions there was a drop of 20 cents in the tea prices, thanks to your devaluation. That is neither here nor there. These are the effects, I suppose, of your devaluation.

But, anyhow, you must give a reasonable explanation as to how the cost has gone up to Rs. 10 million. Either it must be a written explanation or else a verbal explanation. But the Hon. Minister gets up and says that he wants Rs. 2,800,000 without a word of explanation as to why there has been this increase. I do not think this is a satisfactory position so far as the House is concerned. I do not know if the Hon. Minister of Finance is satisfied with this kind of jugglery which passes off for the financial control that he is expected to exercise through the Treasury. I do not know what has happened to the Treasury because, to the best of my recollection, this sort of thing would not have been tolerated in the Treasury when I was there.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

The Hon. Minister of Labour will explain.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

How can he explain ? The Hon. Minister of Finance must explain what is happening in the Treasury. Have they all taken leave and gone away ? How can you possibly explain that you sanctioned this sum of money without even a note from the Hon. Minister of Finance as to why there is this enormous increase in the cost of building the secretariat. I do not know what is happening, but if the Government thinks it is all right, well, I wish them luck. In the process, I believe, the finances cannot be in very good shape. I suppose after me there is the deluge. It does not matter what happens after me. The Hon. Minister of Finance must be feeling quite comfortable.

So far as we are concerned we can understand this secretariat idea. If I remember aright, the then Minister of Labour was keen on building a secretariat because the Department of Labour was in a shanty building, and he wanted a better building. I can understand that. But you must give us reasonable explanations of what is happening. You cannot just say that you want a secretariat and keep on spending any amount of money. I think the original contemplation was

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

that there was, over a long period of time, going to be a certain amount of saving on the rents and on the moneys that the Department of Labour was spending in various ways. But I do not see that saving is taking place if the total amount that is going to cost you is Rs. 10 million.

අ. භා. ෟ.55

**එම්. තෙන්නකෝන් මයා.** (නිකවැරටිය)

*(திரு. எம். தென்னக்கோன்—நிக்கவெரட்டிய)*

(Mr. M. Tennakoon—Nikaweratiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කම්කරු ලේකම් කාර්යාලයක් සඳහා රුපියල් ලක්ෂ 28ක පරිපූරක ඇස්තමේන්තුවක් සාකච්ඡා කරන මේ අවස්ථාවේදී එක්තරා මූලික ප්‍රශ්නයක් ගැනත් අපේ සිත යොමු කළ යුතුව තිබෙනවා. එනම් රජයේ ගොඩනැගිලිවලට මුදල් වෙන් කිරීමේදී ප්‍රමුඛත්වය දෙන්නේ කෙසේද යන්නයි. රජයේ කාර්යාල සඳහා ගොඩනැගිලි සෑදීමේදී, රටේ ආර්ථික තත්ත්වය, වැඩවල අවශ්‍යතාව. ඒ ඒ වැඩවලට ප්‍රමුඛත්වය දිය යුතු පිළිවෙළ යන කරුණු සියල්ලක්ම එකට සම්බන්ධ කර කල්පනා නොකරනවා නම් අනවශ්‍ය ලෙස මුදල් වැය කිරීමක් සිදු වන්නෙ. වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා විශාල මුදලක් වියදම් කර වෙනම ගොඩනැගිලල්ක් හදා තිබෙනවා. මධ්‍යම බැංකුවට තවත් ගොඩනැගිල්ලක් හදා තිබෙනවා. තවත් තැනක තැපැල් දෙපාර්තමේන්තුවට ගොඩනැගිල්ලක් හදා තිබෙනවා. කම්කරු දෙපාර්තමේන්තුවට ගොඩනැගිල්ලක් සෑදීම සඳහා මෙතන රුපියල් ලක්ෂ 28 ක් ඉල්ලනවා. ඒ නිසා වැදගත් ප්‍රශ්නයක් පැනනගිනවා.

අද අපේ පළාත්වල ගුරුවරයකුට ගුරු නිවාසයක් නැහැ. ගුරුවරයා ගම්බද ප්‍රදේශවල අත්‍යවශ්‍ය සේවයක යෙදී සිටින කෙනෙක්. විශේෂයෙන්ම උතුරු මැද, වයඹ වැනි පළාත්වල පාසල්වලට ගුරුවරයකු පත් කරන්නට වුවමනා වුනාම ගුරු නිවාස නැත කියා ගුරුවරයකු පත් කරන්නට බැහැ. එසේ වුවත්, කොළඹ වැනි ප්‍රදේශවල දැනට තිබෙන ගොඩනැගිලිවලින් පිරිමසා ගන්නට පුළුවන්කම තියෙද්දී මේ අන්දමට මුදල් වියදම් කිරීම ගැන අප ටිකක් සැලකිලිමත් විය යුතුව තිබෙනවා. පුළුවන්කම තිබෙනවා නම් අලංකාරත්වය, සැප පහසුව, එක දෙපාර්තමේන්තුවක ගොඩනැගිලිවලට වඩා අනික් දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලිවල තිබිය යුතු ගම්භීරත්වය යනාදි කරුණු සියල්ලක්ම සැලකිල්ලට භාජන කර මුදල් වෙන් කළාට, මුදල් වියදම් කළාට වරදක් නැහැ.

රටේ මුදල් තත්ත්වය අමාරුය කියනවා. පුංචි පාලමක් හදා ගන්නට ගියාම, පාරක් අළුත්වැඩියා කර ගන්නට ගියාම, මාතෘ නිවාසයක ගොඩනැගිල්ලක වැඩ සම්පූර්ණ කර ගන්නට ගියාම, ගුරු නිවාසයක් හෝ පාසල් ගොඩනැගිල්ලක් හදා ගන්නට ගියාම මුදල් නැහැ කියනවා. බැංකුවලින් ණය දීම සීමා කර තිබෙනවා. සුළු වෙළෙන්දන්ට, පොදු මහජනයාට ණය ගන්නත් බැහැ. ඒ පහසුකම් කොයි විධියට නැති කර තිබෙනවාද කියා මා දන්නේ නැහැ. දවසින් දවසම පටි තද කර ගන්නටයි සිදු වෙලා තිබෙන්නෙ. අප සිටින්නේ එවැනි අමාරු තත්ත්වයක නම් මේ විධියේ අලංකාර ගොඩනැගිලි සඳහා අනවශ්‍ය ලෙස මුදල් වැය කිරීම පොදු මහජනයාගේ හිස පිට තවත් බරක් පැටවීමක් නොවේද කියා මා අහන්නට සතුටුයි. මේ ප්‍රශ්න සියල්ලක් ගැනම සැලකිල්ල යොමු කර ඒවා නිරාකරණය කරන්නට ඕනෑ. රජයේ ප්‍රයෝජනය සඳහාත්, රජයට සම්බන්ධ සංස්ථාවල ප්‍රයෝජනය සඳහාත් ගොඩනැගිලි සෑදීමේදී ඒකාබද්ධ සැලැස්මක්—වැඩ පිළිවෙළක්—සකස් කර මේ මේ වැඩවලට මේ මේ අන්දමට ප්‍රමුඛත්වය දිය යුතුය කියා තීරණය කර කට යුතු කරනවා නම් මීට වඩා හුඟක් හොඳ බව මා විශ්වාස කරනවා. එසේ නැතිව එක එක දෙපාර්තමේන්තු ප්‍රධානීන් නැත් නම් වෙනත් අය සැනසීම පිණිස ඔවුන්ගේ සැප පහසුව පිණිස එක එක්කෙනාගේ හිතුමනාපයට කටයුතු කිරීමට ඉඩදීම සුදුසු නැහැ. ඉරිගේෂන් දෙපාර්තමේන්තුවේ ලේකම් ගොඩනැගිල්ල විශාල මුදලක් වියදම් කර සාදා තිබෙනවා. එය ඇමෙරිකාවේ ගොඩනැගිල්ලක සැලැස්මක් අනුව මෙහි සාදා තිබෙනවා. අධ්‍යක්ෂවරයකුට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

මහාරාජා කෙනෙකු වගේ නැත්නම් ඇමෙරිකාවේ ජනාධිපති වගේ සැප පහසුකම් ලබා ගැනීමට ඒ විධියට ඒ ගොඩනැගිල්ල හදා ගත්තා. එහෙත් ඒ බර උසුලන්නට ඕනෑ කවුද? මේ රටේ පොදු මහජනතාවයි. පොදු ජනතාවගේ අවශ්‍යතාවයන් සඳහා අත්‍යවශ්‍ය පාසල් ගොඩනැගිල්ලක් සාදාගැනීමට රුපියල් විසිපන් දහසක පමණ මුදලක් වෙන් කරන්නට මුදල් නැහැ. අද පාරවල තත්ත්වය බලන්න. අබලන් පාරක් හෝ බෝක්කුවක් සාදා ගැනීමට මුදල් ඉල්ලුවොත් මුදල් නැහැ. මේ අන්දමට මුදල් වියදම් කිරීමේදී යම් ඒකාබද්ධතාවයක් නැත්නම් යම් සම්බන්ධතාවයක් ඇති කර යම් සැලැස්මක් ඉදිරිපත් කර පොදු මහජනතාවගේ ප්‍රයෝජනයට ප්‍රමුඛත්වය දී කටයුතු කළ යුතුව තිබෙනවා.

රුපියල් 28 ලක්ෂයක් කියන එක විශාල මුදලක්.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න (සමාජ සේවා ඇමති)**

*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன—சமூக சேவை அமைச்சர்)*

(The Hon. N. H. A. M. Karunaratne—Minister of Social Services)

පටන් ගත්තේ කොයි කාලෙද?

**එම්. තෙන්නකෝන් මයා.**

*(திரு. எம். தென்னக்கோன்)*

(Mr. M. Tennakoon)

පටන් ගැනීමේ ප්‍රශ්නයක් මෙතැන නැහැ. හැම දාම ඔවැනි ප්‍රශ්න නැඟීමෙන් වැඩක් නැහැ. ඒ පැත්තයි, මේ පැත්තයි හැම දාමත් ඔය විධියේ ප්‍රශ්න නඟන නිසයි ඔය පැති ක්‍රමය නැති කරන්න ඕනෑය කියන්නේ. ඔය නිසා තමයි, මේ රටේ මහජනයා ජීවත් වීමට අසීරු අන්දමින් දිනෙන් දිනම ප්‍රපාතයට වැටෙන්නේ. අර අය කළාද, මේ අය කළාද කියන ප්‍රශ්නය පැත්තකට දමා, පොදු මහජනයාට සිදු වන යහපත නැත්නම් අයහපත ගැන කල්පනා කර ක්‍රියා කරන්නට ඕනෑ.

ඒ ඒ දෙපාර්තමේන්තු බොහොම ලස්සණට තබා ගැනීම සඳහා මේ විධියට හිතුවක්කාර අන්දමින් මහජන මුදල් නාස්ති කිරීම සම්පූර්ණයෙන්ම වැරදියි. එම දෙපාර්තමේන්තු අලංකාරව තබා ගැනීමට වඩා වැදගත් ප්‍රශ්නයක් මෙතැන තිබෙනවා. රජය සතුව තිබෙන සීමිත මුදල් ප්‍රමාණය වියදම් කළ යුත්තේ, පොදු මහජනතාවගේ යහපතට ප්‍රමුඛත්වය දෙමිනුයි. හරියට කන්න, අඳින්න, ඉන්න නැති උදවිය අනන්තවත් ඉන්නවා. එහෙම තත්ත්වයක් තිබෙද්දී, තරමක හෝ පහසුකම් ඇති තැන්වලට තව තවත් පහසුකම් ලබා දීම සඳහා වැඩ කිරීම හරිද? කොටසක් අන්තදුක් විඳිද්දී, තරමක හෝ පහසුකම් භුක්ති විඳින කොටසකට තව තවත් පහසුකම් ලබා දීමේ න්‍යාය වෙනස් කරන්නට ඕනෑ. ඒ අනුව ගොඩනැගිලි ඉදි කිරීමේදීත් සමානාත්මතාව අනුව කටයුතු කරනවා නම් අපතේ යැවෙන මුදල් සම්භාරයක් ඉතිරි වන අතර, වියදම් කරන මුදලින් පවා මීට වඩා ප්‍රයෝජනයක් ලැබෙනවා. එම නිසා, රජයේ ගොඩනැගිලි ඉදිකිරීමේදී දැනටමත් තරමක හෝ පහසුකම් ඇති තැන්වලට තව තවත් පහසුකම් ලබා නොදී, විශේෂයෙන් පොදු මහජනතාවට වඩාත් ප්‍රයෝජන සැලසෙන ආකාරයට ඒකාබද්ධ සැලැස්මක් අනුව කටයුතු කරන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 6.54

**පර්සි වික්‍රමසිංහ මයා.** (කඹුරුපිටිය)

*(திரு. பேர்ஸி விக்கிரமசிங்ஹ—கம்புறுப்பிட்டிய)*

(Mr. Percy Wickremasinghe—Kamburupitiya)

නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් කථා කරන්නට මා කලින් අදහස් කරගෙන සිටියේ නැහැ. එහෙත් දැන් නම් මේ පිළිබඳව වචනයක් දෙකක් වත් කිව යුතුව තිබෙනවා. ඇමතිතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කිරීම සඳහායි, ඒ වචන ස්වල්පයවත් මා කථා කරන්නේ. කරුණාකර මේ යෝජනාව අත්හිටුවන්න. මේ වැඩය සඳහා රුපියල් කෝටියක් වියදම් වෙනවා. අද තත්ත්වයේ නියම ස්වරූපය පෙන්වා දෙමින් නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමා (එම්. තෙන්නකෝන් මයා.) පළ කළ අදහස්වලට මා එකඟ වෙනවා. මීට වඩා අවශ්‍ය දේවල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගම්බදව හා නගරබදව කොතෙකුත් තිබෙනවා. උදාහරණයක් හැටියට කොළඹ විශ්ව විද්‍යාලය ගෙන බලන්න. ගම්බද පළාත්වලින් පැමිණ එහි ඉගෙන ගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නවාතැන් ගැනීම සඳහා ප්‍රමාණවත් ගොඩනැඟිලි නැහැ. එම නිසා ඔවුන් අද ජීවත් වන්නේ බොහොම අමාරුවෙන්. ඔවුන් සඳහා ගොඩනැඟිලි ඉදි කිරීමට මුදල් නැතැයි කියනවා. එහෙත් කම්කරු කාර්යාලයක් සඳහා රුපියල් කෝටියක් වියදම් කරන්නට පුළුවන්කම තිබෙනවා. ඒ මුදල අර විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නවාතැන් පහසුකම් ලබා දීම සඳහා යොදවනවා නම් මීට වඩා ප්‍රයෝජනයක් ලැබෙනවා.

අපේ ගම්බද ප්‍රදේශවල සේවය කරන ග්‍රාම සේවක මහතුන්ට කාර්යාල පහසුකම් නැති බව ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා දන්නවා. ඔවුන්ගෙන් සමහර අය කාර්යාල පවත්වාගෙන යන්නේ අනුන්ගේ ගෙවල්වලයි. එම නිසා ඔවුන්ගේ රාජකාරිය හරිහැටි ඉටු කරන්නට පවා බාධා ඇති වෙනවා. ඒ වාගේම, පාඨශාලා ගොඩනැඟිලි අවශ්‍ය තරම් නැහැ. මුදල් තත්ත්වය අසතුටුදායක නිසා ඒවා ලබා දෙන්න බැරිය කියනවා. පාඨශාලා ගොඩනැඟිලි ලැබෙන්නේ දිස්ත්‍රික්කයකට එකයි, නැත්නම් දෙකයි. ඒ අනුව බලන විට ගම්බදව මෙන්ම නගරබදවද ගොඩනැඟිලි සම්බන්ධයෙන් විසඳිය යුතු ප්‍රශ්න අනන්තවත් තිබෙනවා. ඒ වාගේම, මේ අමාත්‍යාංශයේ පමණක් නොව වෙනත් අමාත්‍යාංශවලත් ගොඩනැඟිලි තදබදය පිළිබඳ ප්‍රශ්නය මීටත් වඩා තදින් බලපාන අවස්ථා තිබෙනවා. එවැනි තත්ත්වයක් තිබෙද්දී, කම්කරු කාර්යාලය සඳහා ගොඩනැඟිලි ඉදි කිරීම තව අවුරුද්දක් දෙකක් පමා කරන්නට බැරි ඇයි ? කෙසේ හෝ අමාරුකම් මධ්‍යයේ හෝ නිලධාරීන්ට මෙතෙක් වැඩ කරගෙන ආ විධියටම වැඩ කරගෙන යන්නට කියන්න. අද ආරෝග්‍යශාලාවල තත්ත්වය බලන්න. සෞඛ්‍ය ඇමතිතුමා මගේ කොට්ඨාශයට ගොස් මාතෘ නිවාසයක් විවෘත කළා. මාතෘ නිවාස විවෘත කරන්නට නම් එතුමා බොහොම හොඳයි. එතුමා මාතෘ නිවාසය විවෘත කර පළමුවන මාසයේදීම ළමයින් විසි පස් දෙනෙකු ලැබුණා. මාතෘ නිවාසය විවෘත කරන අවස්ථාවේදී මා මේ කටයුත්තට වැඩිය හොඳ පුද්ගලයකු නොවේය කියා කිව්වා. ඒ කෙසේ වෙතත් අද ආරෝග්‍යශාලා පිළිබඳව තිබෙන තත්ත්වය බලන්න. එදා ඒ මාතෘ නිවාසය විවෘත කළා. නමුත් එතැන වින්නඹු මාතාවන්ට, උපස්ථායකයන්ට ඉන්නට තැනක් නැහැ; නිවාස නැහැ. මේ අඩුපාඩුකම් ඇමතිතුමාට ඉදිරිපත් කළාම ඇමතිතුමා කියන්නේ අද තිබෙන තත්ත්වය අනුව ඒ පහසුකම් එකවරම සැපයීමට පුළුවන්කමක් නැතයන්නයි. ඔය විධියට අනන්ත අප්‍රමාණ ප්‍රශ්න තිබෙනවා. අපට දිනක් තිස්සේ වුවත් එවැනි ප්‍රශ්න ගැන කරුණු ඉදිරිපත් කරන්නට පුළුවනි. එවැනි තත්ත්වයක් තිබෙන නිසා කම්කරු ඇමතිතුමාට තව අවුරුද්දක් දෙකක් ඔය කම්කරු කාර්යාලය මෙතෙක් පවත්වා ගෙන ආ විධියටම ඉදිරියටත් පවත්වාගෙන යන්නට කියන්න.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

මාසයකට කුලී වශයෙන් රුපියල් 51,000 ක් ගෙවන්නට ඕනෑ.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

කුලී ගෙවන එක නොවෙයි ප්‍රශ්නය. අනිකුත් බැරුරුම් ප්‍රශ්න තිබියදී එකවරම රුපියල් කෝටියක් වියදම් කර අළුත් ගොඩනැඟිල්ලක් නොසෑදුවාට, දැන් ගෙවන කුලී අඩු කර ගැනීමට වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් වඩා හොඳයි. රුපියල් කෝටියක්ම වියදම් නොකර කෝටි භාගයක් පමණ වියදම් කර අද තිබෙන තත්ත්වයේ හැටියට සුළු ගොඩනැඟිල්ලක් ඉදි කරගෙන කටයුතු කරන්නට බැරිද ?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

පටන් ගත් එක නතර කරන්නට බැහැ නොවැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**පර්සි වික්‍රමසිංහ මයා.**

(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)

(Mr. Percy Wickremasinghe)

මා එක් කෙනෙකුට දොස් කියන්නට වත් තව කෙනෙකු වර්ණනා කරන්නට වත් කථා කරනවා නොවෙයි. එදා ඇමති වරයා වශයෙන් කටයුතු කළ මිනුවන්ගොඩ ගරු මන්ත්‍රීතුමාගේ (එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.) යෝජනාවක් අනුව මේක ආරම්භ කළා. මුදල් පිළිබඳව එදා තිබුණු තත්ත්වයත් අද තිබෙන තත්ත්වයත් දොම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) පැහැදිලි කර දුන්නා. එදා තිබුණු තත්ත්වය නොවෙයි ඊට හාත්පසින්ම වෙනස් තත්ත්වයකුයි අද තිබෙන්නෙ. එපමණක් නොවෙයි; තවත් කරුණු තිබෙනවා. මේවා මහජන මුදල්; සාංගික මුදල්. මෙවැනි අතුරු වැය ශීර්ෂ ඉදිරිපත් කරන විට පළමුවෙන් ඇස්තමේන්තු කළ මුදල කොපමණද, දුන් ඊට වඩා වැඩි මුදලක් අවශ්‍ය වී තිබෙන්නේ කුමන හේතුවක් උඩද, මේ මුදල අනුමත කළේ කවුද, භාණ්ඩාගාරය මේ සම්බන්ධයෙන් දෙන විස්තරය කුමක්ද යන මේ ආදී සියළුම විස්තර අප ඉදිරිපිට තබන්නට ඕනෑ. මේවා මහජන මුදල්. විරුද්ධ පක්ෂයේ සිටින අපත් මේවාට අතගසනවා. එමනිසා මේ කරුණු ගැන සලකා බලා පුළුවන් තරම් මේ මුදල අඩු කරන්න. රටේ අනිකුත් වැඩවලට මේ මුදලින් කොටසක්වත් යොදා ගන්නට වැඩ පිළිවෙළක් සකස් කළහොත් කම්කරු ඇමතිතුමාගෙන් ලොකු ප්‍රයෝජනයක් වුණාය කියා අපට කල්පනා කරන්නට පුළුවනි.

අ. භා. 6.10

**එස්. ද එස්. ජයසිංහ මයා.**

(திரு. எஸ். த எஸ். ஜயசிங்ஹ)

(Mr. S. de S. Jayasingha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ කම්කරු අමාත්‍යාංශයට වුවමනා කරන ගොඩනැගිල්ලට වැය වන මුදල සම්බන්ධව ඉදිරිපත් කර තිබෙන මේ පරිපූරක ඇස්තමේන්තුව යටතේ කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා අමාත්‍යාංශ කීපයක්ම සම්බන්ධ කර ගනිමින් ඉතාම ලක්ෂණ කථාවක් කරන්නට යෙදුණා. එතුමා කී සෑම දෙයක්ම පිළිගන්නවා. මේ රටේ පාසල් ගොඩනැගිලි ප්‍රමාණවත්ය කියා අප කියන්නේ නැහැ. අධ්‍යාපන ඇමතිතුමා ඒ සම්බන්ධව පියවර ගන්නවා. අධ්‍යාපන ඇමතිතුමාගේ වැය ශීර්ෂ ඉදිරිපත් වූවාම ගරු මන්ත්‍රීතුමා තම කොට්ඨාශයේ අඩුපාඩුකම් ඉදිරිපත් කළහොත් ගරු මන්ත්‍රීතුමාට තව ගොඩනැගිලි ලැබෙනවාට කිසිම සැකයක් නැහැ. මාතෘ නිවාස ගැනත් කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා කථා කළා. සෞඛ්‍ය ඇමතිතුමාගේ වැය ශීර්ෂ ඉදිරිපත් වූවාම ඒ අංශයෙන් තිබෙන අඩුපාඩුකම් ඉදිරිපත් කළහොත් සෞඛ්‍ය ඇමතිතුමාගේ දක්ෂතාවයත් වාසනා මහිමයත් උඩ තමුන්නාන්සේට තව තවත් මාතෘ නිවාස ලැබෙනවාට කිසිම සැකයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කම්කරු අමාත්‍යාංශයේ මේ ගොඩනැගිල්ල දුන් බොහෝ දුරට සෑදා අවසාන වන තත්ත්වයකයි තිබෙන්නෙ. මේ ගොඩනැගිල්ල තැනීම දුන් නවත්වන්නට ක්‍රමයක් නැහැ. අත්තිවාරම පමණක් දැමූ ගොඩනැගිල්ලක නම් තාවකාලිකව හෝ වැඩ නවත්වන්නට පුළුවනි. නමුත් මේ ගොඩනැගිල්ලේ දුන් තට්ටු දහයක් තනා වහළත් සවිකර අවසානයි. ඉතිරි වැඩ කටයුතු සම්පූර්ණ කිරීමයි දුන් කළයුතුව තිබෙන්නෙ. අවුරුදු තුනකට පෙරයි මේ ගොඩනැගිල්ල තැනීම ආරම්භ කළේ. එදා මෙන් නොවෙයි අද භාණ්ඩවල මිළ; කම්කරු වේතන ආදි සෑම දෙයක්ම ඉහළ ගොස් තිබෙන බව අප කවුරුත් දන්නවා. එම නිසා මුලින් කරන ලද ඇස්තමේන්තුව ප්‍රමාණවත් නොවන බව අප කවුරුත් පිළිගන්නට ඕනෑ.

අද කම්කරු දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි කොහේ විසිරී තිබෙනවාද යන වග මේ අවස්ථාවේදී තමුන්නාන්සේලාට පෙන්වා දීමට මා කැමැතියි. කම්කරු අමාත්‍යාංශය තිබෙන්නේ බෞද්ධාලෝක මාවතේ රජයට අයත් ගොඩනැගිල්ලක. ඊ. පී. එෆ්. හෙවත් මහ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජනයාගේ පාරිතෝෂික මුදල් ගෙවන කාර්යාලය පිහිටුවා තිබෙන්නේ "හේමාස්" ගොඩනැගිල්ලේ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය තිබෙන්නේ ලේක් පාරේ පිහිටි ගොඩනැගිල්ලක. මේ ආදි වශයෙන්, මෙමෙ දෙපාර්තමේන්තුවට අයත් කාර්යාල නගරයේ සී සී කඩ විසිරී ගොස් තිබෙනවා. මේ නිසා ඉක්මනින් වැඩ කරන්නට බැහැ. පාලනය ඉතාම අමාරුයි. මෙකී සියලුම අංශ එක් ස්ථානයකට ගෙනැවිත් ඒකාබද්ධ කිරීමේ වැඩ පිළිවෙළක් යෙදීමට අදහස් කෙළේ, දැනට වඩා ඉක්මනටත් දක්ෂ අන්දමටත් කටයුතු කිරීම අවශ්‍ය නිසායි. "අසුවල් නැනැත්තාගේ පාරිතෝෂික මුදල නොගෙව්වේ ඇයි" "අසුවලාගේ පාරිතෝෂිකය ප්‍රමාද වන්නේ ඇයි" ආදී වශයෙන් ගරු මන්ත්‍රීවරුන් නිතරම පාහේ අපෙන් ප්‍රශ්න අහනවා. මේ දෙපාර්තමේන්තුවට අයත් සියලුම අංශ ඒකාබද්ධ වී එක් තැනක තිබෙනවා නම් එවැනි ප්‍රමාද සිදු වන්නේ නැහැ.

මෙමෙ දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ සඳහා කොතරම් විශාල මහජන මුදල් ප්‍රමාණයක් ගෙවල් කුලී වශයෙන් පෞද්ගලික ගෙවල් හිමියන්ට ගෙවනවාද යන වග තමුන්නාන්සේලා දන්නවා ඇති. අප දැන් මාසයකට රු. 51,000 ක් ගෙවල් කුලී ගෙවනවා. ඒ අනුව අවුරුද්දක මුදල කොපමණද ? ඒ විධියට අවුරුදු 5 ක් තිස්සේ ගෙවන මුදල මෙවැනි ගොඩනැගිල්ලක් හැදීමට යන වියදමට සමාන වෙනවා. පාසල් ගොඩනැගිලි වුවමනා නැතැයි අප කිසිම මොහොතක කියන්නෙ නැහැ. විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට නවාතැන් පහසුව අවශ්‍ය නැතැයි අප කියන්නේ නැහැ. ඒ සෑම දෙයක්ම ඉතාම අවශ්‍යයි. මෙමෙ ගොඩනැගිල්ල හදන්නට පළමුවෙන් ඒ කරුණු ඉදිරිපත් කළා නම්, ඒ තර්ක පිළිගෙන අපට මෙය නතර කරන්නට තිබුණා. එහෙත්, දැන් නාරාහේන්පිට ලංගම කාර්යාලයට එහායින් ඉදි කොට ඇති මේ ගොඩනැගිල්ලේ තට්ටු 10ක් හදා වහල යේ කොන්ක්‍රීට් එකත් දමා අවසානයි. මේ අතිරේක මුදල ඉල්ලා සිටින්නේ ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ කටයුතු සම්පූර්ණ කිරීම සඳහායි. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ගේ සෑම තර්කයක්ම මා පිළිගන්නවා. ඒවා අනවශ්‍යයයි මා කියන්නේ නැහැ. මේකත් එවැනිම අවශ්‍යතාවක් උඩ පටන්ගත් දෙයක්. මෙමෙ ගරු සභාවේ වැය ශීර්ෂයක් සම්මත කරගෙන පටන් ගත් දෙයක්. මෙය අලුතෙන් පටන් ගැනීමක් නම්, විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් සමග මාත් එකඟ වෙනවා. එහෙත්, මෙය අලුතෙන් පටන්ගන්නා දෙයක් නොවෙයි. මේ මුදල ඉල්ලා සිටින්නේ, සියයට 90 ක් පමණ වැඩ අවසන් වී ඇති ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම සඳහායි. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ කරුණු ඒ ඒ අංශ භාර ඇමතිවරුන් විසින් සලකා බලනවාට කිසිම සැකයක් නැහැ. එම නිසා, මේ ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ ටික කර ගැනීමට තමුන්නාන්සේලා සියලු දෙනාගේ ම සම්පූර්ණ සහයෝගය ලැබෙනු ඇතැයි මා විශ්වාස කරනවා. එවිට, කම්කරු දෙපාර්තමේන්තුවේ සෑම අංශයක්ම එක් තැනකට ගත හැකි වීමෙන් දැනට වඩා ඉක්මනිනුත් කාර්යක්ෂම අන්දමටත් ඒ කටයුතු කර ගන්නට පුළුවන් වනවාට කිසිම සැකයක් නැහැ.

අ. භා. 6.16

**එච්. එම්. නවරත්න මයා.** (මිනිපේ)
*(திரு. எச். எம். நவரத்ன—மினிப்பே)*
(Mr. H. M. Nawaratna—Minipe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙමෙ සාකච්ඡාවට සහභාගි වීමට මා බලාපොරොත්තු නොවූ නමුත් උප ඇමතිතුමාගේ කථාවෙන් පසු මාත් මේ සම්බන්ධව වචන ස්වල්පයක් කථා කළ යුතුයයි අදහස් කළා. ලක්ෂ ගණනක මුදලක් වියදම් කොට කම්කරු මහ ලේකම් කාර්යාලයක් කොළඹ ඉදි කෙරෙන මේ අවස්ථාවේදී මිනිපේ වැනි ප්‍රදේශයක් නියෝජනය කරන මා වචන ස්වල්පයක් කථා කළ යුතුයයි මට හිතුණා.

මිනිපේ සිට මහනුවරට හැතැප්ම 48 ක දුරක් තිබෙනවා. මිනිපේ සිට බදුල්ලටත් එම දුරමයි. මිනිපේ ප්‍රදේශයේ මිනිසුන් මේ හැතැප්ම 48 දුර බස්වලින් මහනුවරට හෝ බදුල්ලට හෝ පැමිණ රැකීරක්ෂා කාර්යාලවල, කම්කරුවන් වශයෙන් ලියාපදිංචි වෙනවා. සතියකට වරක් හෝ දෙකක් හෝ කම්කරු නිලධාරියකු මිනිපේ ප්‍රදේශයට පැමිණ කම්කරුවන් ලියාපදිංචි කිරීමට පුළුවන් වන අන්දමට ඒ ප්‍රදේශ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එච්. එම්. නවරත්න මයා.]

යෙහි සාමාන්‍ය කම්කරු කාර්යාලයක් පිහිටුවන ලෙස මා මීට පෙරත් දෙපාර්තමේන්තුවට දන්වා යවා තිබෙනවා. එහෙත් අද වන තුරුත් එය කම්කරු දෙපාතීමේන්තුවෙන් ඉටු වී නැහැ. මා කම්කරු ඇමතිතුමාට ලිපි මාගීයෙන් දැනුම් දී තිබෙනවා, වඩුවන් පුහුණු කිරීමට කර්මාන්ත ශාලාවක් දී මිනිපේ වැනි නොදියුණු ප්‍රදේශයක ජනතාවගේ රැකී රක්ෂා ප්‍රශ්නය තරමක්වත් විසඳන්නය කියා. නමුත් කම්කරු ඇමතිතුමා ඒ ගැන කිසිත් පියවරක් අරගෙන නැහැ. මහා ලේකම් කායඝාලයක් විවෘත කරන්නය කියමින් ලක්ෂ ගණන් මුදල් ගන්නවා. දුප්පත් ගැමි ජනතාවට දෙපාතීමේන්තුවෙන් කිසිම සහනයක් සැලසී නැහැ.

කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා (පර්සි වික්‍රමසිංහ මයා.) කිව්වා වාගේ මා කෙළින්ම කියන්න කැමතියි, මිනිපේ ප්‍රදේශයේ පාසල් ගොඩනැගිලි සඳහා අධ්‍යාපන දෙපාතීමේන්තුවෙන් නම් කිසිම උපකාරයක් ලැබී නැති බව. ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාට පින් සිදු වන්නට උඩරට ගැමි පුනරුත්ථාපන යෝජනා ක්‍රමයෙන් තමයි මිනිපේ ප්‍රදේශයේ පාසල් ගොඩනැගිලි තනාගැනීමට පුළුවන් කම ලැබී ඇත්තෙ. ඒ නිසා ඇත්ත වශයෙන්ම මෙම වැය ශීෂීයෙන් ඉල්ලා තිබෙන මුදල් ප්‍රමාණය උඩ රට ගැමි පුනරුත්ථාපන යෝජනා ක්‍රමයට ලබා දෙනවා නම් මීට වඩා ලොකු සේවයක් මහජනතාව වෙනුවෙන් කරන්නට පුළුවන් වෙනවා ඇති.

කම්කරු ප්‍රශ්නයකටයි කියා මේ වෙන් කරන මුදල්වලින් ප්‍රයෝජනයක් වෙනවා නම් වෙන්නෙ නගරබද සුළු සංඛ්‍යාවකට පමණක් බව මා ප්‍රකාශ කරන්න කැමතියි. එහෙත් මා මුලින් සඳහන් කළාක් මෙන් මහනුවර දිස්ත්‍රික්කයේ ඇති ගම්බද ප්‍රදේශවල ගම්බද ජනතාවගේ රැකී රක්ෂා ප්‍රශ්නය සඳහා ලියා පදිංචි වීමට පවා හැතැප්ම තිස් හතළිස් ගණන් මග ගෙවා බොහොම දුකසේ කරදර මධ්‍යයේ යන්නට එහි ජනතාවට සිදු වී තිබෙනවා. එම නිසා ඒ ඒ ඇත ගම්බද ප්‍රදේශවලට සතියකට වරක් දෙවරක්වත් යම් කිසි නිලධාරියෙක් ගොස් රැකී රක්ෂා නැති ජනතාව ලියා පදිංචි කරවාගන්නවා නම් එය ඔවුන්ට කරනු ලබන මහත් සෙතක් වෙනවා නොවේද? මෙපමණ කලක් ඒ ඉල්ලීම ගැන ඇමතිතුමා කිසිම පියවරක් ගෙන නැහැ.

මා අවසාන වශයෙන් කියා සිටින්නේ අද මේ පරිපූරක ඇස්තමේන්තුව මගින් ඉල්ලන මුදල් ප්‍රමාණය උඩ රට ගැමි පුනරුත්ථාපන යෝජනා ක්‍රමයට දෙනවා නම් දුප්පත් ගැමි ජනතාවට මීට වඩා මහත් සෙතක් සලසා ගැනීමට පුළුවන් වන බවයි.

අ. භා. 6.19

**ගරු එම්. එච්. මොහමඩ්**
*(கௌரவ எம். எச். முகம்மது)*
(The Hon. M. H. Mohamed)

I must apologize to hon. Members that when I moved this Supplementary Estimate I did not give a detailed explanation. I gave an explanation which was as brief as possible because I did not expect this item to be reached early and I did not have the necessary papers with me. I hope hon. Members will appreciate the position.

I wish to point out that the present building that houses the Labour Department is condemned as unfit for human habitation by the P. W. D. and therefore there was general agreement in this House that a new building is a necessity. That was the impression I was able to gather in the course of the Debate.

The hon. Member for Yatiyantota (Dr. N. M. Perera) wanted certain figures. The usable floor area of that building is 146,000 square feet and it could provide accommodation for a staff of nearly a thousand persons.

The work actually commenced during the last Government. The foundation for this building was laid by the then Minister of Labour, the hon. Member for Minuwangoda (Mr. de Zoysa Siriwardena). I am informed that there was a big ceremony and speeches were made by the Ministers; and at that time they mentioned that the secretariat was

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

absolutely essential. It was a ten-storeyed building with all modern amenities. I think they called for tenders from the P. W. D. and the State Engineering Corporation but the Cabinet at that time decided to entrust the work to the State Engineering Corporation. They had estimated the cost to be Rs. 4.2 million and this was approved by the Cabinet on 5.1.64. The original estimate was Rs. 4.2 million. The work was entrusted to the State Engineering Corporation which submitted an estimate of Rs. 4.9 million. On a memorandum submitted by the Minister of Labour, the Cabinet at its meeting held on 5.1.64 approved an allocation of Rs. 4.2 million. The Cabinet at its meeting of 5.1.64 decided to allocate a sum of Rs. 4.2 million for the construction of the Labour Secretariat.

Then the reason for the increase has been this. At that time when these estimates were prepared some person had made a mistake. They had not taken into account the customs duty and they felt that this being a government department they would be exempted from the payment of customs duty, but the Minister of Finance had not given his approval because the work had to be done by the State Engineering Corporation and he had ruled that duty must be paid for the items imported.

A further increase was due to pile driving. The original estimate was for pile driving up to a depth of 40 feet. After the work commenced they found it necessary to drive the piles to an average depth of 55 feet.

There was also the question of additional and modified doors and window finishes. The number of doors provided in the original estimate was found to be inadequate. Window arangements had to be changed and substituted by windows with glass panes. The original estimate did not provide for certain essential finishes. The estimate was only for the structure. The partitions were not estimated for.

I agree it was most unsatisfactory. You will appreciate that I was powerless and I could not do anything. I had to get the building completed.

In regard to electrical fittings, the original provision was made for bare wiring. No provision had been made for lights and fans.

The ground floor was originally to be used for parking cars but later it was found necessary to house the library and departmental records on the ground floor because there was no accommodation elsewhere due to the weight involved, and it became necessary to provide for a special reinforced concrete floor with an enclosure with doors and windows. Then P. V. C. conduit pipes were required for telephone cables. These are the main reasons for the revision of the estimate.

When the matter was placed before the Cabinet the Prime Minister was very much concerned. The Minister of Finance made certain observations about the revision of the estimate. The Cabinet felt that there was something wrong with the whole thing and decided to appoint a committee to go into the matter and to find out whether any modifications were possible to reduce the cost.

The committee consisted of my Permanent Secretary as chairman ; Mr. L. C. Williams, Director of Public Works ; Mr. H. J. Billimoria, Chief Architect, P. W. D. ; and Mr. Sittambalam, Director of Finance. The committee examined all matters and reported—a copy of the report is available—that the revised estimate of Rs. 10 million was reasonable. The Minister of Finance then forwarded the report to the Cabinet stating that there was no alternative but to authorize the revised estimate of Rs. 10 million. The Cabinet agreed to this. The Supplementary Estimate is for an additional sum of Rs. 2.8 million for expenditure during the current financial year.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. එච්. මොහමඩ්]

I agree that the estimate procedure followed was most unsatisfactory. I have taken this over and am trying to get it completed as quickly as possible so that we may go into occupation of the building as early as possible.

With regard to the matters raised by the hon. Member for Colombo South (Mr. Bernard Soysa), I wish to state that almost all the departments will be housed in this building.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Including the E. P. F. section ?

ගරු එම්. එච්. මොහමඩ්
(கௌரவ எம். எச். முகம்மது)
(The Hon. M. H. Mohamed)

No. At present we have offices in the Y. M. B. A. building, in Hemas building, at Havelock Road, at Galle Road, and also at Jawatte. My idea is to keep the Colombo North offices in that place. The labour officers can operate from there.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

What about the Employment Exchange ?

ගරු එම්. එච්. මොහමඩ්
(கௌரவ எம். எச். முகம்மது)
(The Hon. M. H. Mohamed)

My idea is to allow it to remain where it is now.

Regarding labour tribunals, we have increased the number by two.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Yet the work is being held up.

ගරු එම්. එච්. මොහමඩ්
(கௌரவ எம். எச். முகம்மது)
(The Hon. M. H. Mohamed)

I agree that it is causing a fair amount of inconvenience to the people. We are doing our best to appoint additional presidents.

I want to bring to the notice of the House that I have reorganized the entire Employment Exchange. New staff have been appointed. I agree that there had been a certain amount of unsatisfactory procedures. I do not blame anybody for what had happened. Now I am introducing a scheme of numbering job cards. What happens is that when some person gets hold of a job card he just initials it. There have been two or three inatances where forgeries have been brought to our notice. We have handed those cases to the C. I. D. for investigation.

The hon. Member for Dompe (Mr. F. R. Dias Bandaranaike) spoke about certain letters. If he will kindly send those letters to me I am prepared to hold an inquiry in the presence of the hon. Member, and if any person is found guilty serious action will be taken against him.

Regarding labour officers, the hon. Member for Dompe made certain serious charges against them. I am not in a position to say anything at the moment. If the hon. Member will bring to my notice concrete instances, I assure him I shall hold a full and impartial inquiry.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## පරිපූරක මුදල: උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව – යන්ත්‍රෝපකරණ මිළ දී ගැනීම

## குறைநிரப்புத் தொகை : கண்டிய கிராம மறு சீரமைப்புத் திணைக்களம் : உபகரணங்கள் வாங்கல்

## SUPPLEMENTARY SUPPLY : KANDYAN PEASANTRY REHABILITATION DEPARTMENT : PURCHASE OF MACHINERY AND EQUIPMENT

අ. භා. 6.30

**ගරු ආචාර්ය දහනායක**

*(கௌரவ கலாநிதி தகநாயக்க)*

(The Hon. Dr. Dahanayake)

මෙම යෝජනාව මම ඉදිරිපත් කරනවා :

"1968 ඔක්තෝබර් 1 වැනි දසින් ආරම්භ වී 1969 සැප්තැම්බර් 30 වැනිදයින් අවසන් වන මුදල් වර්‍ෂය තුළ සේවය සඳහා ලංකාවේ ඒකාබද්ධ අර මුදලෙන් හෝ ලංකාණ්ඩුවේ වෙන කිසියම් අර මුදලකින් හෝ මුදල්වලින් හෝ ලංකාණ්ඩුවට සුදුස් සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ලංකාණ්ඩුව විසින් ණයට ලබා ගන්නා මුදලකින් හෝ රුපියල් දස ලක්ෂයකට (රු. 10,00,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර, එම මුදල මෙහි පහත පෙනෙන උප ලේඛනයේ නියමිත පරිදි වැය කළ යුතුය:—

**උපලේඛනය**

| | |
|---|---|
| ශීර්ෂය : 75—උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව. | රු. |
| සම්මතයේ අංකය : 3—පාලන ගාස්තු—මූලධන වියදම් ... | ... 10,00,000" |

මෙම යෝජනාව පිළිබඳව සංක්ෂේප විස්තරයක් කිරීමට මා බලාපොරොත්තු වෙනවා. යන්ත්‍රෝපකරණ මිළ දී ගැනීම සඳහා රු. 10,00,000 ක් උවමනා කරනවා. උඩරට ගැමි පුනරුත්ථාපන යෝජනා ක්‍රමය යටතේ 1965-66 මුදල් වර්ෂයේ සිට සෑම වර්ෂයකම විශාල මුදලක් වැය කරමින් පුළුල් නිර්මාණ වැඩ සටහනක් ඉටු කිරීමේ කාර්යය රජය විසින් භාර ගෙන තිබේ. මාර්ග, පාසැල්, වෛද්‍ය ගොඩනැගිලි තැනීම සහ ජල සම්පාදන යෝජනා ක්‍රම ආදිය මෙම වැඩ සටහනට ඇතුළත් වේ. මෙම යෝජනා ක්‍රමය යටතේ දැනට අවුරුදුපතා රුපියල් හැටහත් ලක්ෂයකට ආසන්න මුදලක වැඩ සටහන් භාර ගෙන ක්‍රියාත්මක කර ගෙන යන අතර, මේ කාර්යයන් භාරව කටයුතු කරන ඉංජිනේරුවන් මුහුණ දී තිබෙන ප්‍රධාන ප්‍රශ්නය යන්ත්‍රෝපකරණ හිඟකමය. පසුගිය කාලය තුළදී වැඩ කට යුතු හෙමින් කිරීමට ප්‍රධාන හේතුව යන්ත්‍රෝපකරණ හිඟකම බව ඇත්දැකීමෙන් ස්ථිර ලෙස පෙනී ගොස් තිබේ. මෙම ප්‍රමාදය මගහරවා භාරගෙන ඇති වැඩ සටහනෙහි ශීඝ්‍ර ප්‍රගතියක් ලබා ගැනීමටත්, ඉදිරියට එන වර්ෂවලදීද වඩාත් පුළුල් වැඩ සටහන් භාර ගෙන ක්‍රියාත්මක කිරීමටත් තිබෙන එකම මාර්ගය අප්‍රමාදව යන්ත්‍රෝපකරණ ලබා ගැනීම වේ.

තැනීම සඳහා දැනට භාරගෙන ඇති පාරවල් බොහොමයක්ම පිහිටා තිබෙන්නේ, යාමට අපහසු දුෂ්කර පිටිසරබද ප්‍රදේශවලය. විශාල වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා දැනට තිබෙන යන්ත්‍රෝපකරණ ඉතා අබලන් හා පැරණි ඒවා නිසා, ඒවා නිතර නිතර අළුත්වැඩියා කිරීමට සිදු වේ. විශේෂයෙන් මාර්ග තැනීමේ වැඩ කටයුතු අඩපණවී ඇත්තේ ගල් තැලීම සඳහා පාවිච්චි කරනු ලබන "රෝඩ් රෝලර්ස්" හිඟකම නිසාය. මේ නිසා, මාස කිහිපයකට පෙර පස් වැඩ අවසන් කර ඇති මාර්ග කිහිපයක ගල්, වැලි හා තාර දැමීමේ වැඩ කටයුතු අවසන් කිරීමට නොහැකිව තිබේ. දැනට අවශ්‍ය වී තිබෙන යන්ත්‍රෝපකරණ ලැයිස්තුවත් මම කියවන්නම්: පාර තළන රෝලර්ස් හතරයි, ට්‍රැක්ටර් දහයයි, ටිපිං ලොරි නවයයි, රොක් ඩ්‍රිලර් දහයයි, ඩ්‍රිල් රොඩ් එකසිය පණහයි, ඉමර්ෂන් වයිබ්‍රේටර් දෙකයි, වෙල්ඩිං ට්‍රාන්ස්ෆෝමර් එකයි, ජීප් රථ පහයි, මොබයිල් එයාර් කොම්ප්‍රෙසර් තුනයි, මෙටල් ක්‍රෂර් තුනයි.

මම මේ යෝජනාව ඉදිරිපත් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල :

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

අ. භා. 6.33

**එච්. එම්. නවරත්න මයා.**

*(திரு. எச். எம். நவரத்ன)*

(Mr. H. M. Nawaratna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උඩ රට ගැමි පුනරුත්ථාපන දෙපාර්ත මේන්තුවට අවශ්‍ය යන්ත්‍රෝපකරණ ගැනීම සඳහා රුපියල් ලක්ෂ දහයක වැය ශීර්ෂයක් ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මේ අවස්ථාවේ ඒ යෝජනාව ගැන වචන සවල්පයක් කථා කරන්නට මටත් ඉඩක් ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. ඇත්ත වශයෙන්ම උඩරට ගැමි පුනරුත් ථාපන දෙපාර්තමේන්තුවට අවශ්‍ය උප කරණ දැනට නැති නිසා නොයෙක් අන්දමේ අඩුපාඩුකම් පෙනෙන්නට තිබෙන බව මා දන්න කාරණයක්. උඩ රට ප්‍රදේශයේ එක් පාරක් සෑදීමට එක් රෝලක් පාවිච්චි කරන විට වෙනත් රෝලක් නැති නිසා තවත් පාරක වැඩ නවත්වන්නට සිදු වූ අවස්ථා ගැන අපට කියන්නට පුළුවනි. රෝල ලැබෙන තුරු පාරේ වැඩ නවත්වන්නට සිදු වීම කන ගාටුදායකයි. එවැනි කනගාටුදායක තත්ත් වයක් උදා වෙලා තිබෙනවා. මෙම ප්‍රශ් නය බල පාන උඩරට ප්‍රදේශයේ එක්තරා සීමාවක මන්ත්‍රීවරයකු හැටියට මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. ඇත්ත වශ යෙන්ම උඩරට ප්‍රදේශයේ කරන්නට තිබෙන වැඩ ප්‍රමාණය ගැන කල්පනා කර බලන විට, ඒ සඳහා වෙන් කර තිබෙන මේ මුදල මදි නිසා ගරු ඇමතිතුමා වෙනම වැය ශීර්ෂයක් ඉදිරිපත් කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු ආචාර්ය දහනායක**

*(கௌரவ கலாநிதி தகநாயக்க)*

(The Hon. Dr. Dahanayake)

ඒක තියෙනවා. ඉදිරිපත් කරන්නට යනවා.

**නවරත්න මයා.**

*(திரு. நவரத்ன)*

(Mr. Nawaratna)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමාට. මුදල් නැතිකම නිසා දැනට උඩරට ප්‍රදේශ යේ ඇතැම් ස්ථානවල වැඩ අත්හිටුවා තිබෙනවා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

මොකක්ද ඉදිරිපත් කරන්න යන්නෙ ?

**ගරු ආචාර්ය දහනායක**

*(கௌரவ கலாநிதி தகநாயக்க)*

(The Hon. Dr. Dahanayake)

මේ වැඩ කටයුතුවලට තවත් මුදල් ඕනෑ කරන නිසා සති කීපයකින් තවත් මෙබඳු යෝජනාවක් ඉදිරිපත් කරනවා ඇති.

**නවරත්න මයා.**

*(திரு. நவரத்ன)*

(Mr. Nawaratna)

ඒ ගැන අප සන්තෝෂ වෙනවා. ඒ වාගේම එය ඉක්මනින් ඉදිරිපත් කරනවා ඇතැයි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උඩරට ප්‍රදේශවල පාරවල් තැනීම, පාසැල් ගොඩ නැගිලි තැනීම, ආරෝග්‍ය ශාලා තැනීම ආදී කටයුතු සඳහා මුදල් ලබාගැනීමට සිදු වී ඇත්තේ උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවෙන්. එබඳු කාර්යයන්ට අවශ්‍ය මුදල් ලබා දීමට ක්‍රියා කිරීම ගැන සන්තෝෂ වන අතර වැඩි කල් නොගොස් ගරු ඇමතිතුමා ඉදිරිපත් කිරීමට අදහස් කරන වැය සම්මතය ඉදිරිපත් කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

ගරු ඇමතිතුමා මගේ ප්‍රදේශයට ගිහින් තිබෙන නිසා දන්නවා ඇති, එය ඉතාමත් ම දුෂ්කර ප්‍රදේශයක් බව. ජලය ඇතත් මහ ජනතාවගේ ප්‍රයෝජනය පිණිස එය නියම අන්දමට යොදා ගැනීමට මේ වන තෙක් නොහැකි වී තිබෙනවා. මන්ද ? ජලනල යෝජනා ක්‍රමයක් මෙතෙක් කල් ක්‍රියාත් මක කිරීමට පියවර ගෙන නැති නිසයි. කෙසේ වෙතත්, උඩරට ගැමි පුනරුත්ථා පනය සඳහා මුදල් වෙන් කිරීම මෙන්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විරුද්ධ පක්ෂයේ ආසනවලටද සේවයක් කළ හැකි පරිදි උඩරට ගැමි පුනරුත්ථාපනය සඳහා විශාල මුදලක් වෙන් කිරීම ගැන එතුමාට ස්තුතිවන්ත වන අතරම, ඉදිරිපත් කිරීමට අදහස් කරන අනික් වැය සම්මතයද නොපමාව ඉදිරිපත් කිරීමට ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන සවල්පය අවසන් කරනවා.

අ. භා. 6.37

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උඩරට ගැමි පුනරුත්ථාපනය සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව ගැන මට පෙර කථා කළ මීනිපේ ගරු මන්ත්‍රීතුමා, එම ප්‍රදේශයේ කළ යුතු වැඩ සම්බන්ධයෙන් පැහැදිලි විස්තරයක් කළා. අපේ ප්‍රදේශවල පාරවල් තැනීම ආදී කටයුතු කරන්නෙ එක්කෝ පළාත් පාලන ආයතනවලින්, නැති නම් රජයෙන්. නමුත් මෙම දෙකින්ම කෙරෙන වාට වඩා වැඩි වැඩ කොටසක් ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව මගින් උඩරට ප්‍රදේශවල කරනවා. එසේ විශාල වැඩ කොටසක් කිරීම ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. අපි ඒ ගැන සන්තෝෂ වෙනවා. නමුත් අපේ ප්‍රදේශවල වැඩ කටයුතු බොහෝ විට කෙරෙන්නේ පළාත් පාලන ආයතනවලින් පමණයි. දිස්ත්‍රික් සම්බන්ධතා කොමිටියේදී නොයෙකුත් යෝජනා ඉදිරිපත් කරනවා. යම්කිසි පාරක් සකස් කර දෙන ලෙස ඉල්ලා සිටියොත් ඊට දෙන පිළිතුර තළන රෝලක් නොමැති නිසා සකස් කර දෙන්න බැරි බවයි. එම නිසා රජයේ වැඩ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, අඩු වශයෙන් එක් මැතිවරණ කොට්ඨාශයට එක බැගින්වත් තළනයන් —නැති නම් පාර තළන රෝල—සපයා දෙන්නටය කියා. ඇත්ත වශයෙන්ම අපේ ප්‍රදේශවල ජීවත්වන ජනතාවට කාගේ පිහිටද? පළාත් පාලන ආයතනවලින් සෑහෙන පිහිටක් නැහැ. මහ ආණ්ඩුවෙන් ඒ ප්‍රදේශවලට වැඩක් කෙරෙන්නෙ නැහැ. පාරවල් හැදීම සම්බන්ධයෙන් රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙන් සේවයක් ඒ ප්‍රදේශවලට සිදු වන්නේ නැහැ. නමුත් උඩරට ප්‍රදේශවලට ගැමි පුනරුත්ථාපන දෙපාතර්මේන්තුව පිහිට වෙනවා. ගරු ඇමතිතුමා අද එක් වැය සම්මතයක් ඉදිරිපත් කර තිබෙනවා; තවත් වැය සම්මතයක් ළඟදීම ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

ලක්ෂ හතලිහක වැය සම්මතයක් ඉදිරිපත් කරනවා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

සුමාන දෙකකට පෙර ලක්ෂ දහයක් ලබා ගෙන තිබෙනවා.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

අපේ ප්‍රදේශවල ජීවත්වන ජනතාවත් මේ රටේම පුරවැසියන් නොවේද? අපේ ප්‍රදේශවලටත් පාරවල් අවශ්‍ය නැද්ද? ළිං අවශ්‍ය නැද්ද? රුපියල් ලක්ෂ දහයක් හෝ ලක්ෂ හතලිහක් අනුමත කර ගැනීම ගැන අපේ අකමැත්තක් නැහැ. නමුත් ගරු ඇමතිතුමා යටතේ තිබෙන ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ මාර්ගයෙන් වත් අපේ ප්‍රදේශවල ඇති අඩුපාඩුකම් සපුරා ලීමට ගරු ඇමතිතුමා මුදල් ටිකක් වෙන් කළොත් එය අපේ ප්‍රදේශයේ ජීවත්වන අහිංසක ජනතාවට කරන විශාල සේවයක් ලෙස පෙන්නා දෙන්න කැමතියි.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

උඩරට ප්‍රදේශවල විරුද්ධ පක්ෂයේ ආසනවලටත් උදව් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

අප ඒ ගැන විරුද්ධ නැහැ. අපේ ප්‍රදේශවල ඇති අඩුපාඩුකම් නැති කිරීමටත් ඇමතිතුමා ක්‍රියා කරනවා නම් හොඳ බවයි කියන්නෙ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ගිරුවාපත්තුවේ ජීවත්වන ජනතාව කොයි තරම් දුෂ්කරතාවන් මැදද ජීවිතය ගෙන යන්නෙ? ඒ උදවියට මාර්ග පහසුකම් නැහැ, ජලය නැහැ, ළිං නැහැ, ජලනල පහසුකම් නැහැ. නමුත් අපට පිහිට වෙන්න කවුරුත් නැහැ. ප්‍රදේශයේ තිබෙන පළාත් පාලන ආයතන මගිනුත් කිසිම දෙයක් කරන්න බැහැ, මුදල් තත්ත්වය හොඳ නැති නිසා. ඒ නිසා, අපට ගැමි කොමිෂන් සභාවක් නැති බැවින් ග්‍රාම සංවර්ධන සමිති මාර්ගයෙන්වත් යම්කිසි වැඩ ටිකක් කර දෙන්න. නමුන්නාන්සේගෙ අමාත්‍යාංශය යටතේ තිබෙන උඩරට ගැමි කොමිෂන් සභාව මාර්ගයෙන් උඩරට ප්‍රදේශයට යම් සේවයක් සිදු කරන්නා වාගේම අපේ ප්‍රදේශයටත් මාතර, ගාල්ල ආදී ප්‍රදේශවලටත් මුදල් ටිකක් ලබා දෙන්න කටයුතු කරන්න.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

ගැමි කොමිෂන් සභාවක් පිහිටුවා ගන්න.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

අපි ටිකක් වැඩියෙන් ඉල්ලන විට මුදල් ඇමතිතුමාට බොහොම රිදෙන බවක් පෙනෙනවා. අපේ මහජනතාව අපෙන් ප්‍රශ්න කරනවා. උඩරට ප්‍රදේශයට ගැමි කොමිෂන් සභාව මාර්ගයෙන් වැඩ කෙරෙනවා නම් අපේ ප්‍රදේශවලටත් ගැමි කොමිෂන් සභාවක් ලබා දෙන්න බැරිද කියා මහජනතාව අපෙන් ප්‍රශ්න කරනවා. අපේ පළාත් ඒ තරම් දියුණු තත්ත්වයකට පත්වෙලාද? නැහැ. උඩරට ප්‍රදේශවල වගේම කඳුකර පළාත්, ඒ වගේම නොදියුණු පළාත්, අපේ ප්‍රදේශවල කොතෙකුත් තිබෙනවා. අපේ පළාත්වල මිනිසුන් මොන තරම් අමාරුකම් මධ්‍යයේද ජීවත් වෙන්නේ කියා නමුන්නාන්සේ සිතා බලන්න. ගමනාගමනය අතින් මොන තරම් අපහසුකම් තිබෙනවාද? වෙල් උඩින්, හෙල් පල්ලම් උඩින් පැන පැනයි ගමන් කිරීමට සිදු වී තිබෙන්නේ.

**ජේ. පී. ඔබයසේකර මිය.** (මීරිගම)
*(திருமதி ஜே. பீ. ஒபயசேக்கர—மீரிகம)*
(Mrs. J. P. Obeyesekere—Mirigama)

ඒ පළාතේ කොහෙද කඳු තිබෙන්නෙ?

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

මීරිගම මන්ත්‍රීතුමිය හිතනවා ඇති, මීරිගම ආසනය වගේ කියා අපේ ආසනයත්. බොහොම අමාරුකම් මධ්‍යයේයි අපේ ජනතාවත් ජීවත් වෙන්නෙ. ඒ නිසා අපේ වැඩ කර ගැනීමටත් අපේ මේ අවශ්‍යතාවයන් පිරිමසා ගැනීමටත් මුදල් ටිකක් ලබා දෙන්න. මා එය මුළු පහත රට ජනතාව වෙනුවෙන්ම ඉල්ලා සිටිනවා. ගැමි කොමිෂන් සභාවක් මගින් හෝ නැත්නම් ඕනෑම කොමිෂන් සභාවක් මගින් අපේ ප්‍රශ්න විසඳා ගැනීමට අවස්ථාව ලබා දෙන්නය කියා මා ඉල්ලා සිටිනවා.

අ. භා. 6.42

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මටත් මේ ගැන වචනයක් දෙකක් කියන්නට තිබෙනවා. උඩරට ගැමි කොමිෂන් සභාවට මුදල් වෙන් කිරීම ගැන අපි කොහෙත්ම විරුද්ධ වන්නේ නැහැ. නමුත් අනික් පළාත් ගැනත්, සබරගමු පළාත—

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

සබරගමු පළාත බාගෙට උඩරටට අයිතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල :

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)

ඇයි බාගෙට අයිතියි කියන්නේ, සම්පූර්ණයෙන්ම අයිතියි. සබරගමු පළාත සම්පූර්ණයෙන්ම උඩරටට අයිති හැටියටයි සලකන්නෙ. නමුත් මේ උඩරට ගැමි කොමිෂන් සභාව පමණක් සබරගමු පළාත ගැන බාගෙට සලකන බවයි පෙනෙන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට තිබෙනවා ලොකු අදෝනාවක්. ඒ පළාතේ පාසැල් ගොඩනැගිලි සඳහා මේ අවුරුද්දට එක සතයක්වත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ලැබී නැහැ. මොන හේතුවක් නිසාද මා දන්නේ නැහැ. සියවස උත්සව තිබුණාට අපට කමක් නැහැ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

සියවස ලොතරැයියක් හදනවා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)

ඔන්න එතුමා කියන හැටි. සියවස ලොතරැයියෙන් දරුවන්ට ඉගෙන ගන්න පුළුවන්ද ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ග්‍රාම සංවර්ධන සමිති මාර්ගයෙන් හෝ මොන ක්‍රමයෙන් හෝ අපට තවමත් මුදල් ලැබී නැහැ. කෑගල්ල කච්චේරියට නම් ලැබී නැහැ. නොයෙකුත් ගම්වල ශ්‍රමදාන ව්‍යාපාර මගින් පාරවල් දියුණු කර තිබෙනවා. නමුත් බෝක්කු සාදන්න ක්‍රමයක් නැති නිසා වැඩ නතර වී තිබෙනවා. ඒ නිසා ඒ සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණයවත් සපයා දෙන්න. ග්‍රාම සංවර්ධන සමිති මාර්ගයෙන් හෝ ප්‍රමාණවත් මුදලක් ඒ ඒ ප්‍රදේශවලට ලබා දුන්නොත් එය විශාල ප්‍රයෝජනයක් වෙන්න පුළුවනි. මේ

උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව

උඩරට ගැමි කොමිෂන් සභාවට මුදල් වෙන් කිරීම ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැති බව තමුන්නාන්සේට පැහැදිලි කර දෙන්න ඕනෑ. නමුත් අපේ පළාත් ගැනත් ටිකක් සිත යොමු කරවන්නය කියා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට මා ප්‍රතිපත්ති ප්‍රශ්නයක් ගැනත් වචනයක් කිව යුතුව තිබෙනවා. ඇමතිතුමාගේ වැය ශීර්ෂය පිළිබඳව මෙහි තිබෙන සිංහල අනුවාදයට වඩා ඉංග්‍රීසි අනුවාදය විස්තර සහිතව තිබෙනවා. මා එය අතරින් පතර කියවන්න සූදානම් වෙනවා.

"2 Nos. Petrol operated immersion vibrators (the poker type) mounted on sturdy frames, equipped with flexible couplings."

අපට පෙනෙන හැටියට රුපියල් දශ ලක්ෂයක මුදලක් වැය කරල සෑහෙන ප්‍රමාණයක බරපතළ යන්ත්‍ර පාවිච්චි කරන්නටයි බලාපොරොත්තු වෙන්නෙ. මෙතැන තිබෙන ප්‍රතිපත්ති ප්‍රශ්නය මේකයි. මේ යන්ත්‍ර පාවිච්චි කරන්නට ගියොත් මේවා අළුත්වැඩියා කරන්නට වැඩපොළකුත් ඒ අසලම පිහිටුවන්නට සිද්ධ වෙයි. රජයේ කර්මාන්තශාලාව වගේ කර්මාන්තශාලාවක් පිහිටුවන්නට සිද්ධ වෙයි.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

මේව රජයේ වැඩ දෙපාර්තමේන්තුවට භාර දෙනවා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)

අන්න ඒ කාරණා නමයි, මම දැන ගන්නට සතුටු. මම අහන්නෙ ප්‍රතිපත්තිය මොකක්ද කියලයි. මේ විශාල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල :

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

යන්ත්‍ර ගෙන්වල ඒවා නඩත්තු කරන්නට යන්නෙ කවුද ? ඒවාට තෙල් ආදිය දමන නියම තත්ත්වයෙන් තබා ගන්නට ක්‍රියා කරන්නේ කවුද ? රජයේ කම්මාන්තශාලාව තිබෙන්නේ උඩරට ගැමි කොමිසන් සභා ප්‍රදේශයේ සිට සමහරවිට හැතැප්ම 100 ක් පමණ ඈත වෙන්නට පුළුවනි. ඒ අසල කර්මාන්තශාලාවක් නැත්නම් සිදු වෙන්නෙ මොකක්ද ? මාසයක් දෙකක් යන කොට මේ යන්ත්‍ර අබලන් වුණා කියා පැත්තකට දමා නිකම් ඉදියි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයිති ට්‍රැක්ටර් ආදිය සෑහෙන ප්‍රමාණයක් දැනට ඒ විධියට අයින් කරල නාස්ති වෙන්නට ඉඩ හැර තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

වාරිමාර්ග දෙපාර්තමේන්තුව ?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තිබෙන්නේ පුදුම තත්ත්වයක්. දැනට කන්තලේ සීනි කර්මාන්තශාලාවේ ඉන්ජිනේරු තැන වශයෙන් කටයුතු කරන, කලින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉන්ජිනේරු තැන වශයෙන් සිටි මහත්මයා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේදී පාවිච්චි කරන්නට බැරිය කියා කොන් කර දැමූ යන්ත්‍ර, ඔහුම දැන් අළුත්වැඩියා කරන්නට පුළුවන්ය කියා සීනි කම්මාන්තශාලාවට ගෙන්වාගෙන තිබෙනවා. ඒ වගේම ඒවා අළුත්වැඩියා කිරීමටය කියා සීනි කම්මාන්තශාලාව මාර්ග යෙන් රුපියල් ලක්ෂ ගණනක අමතර කොටස් ගෙන්වාගෙන තිබෙනවා. ඇයි, ඔහු වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සිටිද්දී මේවා හදන්නට බැරි වුණේ ? දැන් සීනි උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව කම්මාන්තශාලාවට ආවට පසු ඒවා ගෙන්වා ගෙන හදන්නට පටන් අරගෙන තිබෙනවා. [බාධාකිරීමක්] ප්‍රොක්ටර් මහත්මයා. මොකක්ද මේ අමුතු තත්ත්වය ?

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

හදන ක්‍රමය පස්සෙ ඉගෙන ගන්න ඇති.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

හදන ක්‍රමය පස්සෙ ඉගෙන ගත්තෙ සීනි කම්හලේ සීනි කැවායින් පසුවද ? සීනි කෑවාම තමයි, පුරුදු වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ විධියේ තත්ත්ව යන් ඇති නොවන්නට, විශාල යන්ත්‍ර ගෙන්වනවා නම් ඒවා නඩත්තු කිරීමට සුදුසු වැඩ පිළිවෙලක් යොදන්න, ගරු ඇමතිතුමනි. නැත්නම් ඒවා නිකම් නාස්ති වී යන්නට පුළුවන්. මේ සම්බන්ධ යෙන් සැලකිලිමත්ව ක්‍රියා කරන ලෙස තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටින්නේ ඒ නිසයි.

මට පෙනෙන හැටියට දැන් සෑහෙන යන්ත්‍ර ප්‍රමාණයක් මෙරටට ගෙන්වනවා; පාවිච්චි වෙනවා. එහෙම නම් ඒවා පාවිච්චි කරන පළාත් අසලම ඒවා අළුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානත් ඇති කරන්න. එසේ නැත්නම් මාස හතරක්-පහක් පාවිච්චි කර සුළු දෝෂයක් නිසා අයින් කර දමා අපේ ප්‍රොක්ටර් මහත්මයා වගේ පස්සෙ සල්ලි ඉල්ලයි, ඒවා අළුත්වැඩියා කරන්නට අමතර කොටස් ගෙන්වන්න. ඒ ඉන්ජිනේරු මහත්මයා කන්තලේ ගියාට පසු අමතර කොටස් ගෙන්වීමෙදි කොමිස් ලබා ගත්තා. සිදු වෙලා තිබෙන්නෙ ඒකයි. ඒක තමයි, රහස. ඔය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල:

විධියේ තත්ත්වයන් ඇති වීමට ඉඩ නො තබා මේ වගේ වැදගත් වැඩක් කරන විට මීට වඩා දුරදිග බලා වැඩ කරන ලෙසයි ඉල්ලා සිටින්නට සිදු වෙලා තිබෙන්නේ.

අ. භා. 6.48

**කේ. බී. රත්නායක මයා.** (අනුරාධපුර)
*(திரு. கே. பி. ரத்னாயக்க—அனுராதபுரம்)*
(Mr. K. B. Ratnayake—Anuradhapura)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවේ මේ වැය ශීර්ෂය යටතේ මමත් ඇමතිතුමා ගෙන් ඉල්ලීමක් කරන්නට බලාපො රොත්තු වෙනවා. මේ කොමිෂන් සභා වෙන් රජරටට දැනට සේවයක් සිදු නොවු ණත් මේ කොමිෂන් සභාව මගින් නුවර ප්‍රදේශයේ සිදු වීගෙන යන වැඩ කටයුතු ගැන අප අසා තිබෙනවා. ඒ වගේම ගරු මන්ත්‍රීවරුන්ගේ ප්‍රකාශවලිනුත් අපට අව බෝධ වෙනවා, විශේෂයෙන්ම ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා යටතේ තිබෙන දෙපාර්තමේන්තුවලින් ඒ ඒ ප්‍රදේශවල මහජනතාවට ප්‍රයෝජනවත් වන ඉතා වැද ගත් වැඩ රාශියක් සිදු වන බව. ඒ සම් බන්ධයෙන් ගරු ඇමතිතුමාට ප්‍රශංසා කරන අතරම මම ඇමතිතුමාගෙන් එක ඉල්ලීමක් කරන්නට බලාපොරොත්තු වෙනවා. ගරු ඇමතිතුමා එතුමා භාරයේ තිබෙන දෙපාර්තමේන්තුවල සංවිධාන ආදිය අළුත් කර ඒවාට නව ජීවයක් දී වැඩ කටයුතු කරගෙන යන බව අපි පිළිගන් නවා. ගරු ඇමතිතුමා යටතේ තිබෙන කච්චේරිවලටත් ඒක කරන්නට බැරි ඇයි? කච්චේරි ගැන කථා කළොත් තමුන්නාන් සේ අප්‍රසාදයට ලක් වෙනවා. විශේෂ යෙන් ප්‍රාදේශීය පාලන අංශයෙහි අඩුපාඩු රාශියක් තිබෙනවා. ඒ අංශය ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වන්නට ඕනෑ. අනුරාධපුර කච්චේරිය ගැන මා කීප වතාවක්ම සඳහන් කර ඇති. ඇත්තෙන්ම

උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව

එහි විශාල අඩුපාඩුකම් තිබෙනවා. නියම විධියට කටයුතු කරගෙන යන්නට දක්ෂ නිලධාරි පිරිසක් එහි නැහැ. මේ ගැන දිසා පතිතුමා තමුන්නාන්සේට කීප වතාවක්ම කියා ඇති. ආදායම් පාලක නිලධාරීන් ගැන කල්පනා කරන කොටත් තත්ත්වය ඒ තරම් සතුටුදායක නැහැ. 1964 දී ආදා යම් නිලධාරි කොට්ඨාශ 9 ක ආදායම් පාලක නිලධාරීන් වශයෙන් සිටියේ පරිපාලන සේවයේ නිලධාරීන් වුවත් අද ඒ ගණන 4 ට බැහැලා. අනෙක් අය තාවකාලික වශ යෙන් වැඩ බලන උදවියයි.

ගරු ඇමතිතුමා ග්‍රාම සංවර්ධනයටත් නව ජීවනයක් දෙන්නට ඕනෑ. ඒ දෙපාර්ත මේන්තුවේ වැය ශීර්ෂයත් මේ අන්දමට වැඩි කරනවා නම් ඒ දෙපාර්තමේන්තු වෙන් වැඩිපුර ආධාර ලබා ගන්නට පුළුවන් වෙයි.

අවුරුදු පතාම ගරු ඇමතිතුමාට මතක් කරන කාරණයක් ඊළඟට මතක් කරන් නට කැමතියි. උතුරු මැද පළාත උඩරට ප්‍රදේශයක් හැටියට සැලකෙනවා. රජ රට උඩරට සිංහලයන් සිටින ප්‍රදේශයක් හැටි යටයි, රජ රට උදවිය කල්පනා කරන්නේ. උඩරට ගැමි පුනරුත්ථාපන යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු ඒ රජ රට ප්‍රදේශය ටත් දීර්ඝ කරන හැටියට වර්ෂයක් වර්ෂ යක් පාසා අප ඉල්ලනවා. එහෙත් මෙතෙක් ඒ ඉල්ලීම ඉෂ්ට වී නැහැ. ඕනෑම දෙයක් හිතන අන්දමට කරන්නට ශක්තියක් ඇති ගරු ඇමතිතුමා මේ අව සාන අවුරුද්දේවත් ඒ ඉල්ලීම ඉෂ්ට කර නැයි අප බලාපොරොත්තු වෙනවා. වයඹ පළාතටත්, උතුරු මැද පළාතටත් උඩරට ගැමි පුනරුත්ථාපන යෝජනා ක්‍රමයේ වැඩ කටයුතු දීර්ඝ කළ යුතු බවට ගරු මුදල් ඇමතිතුමාත් එකඟ වෙනවා ඇතැයි මා හිතනවා. එසේ කිරීමෙන් කාටවත් හානියක් සිදු වන්නේ නැහැ. ඒ නිසා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල:

[රත්නායක මයා.]
ලබන වර්ෂයේ අයවැය ලේඛනය සාදන විට විශේෂයෙන්ම උතුරු මැද පළාත—රජ් රට—ගැමි පුනරුත්ථාපන අංශයෙන් වැඩ කටයුතු කෙරෙන ප්‍රදේශයක් හැටියට පෙන්නුම් කිරීමට වග බලා ගන්නවා ඇතැයි බලාපොරොත්තු වෙමිනුත්, එසේ කරන ලෙස ඉල්ලා සිටිමිනුත් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 6.53

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මාර්ගයෙන් ගම්බදව කෙරෙන වැඩ කටයුතු සඳහා 76 වන ශීර්ෂයේ 11 වන උප ශීර්ෂය යටතේ රුපියල් ලක්ෂ 16 ක් වෙන් කර ඇති බව ගරු මන්ත්‍රීවරුන්ට පෙන්වා දෙන්නට කැමතියි. ඒ රුපියල් ලක්ෂ 16 දිස්ත්‍රික්ක 22 අතර බෙදා හරින විට සාමාන්‍යයෙන් එක් දිස්ත්‍රික්කයකට ලැබෙන්නේ රුපියල් 70,000 යි. එක් දිස්ත්‍රික්කයක ආසන පහක් නැත්නම් හයක් තිබෙනවා. එත කොට එක ආසනයකට රුපියල් 15,000 කට වඩා වියදම් කරන්නට බැරි තත්ත්වයක් තිබෙන බව පේනවා ඇති.

1954 හරියේදී තිබුණු කොමිසන් සභාවක නිර්දේශ අනුව ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව පිහිටුවා තිබෙනවා. ඒ කොමිසන් සභාව වාර්තා කර තිබෙන්නේ මධ්‍යම පළාත හා ඌව පළාත ගැන පමණයි. මේ හැර සබරගමුව පළාත ඊට ඇතුළත් කරන්නැයි මා යෝජනා කර තිබෙනවා. එහෙත් ප්‍රතිපත්තියක් වශයෙන් ඒ යෝජනාව පිළිගෙන නැහැ.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

කවුද?

උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

සබරගමු පළාත ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව යටතට ගන්නැයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව පවතිද්දී ලොකු උද්ඝෝෂණයක් තිබුණා. එවකට සිටි අගමැතිනියගේ ගම පිහිටා තිබෙන්නේ සබරගමුවෙයි. එහෙත් සබරගමු පළාත ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු කෙරෙන ප්‍රදේශයක් හැටියට එකතු කෙළේ නැහැ. ඒ වාගේම, යම්කිසි ප්‍රතිපත්තියක් අනුව මගේ යෝජනාව මේ රජය ප්‍රතික්ෂේප කළා. උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව යෝජනා කළේ ප්‍රදේශ දෙකක් ගැන පමණයි. එම නිසා, එම වාර්තාවෙන් පෙන්නා දී ඇති කරුණු අනුව ඒ ප්‍රදේශ දෙකේ පමණක් වැඩ කටයුතු කරගෙන යනවා. තවත් ප්‍රදේශ ඊට ඇදිය යුතු යයි යම් විධියකින් පාර්ලිමේන්තුවේ යෝජනාවක් අනුමත වුණොත් ඒ අනුව කටයුතු කරන්නට මාත් කැමතියි. එහෙත් දැනට මට වැඩ කරන්නට පුළුවන්කම තිබෙන්නේ, අර ප්‍රදේශ දෙක සම්බන්ධයෙන් පමණයි.

මේ වැඩ කටයුතු කරන්නේ කොහොමදැයි යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) ප්‍රශ්න කළා. ඒ සියලු වැඩ කටයුතු රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙන් කරගෙන යනවා. දැනටමත්, යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා සඳහා මධ්‍යස්ථාන කීපයක් තිබෙනවා. උඩරට ගැමි පුනරුත්ථාපන කටයුතු සම්බන්ධයෙන් රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙන් කෙරෙන වැඩ ගැන ප්‍රශංසා කරන්නට මා කැමැතියි. අඩුපාඩු කීපයක් තිබෙන බව ඇත්ත. ඒ අඩුපාඩු මගහරවා ගැනීම සඳහා තමයි, මා කලින් සඳහන් කළ වැය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ශීඝ්‍රය ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ කොහොම වුණත්, රජයේ වැඩ දෙපාර්තමේන්තුව ඉතාමත් හොඳට මේ වැඩ කට යුතු කරගෙන යන බව සහතික කරන්න මට පුළුවන්.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## පරිපූරක මුදල: අධිකරණ අමාත්‍යාංශයට ස්ටේෂන් වැගන් රථයක්

*குறைநிரப்புத் தொகை : நீதி அமைச்சுக்கு 'ஸ்ரேசன் வாகன்' வாகனம்*

## Supplementary Supply : Station Wagon for the Ministry of Justice

අ. භා. 6.58

**ගරු වන්නිනායක**

*(கௌரவ வன்னிநாயக்க)*

(The Hon. Wanninayake)

I move,

"That a supplementary sum not exceeding Rupees Ten (Rs. 10) (Token Vote) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum may be expended as specified in the Schedule hereto :

*Schedule*

| | |
|---|---|
| Head 105—Minister of Justice | Rs. |
| Vote No. 3—Administrative Charges —Capital Expenditure .. | 10 |
| | (Token Vote) " |

This is a Token Vote of Rs. 10 to purchase a station wagon for the Ministry of Justice. They were given two cars from the Government Stores, but both were found to be unsatisfactory. They have now an allo-



cation of foreign exchange to purchase a station wagon. They have savings to the extent of Rs. 11,556, and they want to purchase a station wagon for their work.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

What are you going to do with a station wagon ?

**එම්. එච්. එම්. නයිනා මරික්කාර් මයා. (අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(ஜனாப் எம். எச். எம். நயினா மரிக்கார்—நீதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. M. H. M. Naina Marikkar—Parliamentary Secretary to the Minister of Justice)

According to the explanation of the proposal, a car was given to the Ministry of Justice from the Government Stores. Actually, a sum of Rs. 15,000 was provided under Head 105 Vote 3 for the purchase of a car. As the car that was given by the Government Stores was found to be uneconomical, it was returned and another used car was obtained. This too was found to be uneconomical and unsatisfactory and returned to the Government Stores.

The Ministry of Planning has since granted to this Ministry a foreign exchange allocation to import an Austin A 60 station wagon under U. K./Ceylon Loan No. 2. As the local agents have intimated that Austin A 60 is no longer in production, they intend to purchase a Hillman Minx station wagon costing Rs. 11,565.50. The foreign exchange commitment is Rs. 10,090.50. Savings to the extent of Rs. 11,556 are available under Vote 1. In order to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[නයිනා මරික්කාර් මයා.]

meet the cost of the purchase of this station wagon it is necessary to obtain a Token provision in a sum of Rs. 10.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

The other day I saw in the papers the Government Stores advertising the sale of some diplomatic cars. Some of them are quite new cars.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

Some people who bought those cars have later come and returned them.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

You are passing on white elephants to other people !

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## කල් තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

යෝජනාව ඉදිරිපත් කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී :

"මන්ත්‍රි මණ්ඩලය දැන් කල් තැබිය යුතුය".—[ගරු වන්නිනායක].

"சபை இப்பொழுது ஒத்திவைக்கப் பெறுமாக" [கௌரவ வன்னிநாயக்க] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப்பெற்றது.

*Motion made, and Question proposed.*
"That the House do now adjourn".—[*The Hon. Wanninayake.*]



**ජේ. පී. ඔබේසේකර මිය.**
*(திருமதி ஜே. பீ. ஒபயசேக்கர)*
(Mrs. J. P. Obeyesekere)

I have a question to ask from the Hon. Minister of Industries. There is a director attached to the Veyangoda National Textile Corporation, by the name of Mr. Somaratne. I should like to know whether the Hon. Minister or the Chairman of the Corporation has given any specific instructions to this Mr. Somaratne to recruit workers to the textile mill. If no specific instructions have been given, why is this Mr. Somaratne requesting people from the Mirigama Electorate to take letters of recommendation or certificates from the Member of Parliament, that is myself, to be given to him, so that he may give them employment ?

I should also like to know from the Hon. Minister whether there is a definite policy governing the recruitment of workers to this textile mill. If so, may I know what the policy is, and, if not, why there is no such policy.

Is the Hon. Minister aware, or, has he heard rumours floating around that certain highly placed officials in the National Textile Corporation are supposed to be receiving and accepting gratifications for employing people at the mill ?

I would also add—I do not know whether the Hon. Minister is aware—that this Mr. Somaratne used a corporation vehicle for political work and this was damaged and repaired in a private workshop. I wonder whether the Hon. Minister is aware

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම

of this ; if he is not, I think he could get this information from the Mirigama Police Station.

අ. භා. 7.2

**කේ. බී. රත්නායක මයා.**
*(திரு. கே. பி. ரத்னாயக்க)*
(Mr. K. B. Ratnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ප්‍රශ්න දෙකක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා. එයින් එකක් ඉතා වැදගත් ප්‍රශ්නයක්. ගරු අගමැතිතුමා මේ අවස්ථාවේ සභාවේ සිටීම ගැන මා සතුටු වෙනවා; ගරු ඉඩම් ඇමතිතුමා මෙහි නැති වීම ගැන කණගාටු වෙනවා. එතුමාට විශේෂයෙන් මතක් කරන්නට තිබෙන්නේ රජරට දැනට පවතින ඉතාම භයානක නියඟය පිළිබඳවයි. ඒ ප්‍රදේශයේ මේ මාස් කන්නයේ ගොවිතැන ඉතාමත් දුර්වල තත්ත්වයකයි, තියෙන්නේ. ඒ ප්‍රදේශයේ ගොවීන් සියළු දෙනාම පාහේ මේ වර මාස් කන්නයේදී ඉතාමත් උනන්දුවෙන් ගොවිතැන් කළ බව ඇත්තයි. වර්ෂාව බලාපොරොත්තුවෙන් ඒ අය වැඩ කළා. එහෙත් අවාසනාවකට මෙන් බලාපොරොත්තු වූ හැටියට වර්ෂාව නොලැබුණු නිසා ගම් රාශියකම ගොවිතැන් පාලු වෙලා ගම්මුන්ට කරදරවලට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. මේ අමාරුව පවතින්නේ කරුණු දෙකක් නිසයි. වර්ෂාව බලාපොරොත්තුවෙන් වැඩ කළ ගොවීන්ගේ ගොවිතැන් වර්ෂාව නැති නිසා පාලුවීම පමණක් නොවෙයි සිදුවුනේ. මේ ගොවීන්ට මාස් කන්නයේ ගොවිතැන් කිරීමට රජයෙන් ණය ලැබුනෙත් නැහැ. එයට හේතුව පසුගිය මාස් කන්නයේ ලබා ගත් ණය ගෙවා ගන්නට බැරි වීම නිසා ඒ අයගේ කූපන් ටික කපා ගැනීමයි. කූපන් නැති නිසා මේ වර මාස් කන්නයට ණය ලැබුනෙ නැහැ. ඒ කෙසේ වෙතත් රජයේ නිලධාරීන්ගේ ඉල්ලීම් උඩ සෑම දෙනාම වාගේ තමන්ගෙ වැව් යටතේ කුඹුරු වැඩ කළා. වර්ෂාව නැති නිසා කුඹුරු පාලු වුනා. මගේ ආසනයේ එසේ විනාශ වී තිබෙන කුඹුරු මගේ ඇස් දෙකෙන් දැක්කා. මාස එකහමාරක් තුළ මගේ ආසනයේ පරණ ගම් 110 කට පමණ මා ගියා. ඒ ගම් 110න් 10ක් හැරුණු විට ඉතිරි ගම් සියයේම පාහේ බලාපොරොත්තු වූ අස්වැන්නෙන් දහයෙන් පංගුවක්වත් ලබා ගන්නට බැහැ. කැකුළට වැඩ කළා. වර්ෂාව ලැබුනෙ නැහැ. වැවේ වතුර ඒය යන බලාපොරොත්තුවෙන් මඩට ඉස්සා. නමුත් වතුර ලැබුනෙ නැහැ. ඒ නිසා ඒ අය සඳහා සහනාධාර ක්‍රමයක් ඇති කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ ප්‍රශ්නය ගැන දිස්ත්‍රික් සම්බන්ධතා කොමිටියේදී සාකච්ඡා කරන විට දිසාපතිතුමත් ඒ ගැන එකඟ වුනා. මගේ ඉල්ලීම නම් පුළුවන් තරම් ඉක්මනින් ඒ සහනය සලසන ලෙසයි.

ඊළඟට මා මේ විශේෂ කාරණය ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වුනේ ඉඩම් ඇමතිතුමාටයි. එතුමාට භාර දෙන්නය කියා සන්දේශයකුත් මහා විලච්චියේ ජනපද වාසීන්ගෙන් මට ලැබුනා, 19 වැනිදා මා විලච්චියට ගිය විට. විලච්චියේ තත්ත්වය ඉතාමත්ම භයානකයි. මහා විලච්චියේ වම් ඉවුර, දකුණු ඉවුර කියා ඉවුරු දෙකක් තියෙනවා. වම් ඉවුරේ අයට නම් දැනට අමාරුවක් නැහැ. දකුණු ඉවුරේ ගොවීන් වර්ෂාව බලාපොරොත්තුවෙන් අක්කර 1,600ක් වැඩ කළා. නමුත් වර්ෂාව ලැබුනෙ නැහැ. පසුගිය කන්නයේදී ණය ගෙව්වේ නැත කියා කූපන් කපා ගත්ත නිසා මාස් කන්නයට ණය ලැබුනෙත් නැහැ. කෙසේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්නායක මයා.]

වෙතත් ඔවුන් මාස් කන්නයට වැඩ කරන්න ඕනෑය කියා වැඩ කළා. සුමාන දෙකක් තිස්සේ වාරිමාර්ග දෙපාර්ත මේන්තුවේ පොම්ප 6කින් වැවේ තිබෙන ජලය ඉහළට පොම්ප කරනවා. ඇල, වැව් දෙකකුත් පුරවාගෙන හැතැප්ම 7ක් යන්නට තියෙනවා. මට වැටහුණු හැටියට නම් ඒ අක්කර 1,600 බේරා ගන්නට කොහෙත්ම පුළුවන්කමක් නැහැ. ඒ නිසා මා රජයෙන්—විශේෂයෙන්ම ඉඩම් ඇමතිතුමාගෙන්—ඉල්ලා සිටින්නෙ මේකයි. මීට කලිනුත් ඔය වගේ තත්ත්වයක් ඇති වුනාම ඒ ගොවින්ට වන්දි මුදලක් දුන්නා. ඒ අනුව මේ අවස්ථාවේ දීත් ඒ ගොවීන්ට සහනයක් සලසන ලෙස මා ඉල්ලා සිටිනවා.

මේ තත්ත්වය මේ අන්දමින් තියෙද්දී තවත් භයානක ප්‍රශ්නයක් පැනනැගී තියෙනවා. ඉඩම් කොමසාරිස් දෙපාර්ත මේන්තුවෙන් ඒ අයට තර්ජනය කර නවා, බදු මුදල් නොගෙව්වොත් ඒ අය ඉඩම්වලින් දොරට දමනවාය කියා. ඒ නිසා ගරු ඉඩම් ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටින්නේ බදු මුදල් අය කර ගැනීම වහාම නවත්වන ලෙසයි. බදු මුදල් නොගෙවූ නිසා ඉඩමෙන් දොට්ට දැමීමට වැඩ පිළිවෙළක් සකස් කරනවාය කියා ගොවීන් විසිදෙනකුට පමණ දැනට මත් නොතීසි යවා තිබෙන බව මා දන් නවා. ඒ නිසා කරුණාකර ඒ නියෝග ඉල්ලා අස් කර ගන්නා හැටියට මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. විලච් චිය දකුණු ඉවුරේ තත්ත්වයත් මා සඳ හන් කළ අන්දමින් තිබෙන නිසා පුළු වන් තරම් ඉක්මණින් ඒ අයට සහන යක් සැලසීමට කටයුතු පිළියෙළ කරන හැටියට මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි කරුණ මෙයයි: මෙය නගන්නට මා බලාපොරොත්තුව සිටියේ නැහැ. එහෙත් ගරු සෞඛ්‍ය ඇමතිතුමා මෙහි සිටින නිසා එය ඉදිරිපත් කිරීමට මා අද හස් කරනවා. ගරු සෞඛ්‍ය ඇමතිතුමා අනුරාධපුරයට පැමිණ විශාල උනන්දුව කින් මැලේරියා මර්දන ව්‍යාපාරය එතුමා ගේ අතින්ම ආරම්භ කළා. එය හොඳින් ක්‍රියාත්මක වී තිබෙනවා. එහි "වෝකිං යුනිට්" 22 ක් තිබෙනවා. ඒවා යේ දවස් පඩි ලබන තාවකාලික සේවක යිනුත් සිටිනවා. මීට කලිනුත් ඒ අයගේ පඩි ගෙවීම සම්බන්ධව මැලේරියා මර් දන ව්‍යාපාරයේ අධිකාරීට කථා කර ඔවුන්ට සහනය සලසා දීමට මට සිදු වුණා. සාමාන්‍යයෙන් මාසයේ පඩිය ඊට පසු මාසයේ 10 වැනිදාට ගෙවීමේ සිරි තක් කලින් පැවතුණා. එහෙත් මාස දෙක තුනක සිට ඊළඟ මාසයේ 25 වැනිද වත් පඩිය ලැබෙන්නේ නැති තත්ත්ව යක් ඇති වුණා. එවැනි අවස්ථා තුනකදී කොළඹ තිබෙන මැලේරියා මර්දන දෙපාර්තමේන්තුවට කථා කර ඒ පිළිබඳව ක්‍රියා කරන්නට සිදුවුණා. විශේෂයෙන්ම ලබන මාසයේ සිංහල අලුත් අවුරුදු උත් සවය තිබෙන නිසා එවැනි තත්ත්වයක් ඇති වුණොත් විශාල කරදරයක් වෙනවා. මා එන තුරුත් පෙබරවාරි මාසයේ පඩිය ලැබී තිබුණේ නැහැ. දැන් ගෙවලාද කියා මා දන්නේ නැහැ. ඒ නිසා ඒ ඒ මාසවල පඩිය අඩු වශයෙන් ඊළඟ මාසයේ 10 වැනිදාවත් ගෙවන්නට වගබලා ගන්නා හැටියට මා ඉල්ලා සිටිනවා.

අ. භා. 7.8

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.** (ගම්පහ)

*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹ)*

(Mr. S. D. Bandaranayake—Gampaha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අගමැතිතුමාගෙන් ඇසීමට කල් දී තිබෙන ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීමට මා බලා පොරොත්තු වෙනවා.

විප්ලවකාරී ආකල්පයකින් යුතුව ඉදිරි යට යන විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් මර්දනය කිරීමේ අභිලාෂයෙන් 1969 පෙබරවාරි 4 වැනි දින මහනුවර පැවැත්වූ උත්සවයට සහභාගිවීම සඳහා පේරාදෙනිය විශ්ව විද්‍යාල භූමියෙහි ලැගුම් ගැනීමට යැවූ හමු දාව ලවා පේරාදෙනිය විශ්ව විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අමානුෂික අන්දමින් පහර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම

දුන්නේ ඔවුන්ගේ සටන්කාමිත්වයට පාඩමක් ඉගැන්වීම සඳහා රජය කල්තියා සිතාමතාම සංවිධානය කළ කුමන්ත්‍රණයක් අනුව බැව් සැබෑද ?

ගම්බද දේශප්‍රේමී තරුණයන් රුපියල් හැටට හැත්තෑවට —සුළු වේතනයකට— යුද හමුදාවට සහ පොලිස් හමුදාවට බඳවා ගෙන එම හමුදාවල් රටේ පවතින අර්ධ යටත් විජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අධිරාජ්‍ය වාදීන්ගේ සහ ඔවුන්ගේ ගැත්තන් වූ මේ රටේ ප්‍රතිගාමී ධනපති පංක්තියේ මුර බල්ලන් මෙන් යොදවමින් මෙවැනි ම්ලේච්ඡ වැඩ පිළිවෙළක් රජය මගින් සකස් කළේ මේ රටේ නැගී ගෙන එන විප්ලවකාරී බලය මර්දනය කිරීම සඳහා එම හමුදාවන්ට ආභාෂයක් දීමට බැව් සැබෑද ?

නුදුරු අනාගතයේදී සහ අනාගතයේදී පහළොස් දහසක් රක්ෂා විරහිත උපාධිධාරීන් සහ විසි ලක්ෂයක් ජ්‍යෙෂ්ඨ විභාගය සහ වෙනත් විභාග සමත් තරුණ තරුණියන් රක්ෂා ඉල්ලා අරගල කරන විටත් පිළිතුරු දීමට බලාපොරොත්තු වන්නේ මේ ආකාරයෙන්ද ?

මෙරට ශිෂ්‍ය පරම්පරාවට අපහාස වන පරිදි විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් සහ හමුදාව අතර වූ අරගලය පිළිබඳව අගමැතිතුමා පෙබරවාරි මස 5 වැනි දින පාර්ලිමේන්තුවේදී කරන ලද ඒ වැරදි ප්‍රකාශනය ඉල්ලා අස් කර ගන්නවාද ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු කම්කරු ඇමතිතුමා වෙත ඉදිරිපත් කිරීමටත් ප්‍රශ්නයක් තිබෙනවා.

ලංකා කම්කරු සමිති සම්මේලනයේ නියෝජිතයින් විසින් නොයෙකුත් වෘත්තීන්වල පඩි වැඩි කිරීම සඳහා පඩි පාලක සභාව වෙත ගෙනෙන ලද යෝජනා ගැන සාකච්ඡා කිරීමට පඩි පාලක සභාවල විශේෂ රැස්වීමක් සඳහා පඩි පාලක සභාවේ සාමාජිකයින් දෙදෙනකු විසින් කැඳවීමක් කර ඇති නමුත් ඉහත සඳහන් යෝජනා මාස කීපයක් තිස්සේ සාකච්ඡා නොකළ බැව් ගරු ඇමතිතුමා දන්නවාද ?

මෙම ප්‍රමාදයන්ට හේතුව පඩි පාලක සභා රැස්වීම්වල න්‍යාය පත්‍රය තමන් විසින් අනුමත කළයුතු යයි කියා ගරු ඇමතිතුමා විසින් මෑතකදී කරන ලද නියෝගයක්ය යනු සත්‍යයක්ද ?

නොයෙකුත් පඩි පාලක සභාවල වැඩවලට රාජකාරි ලෙස මැදිහත් වීමට බලයක් තමාට නොමැති බව ගරු ඇමතිතුමා දන්නවාද ? පඩි පාලක සභාවක් විසින් ගනු ලබන තීරණයන්ට පක්ෂ හෝ විපක්ෂ වීමට ගරු ඇමතිතුමාට බලය ඇත්තේ පළමුව මෙම තීරණ පඩි පාලක සභා විසින් ගනු ලැබීමෙන් පසුව සහ එම විරුද්ධත්වය ඔහුට ප්‍රකාශ කළ හැක්කේ ඔහුගේ අනුමැති අත්සන යෙදීමෙන් හෝ නොයෙදීමෙන් බව ගරු ඇමතිතුමා දන්නවාද ?

කම්කරුවන්ගේ අයිතිවාසිකම්වලට හානි වන පරිදි තමන්ගේ බලය වරදවා යෙදවීමෙන් වැළකීමට ගරු කම්කරු ඇමතිතුමා මේ සභාවට පොරොන්දු වෙනවාද ?

ඊළඟට ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිතුමාගෙන් ඇසිය යුතු ප්‍රශ්නයක් තිබෙනවා. සිංහල හා දමිළ ස්වදේශීය චිත්‍රපටි කර්මාන්තයේ දියුණුවට සහ ස්වදේශීය චිත්‍රපටි ආරක්ෂක මණ්ඩලයට රජය මගින් දෙනු ලැබූ ආධාර මොනවාද ? ඒ ප්‍රශ්නයට ගරු ඇමතිතුමාගෙන් පැහැදිලි පිළිතුරක් අපේක්ෂා කරනවා.

අ. භා. 7.13

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

I want to appeal to the Hon. Minister of Home Affairs on the subject of the allocation of quotas of beedi leaves. My information is that there are at least thirty non-nationals who have received a total allocation of quotas of beedi leaves of 1.5 million pounds of the 6 million allotted each year.

I believe this is the only industry where non-nationals have received quotas. If I remember aright the Hon. Minister, when I raised this question in 1966, said that he would demolish the monopoly of the beedi *mudalalis* by reducing their quotas stage by stage within a period of five years so that the *mudalalis* would receive a maximum of only 40,000 pounds. That is my recollection. I presume the Hon. Minister

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

remembers that statement. But I find that does not happen.

Mr. S. Abdul Cader has been given a quota of 471,428 pounds, and Mr. M. D. Abdul Gaffoor has been given a quota of 228,571 pounds. And they are also exporters from India.

None of these non-nationals pay even the Employees' Provident Fund money in respect of their employees, and a good numbr of these people draw quotas without even having a workshop and without a single employee.

Mr. M. D. Abdul Gaffoor has as his manager Mr. P. K. Ahamed who is here on a temporary residence permit which has been issued on the recommendation of the Director of Rural Development. In point of fact I hold a letter dated 2nd November, 1966 sent by Mr. Jayasinghe, the Controller of Immigration and Emigration, asking the Director of Rural Development why Mr. Ahamed's visa should not be discontinued, and at the same time pointing out that on his own statement Mr. P. K. Ahamed is an Indian national employed as manager in the establishment of M. D. Abdul Gaffoor dealing in the business of importing beedi and manufacturing beedi. All the other partners in the business are Indian nationals. I ask why we should continue this.

I should like to appeal to the Hon. Minister to consider seriously the question of cutting the quotas allocated to these now-nationals, at least a substantial reduction of their quotas with a view to ending their quotas so that these could be passed on to the nationals of this country.

There are six beedi *mudalalis.* They are, Elephant Beedi Company, Kalhi Beedi Company, J. A. Ariyaratnam, S. Abdul Cader, M. D. Abdul Gaffoor and Kanagalingam Pillai. The last named receives a beedi quota of more than 2 million pounds.

The people I mentioned do not even have a work-place——

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

How ?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

——but they still get their quotas. The Hon. Minister might consider changing some of these officers who are in charge of quota allocations because I believe they are in league with some of these non-national beedi *mudalalis.*

Then again, in the Ceylon Beedi Manufacturers' Association, where there are thousands of small quota holders, there was a defalcation of about a million rupees, and the person who is accused of having utilized the money of this association is Mr. Neethirajah. This unhappy situation should be remedied by the Hon. Minister. He is a capable of doing this and I do wish the Hon. Minister will utilize his energy to good purpose in getting all these non-nationals out of the beedi industry.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

නැගී සිටියේය.

எழுந்தார்—

*rose—*

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

I am sorry the hon. Member for Habaraduwa has not given his name in time.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය ගැන ඊයේ සිටම කල් දී තිබෙනවා. ඊයේ ගරු ඇමතිතුමා සිටියේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

I am sorry. The hon. Member's name is not in the list given to me.

අ. භා. 7.16

**ආර්. ජී. සේනානායක මයා.** (දඹදෙණිය)
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க—தம்பதெனிய)*
(Mr. R. G. Senanayake—Dambadeniya)

වරාය සංයුක්ත මණ්ඩලය සම්බන්ධව ප්‍රශ්නයක් ඇසීමට තිබෙනවා. ගරු ඇමතිතුමා නැහැ. එහෙත් කල් දී තිබෙන නිසා මේ අවස්ථාවේදී ප්‍රශ්නය ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

වරාය සංයුක්ත මණ්ඩලය මගින් රුවල් බෝට්ටු බඩු අදින්නන්ට එක්තරා අතිරේක බද්දක්—හොණ්ඩරයකට ශත දහයක් බැගින්—පැනවූවා. සංයුක්ත මණ්ඩලයෙන් කරන සේවාවන්වලටයි ඒ බද්ද දැම්මෙ. නමුත් 1967 සිට 1968 වන තෙක්ම මේ බද්ද ගෙවන්නට නොහැකිය යන ප්‍රශ්නය උඩ ලියුම් ගනුදෙනු කරගෙන ගියා. ඊටපසු දැන් මාස හතරකට පමණ ප්‍රථමයෙන් ගරු ඇමතිතුමාම මේ ප්‍රශ්නය විසඳිය යුතුය කියා ඉදිරිපත් වී ඒ බද්ද ගෙවිය යුතුය කියා තීරණය කළා. ඒ තීරණය ගත්තාට පසුවත් බද්ද නොගෙවා සිටි නිසා ඒ බෝට්ටුවලින් බඩු බෑම තහනම් කර මෙපමණ කාලයක් තුළ වරාය සංයුක්ත මණ්ඩලයෙන් කරන ලද සේවාවන් සියල්ලම නැවැත්වූවා. ඒ අවස්ථාවේදී රුවල් බෝට්ටු හිමියන්ගේ ඒජන්තවරුන් ඇඩ්වාන්ස් මුදල් බැඳ නැවත වරක් වැඩ පටන් ගත්තා. එහෙම කරගෙන යන කොට ඒ බද්ද ගෙවීම ලංකාවට ඉන්දියාවෙන් බඩු ගෙන්වන ඉන්දියානුවන්ගෙන් යුත් සංගමයට පැවරුවා. රුවල් බෝට්ටු නියෝජිතයින් ගෙවිය යුතු බද්ද ලංකාවට ඉන්දියාවෙන් ආහාර බඩු තොග ගෙන්වන්නන්ට පැවරුවා. ඒ බඩු තොග ගෙන්වන්නන්ගේ සංගමයට විශාල බලයක් තිබෙනවා. ඒ සංගමයේ සාමාජිකයින් සියළු දෙනාම වාගේ ඉන්දියානුකාරයිනුයි. ඒ අවස්ථාවේදී ඔවුන් කෙලින්ම ගිහින් ඇමතිවරුන්ට කථා කර තිබෙනවා. ඊටපසු බද්ද ගෙවිය යුතු නැත, හිඟ මුදල් අය කර ගන්නටත් එපාය, ගෙවූ යම් මුදලක් තිබෙනවා නම් ඒ මුදලත් ආපසු දෙන්නය කියා වහාම නියෝගයක් පිට කර තිබෙනවා. ගෙවන ලද බද්දත් ආපසු දෙන්නට කියනවා. තුන් ලක්ෂ ගණනක හිඟ මුදලක් අය විය යුතුව තිබෙනවා. ඒ සංගමයෙ වැඩිපුරම ඉන්නේ ඉන්දියානුකාරයින් බව මා දැන් මොහොතකට කලින් සඳහන් කළා. ඒ සංගමයේ මිසියර් කියන ඉන්දියානු නියෝජිතයා බොහොම බලවත් කෙනෙක්. ඔහු යම් පියවරක් ගත්තොත් ඕනෑම ඇමතිවරයකුගේ තීරණයක් වෙනස් කරන්නට පුළුවන්ය කියා හැඟීමක් තිබෙනවා. මේ අවස්ථාවේදී මා අසන ප්‍රශ්නය නම් ඇමතිතුමාම ගත් තීරණය වෙනස් කිරීමට හේතුව කුමක්ද යන්නයි. තීරණය වෙනස් කළා පමණක් නොවෙයි හිඟ මුදලුත් නොගෙවා ගෙවූ මුදලක් තිබෙනවා නම් ඒ මුදලත් ආපසු දිය යුතුය කියා නියෝගයක් පිට කර තිබෙනවා. එවැනි නියෝගයක් පිට කිරීමට හේතුව කුමක්ද කියා මා ප්‍රශ්න කරනවා. ගරු ඇමතිතුමාවත් එතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාවත් මේ අවස්ථාවේදී නැහැ. මේවාට උත්තර නැති නිසා වෙන්නට ඇති නොඑන්නෙ. මේ ප්‍රශ්නයට පසු අවස්ථාවක පිළිතුරු ලැබේවිය කියා මා බලාපොරොත්තු වෙනවා.

අ. භා. 7.20

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති)**
*(கௌரவ டட்ளி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும்)*
(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs and Minister of Planning & Economic Affairs)

The hon. Member for Gampaha read a long statement about the incidents at the university campus. I wish to say this. It will be noted that, while as many as 31 members of the Army had received injuries of various types—three persons sustained very serious injuries—the Police report indicated that the number of persons who were not

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩඩ්ලි සේනානායක]

soldiers who had received any kind of injury is six only. The details are here with me. The Police are investigating the various complaints made by persons to them, and if adequate evidence is available for cases to be filed against persons, whether in the Armed Services or belonging to the student body, such action will be taken.

At the present time a committee appointed by the board of regents of the university is conducting further inquiries into the matter. This committee has not finalized its report. The Army authorities have been instructed to give this committee whatever assistance it requires to enable it to assess the true situation.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

What about the matter raised by the hon. Member for Anuradhapura ?

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

That is really a matter for the Hon. Minister of Land.

රත්නායක මයා.
(திரு. ரத்நாயக்க)
(Mr. Ratnayake)

I had given notice of the question, and I am sorry that the Hon. Minister is not here.

අ. භා. 7.22

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන
(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)
(The Hon. D. P. R. Gunawardena)

The hon. Member for Mirigama asked a series of questions about the National Textile Corporation. There is a director in the National Textile Corporation by the name of Mr. Somaratne. No instructions have been issued to Mr. Somaratne to recruit workers to the Veyangoda mill. Instructions have been issued to the chairman of the corporation to recruit 80 worker trainees because there are 80 vacancies for worker trainees. There is a set policy governing the recruitment of workers to the Veyangoda Textile Mill. As a matter of fact, we recruit only from Attanagalla and neighbouring electorates—from Chilaw to Kelaniya. At present the instructions are that the eighty vacancies for worker trainees at Veyangoda Mills are to be filled in the following manner: Ja-ela 5, Chilaw 5, Nattandiya 5, Attanagalla 10, Divulapitiya 6, Minuwangoda 5, Dompe 4, Ruwanwella 7, Yatiyantota 5, Wattala 4, Kelaniya 4, Mahara 2, Negombo 8 and Katana 10.

ගරු මන්ත්‍රිවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

Mirigama ?

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන
(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)
(The Hon. D. P. R. Gunawardena)

They must be having a pretty large number from Mirigama. That must be the reason. I shall look into the matter. If there are not enough workers from Mirigama working in the mill already steps will be taken to recruit a few from Mirigama.

As a matter of fact, I have not heard that highly placed officials in the corporation are accepting gratifications for employing people at the Veyangoda mill. If there is any precise information the hon. Member can give, I am prepared to inquire into the matter.

අ. භා. 7.24

ගරු ආචාර්ය දහනායක
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)

I am very glad that the hon. Member for Yatiyantota has raised the question of non-Ceylonese who are beedi permit holders. An impression is created that this Government is responsible for taking in these non-nationals as beedi permit holders. That is far from the truth.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

I did not say that.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

There are 31 beedi permit holders. I have got their names here with me. There is no time for me to read out the names. Every one of the 31 non-nationals who are beedi permit holders was admitted into the list and was given big quotas by the S. L. F. P. Government in 1964. Yes, every one of them. Not a single non-national was added to the list by this Government. I repeat it, Sir—not a single non-national was added to the list of beedi permit holders by this Government which came into being in March 1965.

Then, Sir, I took the liberty of cutting down their quotas by 20 per cent, but I was not able to cut their quotas further because of something that has happened during the S. L. F. P. days —the Sirima-Shastri Pact. I am informed that I cannot withdraw these permits unless there is some sound, valid ground for doing so. If it is proved to me that any one of these 31 is a bogus permit holder, if it is shown to me that any one of these 31 does not have a true factory and does not have workers under him, I can cancel his permit. But, I cannot cancel his permit on the mere ground that he is a non-national because there are workers under him. As a matter of fact, I have taken the precaution of finding out whether these people pay the turnover tax. Investigations are proceeding. If they are not paying the turnover tax, I can take action against them, but not otherwise. On the mere ground that a person is a non-national I cannot cancel his permit. That is the correct position.

As a matter of fact, when the hon. Member for Yatiyantota wished to raise this question earlier I gathered details on this subject and I sent him a letter dated 8th March 1969, in which I gave him the full list of the 31 permit holders with the quantity of beedi wrapper leaf that each one obtained.

Now, Sir, a question was raised in regard to the internal working of some of these beedi manufacturing companies. We have nothing to do with their internal troubles. What ever is relevant will be taken note of and I shall only be too glad to cancel any permit holder's quota if certain lapses are proved against such person.

ඈ. භා. 7.27

**ගරු ඊ. එල්. සේනානායක**
*(கௌரவ ஈ. எல். சேனநாயக்க)*
(The Hon. E. L. Senanayake)

I shall certainly look into the matter that has been raised. There has been a certain amount of delay because some of these people recruited for anti-malaria work are scattered all over the Island. I can assure the hon. Member for Anuradhapura that from next month there will be no delay. There has been a certain amount of delay because these employees are scattered all over the Island. I shall do my best with regard to the matter.

**එස්. ද එස්. ජයසිංහ මයා.**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*
(Mr. S. de S. Jayasinghe)

ලංකා වෘත්තීය සමිති සම්මේලනය එහි නියෝජිතයන් ගේ මාර්ගයෙන් තේ පිට රට පැටවීම රබර් පිටරට පැටවීම ඉංජිනේරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ද එස්. ජයසිංහ මයා.]

කර්මාන්තය සහ මත්පැන් කර්මාන්තය ආදී කර්මාන්තවලට පඩි වැඩි කිරීමක් ඉල්ලා ඇති බව සත්‍යයක්.

පඩි පාලක සභාවල—Wages Boards—වැඩ ලේඛනය ඇමතිතුමාගේ දැනගැනීම පිණිස එවනවා මිස එය අනුමැතිය පිණිස එවනවා නොවෙයි.

තෙවන ප්‍රශ්නය ගැන කියන්නට තිබෙන්නේ ඇමතිතුමාට කිසිම බලතලයක් නැති බවයි. අප එය පිළිගන්නවා.

සිව්වැන්න පැනනගින්නේ නැහැ. ඒකට ඇඟිලි ගැසීමක් නොවන නිසා.

කල් තැබීම

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப் பட்டது.*

*Question put, and agreed to.*

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 7.28 ට, අද දින සභා සම්මතිය අනුව, 1969 මාර්තු 23 වන ඉරිදා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.**

*அதன்படி பி. ப. 7.28 க்கு சபை இன்றைய அதனது தீர்மானத்திற்கிணங்க 1969 மார்ச் 23, ஞாயிற்றுக்கிழமை மு. ப. 10 மணிவரை ஒத்திவைக்கப் பெற்றது.*

*Adjourned accordingly at 7.28 P.M. until 10 A.M. on Sunday, 23rd March 1969, pursuant to the Resolution of the House this Day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. (අශෝධිත පිටපත් සඳහා නම් රු.35.00යි.) මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியையடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00) 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி 30 சதம், தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org